අවස්ථාවන් උදෙසා දොරටු විවෘත කිරීම...

වාර්ෂික වාර්තාව 2021



සීමාසහිත ගුවන් තොටුපල හා
ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

අන්තර්ගතය

3 දැක්ම සහ මෙහෙවර
6 මූල්‍ය සුවිශේෂිතා
7 කාර්යසාධන සුවිශේෂිතා
8 ආයතනික ව්‍යුහය
9 වසර 2021 සැකෙවින්
10 සභාපතිතුමාගේ පණිවුඩය
14 නායකත්ව කණ්ඩායම
19 ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම
24 සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව
30 විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව
34 කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය
46 තිරසාර කළමනාකරණය
50 මූල්‍ය සමාලෝචනය
56 මානව ප්‍රාග්ධනය කළමනාකරණය
64 අවදානම් කළමනාකරණය
71 ආයතනික පාලනය

මූල්‍ය ප්‍රකාශන
81 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව
86 විස්තීරණ ආදායම් ප්‍රකාශය
87 මූල්‍ය තත්ත්වය ප්‍රකාශය
88 හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
89 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
90 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
118 අප හා සබැඳි ගුවන් සමාගම් සහ ගුවන් යානා ගොඩබැස්විය හැකි විවිධ ස්ථාන (පිටුපස කවරය ඇතුල් පැත්ත)



...ගෝලීය විභවයන් කරා

ලොව පුරා වසංගත තත්ත්වය පැතිරෙමින් පැවති අවස්ථාවක් වූ සමාලෝචිත වර්ෂය තුළ, මගින් සුරක්ෂිතව සහ ඵලදායී ලෙස ලොව සමඟ සම්බන්ධ කිරීමේ ආකාර සෙවීමේ දී ගුවන් සේවා ක්ෂේත්‍රය දැඩි බාධකයන්ට මුහුණ දුන්නේය. දේශසීමා හි ආරක්ෂාව තහවුරු කරමින් ගුවන් ගමන් වැඩිකිරීම සඳහා පහසුකම් සැලසීම වූ අපගේ කාර්යභාරයේ දී, ආරක්ෂිත ක්‍රියාමාර්ග සහ මාර්ගෝපදේශ අනුගමනය කිරීමට සිදු විය. එමඟින් රටේ සුන්දරත්වය අත්විඳීමට පැමිණි සංචාරක පිරිස ආරක්ෂා වූවා පමණක් නොව, ගුවන්තොටුපොළේ ක්‍රියාකාරිත්වය බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළ සේවක පිරිස ද ආරක්ෂා විය. සංචාරක කර්මාන්තය ක්‍රමානුකූලව නැවත විවෘත කිරීමත් සමඟ ඊට අනන්‍ය වූ අභියෝග මතු වූ අතර, ඒවාට මුහුණ දෙමින් සංචාරක කේන්ද්‍රයක් ලෙස තරඟකාරීව සිටීමින්, ගෝලීය විභවතාවයන් සඳහා වූ අවස්ථා කවුළුව විවෘත කිරීමට හැකිවූයේ, අප සතු නවෝත්පාදනයන්ට අනුවර්තනය වීමට සහ අනුගමනය කිරීමට ඇති හැකියාව මෙන්ම මගීන් ඇද බැඳ තබා ගැනීමට සමත් නව අත්දැකීම් නිර්මාණය කිරීමේ අඛණ්ඩ හැකියාව නිසාවෙන් බැව් අපි තරයේ විශ්වාස කරමු.





දැක්ම

"තිරසාර ආර්ථිකයක් සඳහා ගෝලීය සම්බන්ධතාවයේ මිත්‍රශීලී ගුවන් සේවා හවුල්කරු වීම"

මෙහෙවර

"ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ තෘප්තිය තහවුරු කිරීම සඳහා තරඟකාරී, ආරක්ෂිත ගුවන් සේවා සහ නවීන තාක්ෂණයෙන් හා වඩා හොඳ පරිවයන්ගෙන් සමන්විත වූ විශිෂ්ඨ වූ ආගන්තුක අත්දැකීම් ලබා දීම"

සංචාරකයින් සඳහා සුදුසු ලෝකයක් විවෘත කිරීම





මූල්‍ය සුවිශේෂතා

	2021 රු. මිලියන	2020 රු. මිලියන	2021/2020 +/- %	2019 රු. මිලියන	2020/2019 +/- %
ලාභ සහ අලාභ					
පිරිවැටුම	**7,879**	8,011	-2%	25,693	-69%
ක්ෂය වීම් වලට පෙර මෙහෙයුම් වියදම්	**9,006**	9,768	-8%	10,649	-8%
පොලී, බදු සහ ක්ෂය කිරීම් වලට පෙර ඉපැයුම්	**(1,176)**	(1,805)	35%	15,012	-100%
ස්ථාවර වත්කම් ක්ෂය වීම	**2,648**	2,854	-7%	2,841	0%
ශුද්ධ මූල්‍ය පිරිවැය / (ආදායම)	**(2,815)**	(878)	+100%	(3,018)	-71%
බදු පෙර ලාභය (අලාභය)	**(961)**	(3,733)	74%	15,222	-100%
ආදායම් බදු	**1,123**	(1,228)	-100%	4,226	-100%
බදු පසු ලාභය	**(2,084)**	(2,504)	17%	10,996	-100%
හිමිකම් කොටස්හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය / (අලාභය)	**(2,084)**	(2,504)	17%	10,996	-100%
මුදල් ප්‍රවාහ					
ලාභාංශ	**-**	-	-	500	-100%
දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමාන දෑ	**413**	826	-50%	2,480	-67%
වර්ෂය සඳහා මුළු ප්‍රාග්ධන වියදම	**22,960**	2,169	+100%	4,068	-47%
මූල්‍ය තත්වය					
දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන්ගේ අරමුදල	**41,314**	36,983	12%	39,231	-6%
දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් වල මුළු ධාරණ වටිනාකම	**79,414**	55,571	43%	55,300	0.5%
දෙසැම්බර් 31 දිනට මුළු ජංගම වත්කම්	**47,430**	47,645	0%	52,975	-10%
දෙසැම්බර් 31 දිනට මුළු ජංගම වගකීම්	**7,927**	6,202	28%	7,323	-15%

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමඟ අනුකූල වීම සඳහා කලින් වර්ෂයේ සංඛ්‍යා අවශ්‍ය තැන්වල දී යලි සකසා ඇත. -100% හෝ +100%, 100% ට වැඩි විචලනයන් දක්වයි.

සියලුම සංඛ්‍යා වැටයීමේ වෙනස්කම් වලට යටත් වේ.

කාර්යසාධන සුවිශේෂතා

		2021	2020	2019	2018	2017
මෙහෙයුම් සුවිශේෂතා						
ජාත්‍යන්තර ගුවන්යානා සංචලන	ගණන	21,204	20,881	62,195	67,351	62,850
මගී සංචලන*	ගණන	1,505,479	2,375,056	9,958,688	10,884,028	9,957,502
භාණ්ඩ සංචලන**	මෙ.ටො.	241,506	150,075	259,089	279,559	274,044
පියාසර සංචලන	ගණන	9,339	16,370	45,674	43,804	39,413
දෙසැම්බර් 31 දිනට මුළු සේවක සංඛ්‍යාව	ගණන	3,985	4,098	4,182	3,836	3,908
අනුපාත සුවිශේෂතා						
හිමිකම් මත ප්‍රතිලාභ	%	(5)	(7)	28	19	37
බදු පෙර ලාභය/(අලාභය) මුළු ශුද්ධ ආදායමට	%	(12)	(47)	59	36	52
බදු පෙර ලාභය/(අලාභය) කොටස් හිමියන්ගේ අරමුදල් වලට	%	(2)	(10)	39	37	47
මුළු ආදායම මුළු වත්කම් වලට	වාර ගණන	0.06	0.08	0.24	0.29	0.24
සේවකයෙකු සඳහා වන මුළු වත්කම්	රු.000	31,830	25,187	25,891	26,286	22,267
සේවකයෙකු සඳහා මුළු කාර්ය මණ්ඩල පිරිවැය - වසරකට	රු.000	1,881	1,811	1,944	1,947	1,644
ගුවන් යානාවක් හැසිරවීමට මුළු පිරිවැය	රු.000	574	738	235	318	202
මගීයෙකුට ආදායම	රු.	5,234	3,373	2,580	2,640	2,085
මගී සංචලන සඳහා බදු පසු ලාභය	රු.	(1,384)	(1,054)	1,104	488	875
සේවකයකු සඳහා වන ගුවන් යානා සංචලන	ගණන	5	5	15	18	16
ගුවන් යානයකට මගීන්	ගණන	71	114	160	162	158
සේවකයෙකුට මගීන්	ගණන	378	580	2,381	2,837	2,548
තෝලන අනුපාතය	%	39	19	13	20	35
මුළු වත්කම් මත ප්‍රතිලාභ	%	(2)	(2)	10	5	10
ශුද්ධ ලාභ අනුපාතය	%	(26)	(31)	43	18	42
ප්‍රාග්ධන ඵලදායිතා දර්ශකය	වාර ගණන	0.00	0.10	0.25	0.29	0.24
කොටසක ඉපැයුම්	රු.	(10,417)	(12,522)	54,979	26,566	43,574
ජංගම අනුපාතය	වාර ගණන	5.98	7.68	7.23	3.49	2.78
මුළු ආදායමට මුළු වියදම	වාර ගණන	0.92	0.76	2.04	1.49	1.85

* මගී සංචලනයන් හි පැමිණීම, පිටත්වීම, මාරුවීම සහ මාර්ගස්ථ මගීන් ඇතුළත් වන අතර, අභ්‍යන්තර ගුවන් මගීන් ඇතුළත් නොවේ.
** ගුවන් භාණ්ඩ සංචලන වලට අපනයන, ආනයන සහ එක් යානයකින් වෙනත් යානයකට මාරුකිරීම් ඇතුළත් වන අතර, අභ්‍යන්තර භාණ්ඩ සහ ගුවන් ලිපි ඇතුළත් නොවේ.

ආයතනික ව්‍යුහය


අධ්‍යක්ෂ මණ්ඩලය
සභාපති /ප්‍රධාන විධායක නිලධාරී
උප සභාපති
යාන්ත්‍රික ඉංජිනේරු අංශය
සැපයුම් දාම කළමනාකරණ අංශය
මානව සම්පත් අංශය
සිවිල් ඉංජිනේරු (සැලසුම් හා නිර්මාණ) අංශය
සිවිල් ඉංජිනේරු (නඩත්තු) අංශය
ගෘහ නිර්මාණ, භූමි අලංකරණ සහ අභ්‍යන්තර නිර්මාණ අංශය
ගිනි හා මුදවාගැනීමේ සේවා අංශය
විදුලි ඉංජිනේරු අංශය
ආරක්ෂක ඒකකය
තොරතුරු තාක්ෂණ අංශය
මූල්‍ය අංශය
අභ්‍යන්තර විගණන සහ තත්ව සහතික අංශය
ආරක්ෂක සේවා අංශය
වාණිජ සහ දේපළ අංශය
නීති අංශය
ගුවන්තොටුපළ කළමනාකරණ අංශය
සිවිල් ගුවන් සේවා පුහුණු අංශය
ඉලෙක්ට්‍රොනික් සහ ගුවන් සංතරණ ඉංජිනේරු අංශය
ගුවන් සංතරණ සේවා අංශය
ව්‍යාපෘති අංශය
උපායමාර්ගික කළමනාකරණ අංශය
අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන අංශය
ගුවන් භාණ්ඩ කළමනාකරණ අංශය
බුද්ධි සහ ආරක්ෂක මෙහෙයුම් අංශය

2021 වසර සැකෙවින්



1,505,479

ජාත්‍යන්තර මගී සංචලන



9,339

පියාසැර් සංචලන



21,204

ජාත්‍යන්තර ගුවන් යානා සංචලන



241,506 MT

ගුවන් භාණ්ඩ

LKR 7,386 Mn

පිරිවැටුම

LKR 2,083 Mn

බදු ගෙවීමෙන් පසු ශුද්ධ අලාභය

3,985

සේවකයන් ගණන

974

පුහුණු අවස්ථා සංඛ්‍යාව

සභාපතිතුමාගේ පණිවුඩය



"යෝග්‍යතමයාගේ පැවැත්ම" යන්න පසක් කරලමින්, අභියෝග මෙන්ම වර්ධනයන් ගණනාවක් සනිටුහන් කළ 2021 වසර සඳහා, සීමා සහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (ගු.ගු.සේ.ස.) හි වාර්ෂික වාර්තාව මම සතුටින් ඉදිරිපත් කරමි. කොවිඩ්-19 වසංගත තත්ත්වය පහව යාම සෙමෙන් සිදු වීමත්, ලොව පුරා එහි ප්‍රභේද ගණනාවක් දැකගත හැකි වීමත් හේතුවෙන් ගුවන් සේවා කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම මන්දගාමී වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ දී ගු.ගු.සේ.ස. විසින් පසුගිය වසරවලට සාපේක්ෂව අඩු ආදායමක් වාර්තා කරන ලදී.

2021 වසර සඳහා ගු.ගු.සේ. සමාගමේ ආදායම පසුගිය වසරේ රුපියල් බිලියන 7.51 ට සාපේක්ෂව 2% කින්, එනම් රුපියල් බිලියන 7.38 දක්වා පහළ වැටී ඇත. මෙය 2019 වසරේ කොවිඩ්-19 තත්ත්වයට පෙර ආදායම වූ, රුපියල් බිලියන 25.65 ට සාපේක්ෂව 71% ක අඩුවීමකි. බොහෝ රටවල් විසින් පනවා තිබූ අඛණ්ඩ සංචාරක සීමා හේතුවෙන්, අප පියාසැරි තොරතුරු කලාපය හරහා පියාසර කිරීම වෙනුවෙන් අයකළ ආදායම ද අඩු මට්ටමක පැවති අතර, එය පෙර වසරට සාපේක්ෂව 27% ක පහත වැටීමක් ලෙස වාර්තා විය. මගී මෙහෙයුම් 37% ක සැලකිය යුතු අඩුවීම හේතුවෙන්, ගුවන්තොටුපළ බද්දෙන් ලැබෙන ආදායම රුපියල් බිලියන 1.5 සිට රුපියල් බිලියන 0.9 දක්වා 35% කින් අඩු විය.

2021 වසරේ දී, ම.රා.ජා.ගු. (මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ) හි ගුවන් ගමනාගමන සංඛ්‍යාලේඛනයෙහි සැලකිය යුතු ලෙස වර්ධනයක් පෙන්නුම් කරමින්, එහි ආරම්භයේ සිට වාර්තාගත වැඩිම ගුවන් යානා මෙහෙයුම් සහ මගී මෙහෙයුම් ප්‍රමාණයක් සිදු කොට ගු.ගු.සේ.ස. විසින් එහි එක් සන්ධිස්ථානයක් අත්කර ගන්නා ලදී.

ඵලදායී සාකච්ඡා තුළින් එකඟ වූ පියවීම් සැලැස්මකට අනුව ජාතික ගුවන් සේවයෙන් දිගු කාලයක සිට අයවීමට තිබූ ණයක් අයකර ගැනීමට ගු.ගු.සේ. සමාගමට හැකිවූ බව මම සතුටින් දැනුම් දෙමි.

වසර තුළ මුහුණ දුන් අභියෝග

කොවිඩ්-19 හි සෘජු බලපෑමට අමතරව, ගුවන් සේවා අංශය අඛණ්ඩව අභියෝග ගණනාවකට මුහුණ දුන්නේය. වෙළඳපළ තත්ත්වයන් පහත වැටීම, ආර්ථිකයේ සෑම අංශයකටම පාහේ ඇති වූ වසංගතයේ බලපෑම හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් කඩා වැටීම, ගුවන් සමාගම් පිරිවැය ඵලදායී මෙහෙයුම් යොදා ගැනීම, යාබදව පිහිටි පියාසැරි තොරතුරු කලාපයේ (FIR) මෙහෙයුම් නැවැත්වීම පියාසැරි තොරතුරු කලාපය හරහා පියාසර කිරීම්වලට බලපෑම් එල්ල කිරීම සහ ගුවන්තොටුපළවල ක්‍රියාත්මක වන වෙළඳ ගිවිසුම්වලට බලපාන මගී ප්‍රවාහනවල අඩු වීම මේ සඳහා ඇතුළත් විය.

කොවිඩ්-19 සහ අදාළ අභියෝග කළමනාකරණය

කොවිඩ්-19 හේතුවෙන් වූ සෞඛ්‍ය අවදානම් අවම කිරීම සඳහා ගන්නා ලද පූර්වාරක්ෂාවන් පිළිබඳව මගීන්ට සහතික කිරීමට ගු.ගු.සේ.ස. විසින් පියවර ගණනාවක් ගෙන ඇත. මේ සඳහා ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සිලය (ACI), ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) සහ ගුවන් සේවා සහා ප්‍රතිසාධන කාර්යසාධක බලකාය (CART) හි සහතික කිරීම් සහ නිර්දේශ ඇතුළත් විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙන් (බ.ජා.ගු.) ජනවාරි මස 11 වෙනි දින සහ ම.රා.ජා.ගු. 2021 ජූනි 30 වැනි දින මෙම සහතික කිරීම ලබා ගන්නා ලදී.

වසංගතය තත්ත්වය අතරතුර මගීන් සහ සේවකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම අතිශයින්ම වැදගත් විය. ගු.ගු.සේ.ස. විසින් කොවිඩ්-19 ආසාදනවල හදිසි වැඩිවීම් වාර්තා වූ, ඉහළ අවදානම් රටවලින් පැමිණෙන මගීන්ට සීමා පනවන ලදී. පූර්වාරක්ෂාව සහ ආරක්ෂිත පියවරක් ලෙස, ගු.ගු.සේ.ස. සහ අනෙකුත් අදාළ ආයතනවල සේවකයින්ට ස්වේච්ඡා එන්නත් කිරීමේ වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. මේ යටතේ, කොවිඩ්-19 එන්නතෙහි දෙවන මාත්‍රාව සේවකයින් 4,100 කට වැඩි පිරිසකට ලබා දුන් අතර, සුදුසුකම් ලත් සේවකයින්ට 2021 නොවැම්බර් මාසයේ දී අනුපූරක එන්නත ද ලබා දෙන ලදී.

සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම ඇතුළුව, කොවිඩ්-19 ආරක්ෂණ මාර්ගෝපදේශ පිළිපැදීමට සේවකයින් දිරිමත් කරන ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා සමාගම විසින් අවශ්‍ය වූ අවස්ථාවන්හී දී නිවසේ සිට රැකියා කටයුතුවල නියැලීමට අවස්ථාව සලසන ලදී.

ව්‍යාපාර කටයුතු මෙහෙයවීම

ගු.ගු.සේ.ස. විසින් ගන්නා ලද පූර්වාරක්ෂිත පියවර වසර පුරා ව්‍යාපාරය පවත්වා ගැනීමට බෙහෙවින් දායක විය. කොවිඩ්-19ට එරෙහිව ශ්‍රී ලංකාව තුළ සිදු කළ සාර්ථක එන්නත් කිරීමේ වැඩසටහන සහ කීර්තිමත් සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව වෙත ලොව පුරා ඇති පිළිගැනීම සංචාරක සීමාවන් ලිහිල් කළ වහාම සංචාරකයින්ගේ පැමිණීම වේගවත් වීම සඳහා උපකාරී විය.

ශ්‍රී ලංකාවේ "හෙළ වෙදකම" (ආයුර්වේද වෛද්‍ය විද්‍යාව) පිළිබඳ අවධානය යොමු කරමින්, සෞඛ්‍ය සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම මඟින් සෙසු සංචාරක ගමනාන්තයන් අභිබවා ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටීමට හේතු වී ඇත.

විවේකය, ව්‍යාපාර කටයුතු, MICE (රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන), මිතුරන් සහ ඥාතීන් මුණගැසීම (VFR), වෛද්‍ය අවශ්‍යතා සහ වන්දනා ගමන් වැනි අරමුණු හේතුවෙන් දේශසීමා හරහා සංචාරය කිරීමට ලොව පුරා බලාපොරොත්තුවෙන් සිටින සංචාරකයින්ගේ අවශ්‍යතාවය, කර්මාන්තයේ පැවැත්මට සහ වර්ධනයට දායක වේ.

ගු.ගු.සේ.ස. හි 2021 වසරේ ප්‍රධාන උපායමාර්ගය වූයේ, බිඳවැටුණු ඉල්ලුම යළි නඟා සිටුවීමයි. ගු.ගු.සේ.ස. විසින් ගුවන් ගමන් මෙහෙයුම් නැවත ආරම්භ කිරීම සඳහා ගුවන් සමාගම් සමඟ සාකච්ඡා කළ අතර, මිල නියම කිරීමේ නියමයන් මගීන්ගේ ගමනාගමනයට අනුකූල බව සහතික කිරීම සඳහා, අපගේ මගී සහ භාණ්ඩ ප්‍රවාහන පර්යන්ත බද්දට ගත් කල්බදු හවුල්කරුවන් (අනුග්‍රාහකයින්) සමඟ ඇති සියලුම වෙළඳ ගිවිසුම් නැවත සලකා බලන ලදී.

2021 වසර අවසාන කාර්තුව තුළ දී ගුවන් සමාගම් 4 ක් විසින් බ.ජා.ගු. වෙත නැවත මෙහෙයුම් ආරම්භ කිරීමත් සමඟ ගු.ගු.සේ.ස. දරන ලද මෙම ප්‍රයත්නයන් සඳහා ප්‍රතිලාභ ලැබිණි. අපි කොවිඩ්-19 තත්ත්වයට පෙර ඉදිරිපත් කරන ලද වෙළඳ ගිවිසුම්වලින් 97% ක් පවත්වා ගත් අතර, වසර තුළ නව ගිවිසුම් 22 ක් අත්සන් කරන ලදී.

සභාපතිතුමාගේ පණිවුඩය

එක් එක් ගුවන්තොටුපළ සඳහා හඳුනාගත් වෙළඳපළ කොටස් වෙත නිකේතික පිරිනැමීම් සිදු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක අංශය යථා තත්ත්වයට පත් කිරීමට දායක වීම අපගේ අනාගත අපේක්ෂාවයි. මෙම උපායමාර්ගය තුළ බ.ජා.ගු. වෙළඳපළ ස්ථායීකරණය, ම.රා.ජා.ගු. වෙළඳපළ වර්ධනය, කො.ජා.ගු.ර. සහ යා.ජා.ගු. සඳහා නව වෙළඳපළ ප්‍රවේශය සහ රටේ ගුවන් ධාවන පථයන්හි සිදු වන දේශීය ගුවන් මෙහෙයුම්වල වර්ධනයක් ඇති කිරීම ද ඇතුළත් වේ. පවතින අවස්ථා කවුළුවෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිද්දෙන් මෙම උපායමාර්ගය සකස් කළ යුතු අතර, එය අනෙක් අවස්ථා කෙරෙහි ද ධනාත්මක බලපෑමක් ඇති කරයි.

සභාපතිතුමාගේ පණිවුඩය

එක් එක් ගුවන්තොටුපළ සඳහා හඳුනාගත් වෙළඳපළ කොටස් වෙත නිකේතික පිරිනැමීම් සිදු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක අංශය යථා තත්ත්වයට පත් කිරීමට දායක වීම, අපගේ අනාගත අපේක්ෂාවයි. මෙම උපායමාර්ගය තුළ බ.ජා.ගු. වෙළඳපළ ස්ථායීකරණය, ම.රා.ජා.ගු. වෙළඳපළ වර්ධනය, කො.ජා.ගු.ර. සහ යා.ජා.ගු. සඳහා නව වෙළඳපළ ප්‍රවේශය සහ රටේ ගුවන් ධාවන පථයන්හි සිදු වන දේශීය ගුවන් මෙහෙයුම්වල වර්ධනයක් ඇති කිරීම ද ඇතුළත් වේ. පවතින අවස්ථා කවුළුවෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිද්දෙන් මෙම උපායමාර්ගය සකස් කළ යුතු අතර, එය අනෙක් අවස්ථා කෙරෙහි ද ධනාත්මක බලපෑමක් ඇති කරයි.

2020 වසර සිට තීරුබදු රහිත සහ අනෙකුත් වෙළඳසැල් ක්‍රියාකරුවන්ට සැලකිය යුතු සහන ලබා දුන් අතර, 2021 වසරේ දී ගුවන් ගමන් සහ මගී ප්‍රවාහනය ක්‍රමානුකූලව වැඩි වීම හේතුවෙන් දැනට පවතින වෙළඳසැල් ආරක්ෂා කිරීමට හැකි වූවා මෙන්ම, හවුල්කරුවන් අතර මූල්‍ය පීඩනය බෙදාහදා ගැනීමෙන් සියලු දෙනාටම ජයග්‍රාහී තත්ත්වයක් ළඟා කර ගැනීමට හැකි විය.

අවස්ථා සහ මුලපිරීම්

දේශීය සංචාරක කර්මාන්තය දියුණු කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම දිරිමත් කරමින් වසර තුළ ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ අවස්ථා ගණනාවක් උදා විය. ශ්‍රී ලංකාව ජනප්‍රිය සංචාරක ගමනාන්තයක් ලෙස නම් කොට තිබීම සහ ඉහළම ගුවන් ගමන් ව්‍යාපාර කලාපය තුළ පිහිටා තිබීම හේතුවෙන් ගු.ගු.සේ.ස. වෙත සිය සේවාවන් ප්‍රවර්ධනය කිරීමට ඉඩ සැලසුණි. වේගයෙන් වර්ධනය වන ගෝලීය නිකේතනයක් වන සුවතා සංචාරක කර්මාන්තයේ ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව නමක් දිනා තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට අවස්ථාව සලසා දී ඇත.

දේශීය ගුවන් සේවා අංශයේ අපේක්ෂාවන් අතරට 2021 වසරේ දෙවන භාගයේ දී ගුවනේ සිට සිරි නැරඹීම සඳහා ඉහළ ඉල්ලුමක් තිබීම ද ඇතුළත් විය. මෙමඟින් ගුවන්යානා රඳවන ගොඩනැගිලි බදු දීමෙන් සහ ගුවන්යානා ගොඩබෑමේ සහ නැවැත්වීමෙන් ආදායමක් උපයා ගැනීමෙන් ගු.ගු.සේ.ස. වෙත ප්‍රතිලාභ ලැබිණි. මීට අමතරව, 2021 වසර සිව්වන කාර්තුව තුළ ගුවන් සේවා පුහුණුව සඳහා කලාපීය ඉල්ලුම වැඩි වීම් සහ නියමිත ගුවන් සේවා නැවත ආරම්භ කිරීම, ගු.ගු.සේ.ස. සඳහා දිරිගැන්වීමක් විය.

වසර තුළ දී, ම.රා.ජා.ගු. විදේශීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට මුලපිරූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ දී ම.රා.ජා.ගු. වෙත/සිට ගුවන් සේවා 12 ක් ගුවන් මෙහෙයුම් ආරම්භ කරන ලදී. දේශීය ගුවන් සේවා දිරිගැන්වීමේ අරමුණින් ගු.ගු.සේ.ස. විසින් දේශීය ගුවන් සමාගම් සමඟ හවුල්කාරිත්වයෙන් ඒකාබද්ධව ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී. ශ්‍රී ලංකාව ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමිය ලෙස නැවත නම් කරන ලදී. එය ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් ගුවන් සේවා පුහුණු ආයතනයක් ලෙස ගු.ගු.සේ.ස. හි පුහුණු අංශය පිහිටුවීමට ගත් පියවරකි.

අනාගත උපායමාර්ග

එක් එක් ගුවන්තොටුපළ සඳහා හඳුනාගත් වෙළඳපළ කොටස් වෙත නිකේතික පිරිනැමීම් සිදු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක අංශය යථා තත්ත්වයට පත් කිරීමට දායක වීම අපගේ අනාගත අපේක්ෂාවයි. මෙම උපායමාර්ගය තුළ බ.ජා.ගු. වෙළඳපළ ස්ථායීකරණය, ම.රා.ජා.ගු. වෙළඳපළ වර්ධනය, කො.ජා.ගු.ර. සහ යා.ජා.ගු. සඳහා නව වෙළඳපළ ප්‍රවේශය සහ රටේ ගුවන් ධාවන පථයන්හි සිදු වන දේශීය ගුවන් මෙහෙයුම්වල වර්ධනයක් ඇති කිරීම ද ඇතුළත් වේ. පවතින අවස්ථා කවුළුවෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිද්දෙන් මෙම උපායමාර්ගය සකස් කළ යුතු අතර, එය අනෙක් අවස්ථා කෙරෙහි ද ධනාත්මක බලපෑමක් ඇති කරයි.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ සහ ගුවන් සේවා කර්මාන්තයේ වර්ධනය පිළිබඳ ධනාත්මක දැක්ම රඳා පවතිනුයේ, රට තුළ සංචාරක ව්‍යාපාරය සඳහා හිතකර පරිසරයක් පවත්වාගෙන යාම සහ කොවිඩ්-19 තර්ජනයේ ස්ථාවර අඩුවීම මත ය.


ස්තුතිය

පළමුවෙන්ම, කොවිඩ්-19 බලපෑම නොතකා මෙම අත්‍යවශ්‍ය ගුවන් සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමස්ත ශ්‍රම බලකාය සහ සියලුම පාර්ශ්වකරුවන් ගු.ගු.සේ.ස. වෙත ලබා දුන් ප්‍රශංසනීය, කැපවූ සහ පක්ෂපාති සහය වෙනුවෙන් මම ස්තුතිවන්ත වෙමි.

අභියෝග ජය ගැනීම සඳහා ඵලදායී උපායමාර්ගයක් සක්‍රීයව මෙහෙයවීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අපගේ ආයතනික උපායමාර්ගය සාක්ෂාත් කර ගැනීම සඳහා දරන ලද කැපවීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ද මගේ කෘතඥතාව පුද කරමි.

අදාළ පරිපාලන සහ ප්‍රතිපත්තිමය කාර්යයන් සඳහා මඟපෙන්වීම් වෙනුවෙන් කැබිනට් අමාත්‍යවරයා, ගු.ගු.සේ.ස. භාර රාජ්‍ය අමාත්‍යවරයා, රේඛීය අමාත්‍යාංශය, සිවිල් ගුවන් සේවා අධිකාරිය, සංචාරක සංවර්ධන අධිකාරිය සහ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වෙත මම ස්තුතිය පළ කරමි.

අඛණ්ඩව ශ්‍රී ලංකාව වෙත ගුවන් ගමන් කටයුතු පවත්වා ගෙන ගිය ගුවන් සමාගම් සහ අපගේ ගුවන්තොටුපළෙහි ස්ථානගත කර ඇති සියලුම ආයතන අප කෙරෙහි තැබූ විශ්වාසය සහ ස්ථිරභාවය වෙනුවෙන් විශේෂ ස්තුතිය පළ කරමි.



මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඒ චන්ද්‍රසිරි
RWP USP VSV ndc psc
සභාපති

2022 ජූනි 10 වන දා

නායකත්ව කණ්ඩායම



වමේ සිට දකුණට අසුන් ගෙන සිටින

ඩී. ඒ. දි. ලිවේරා මහත්මිය - විධායක නොවන අධ්‍යක්ෂ
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී. ඒ. චන්ද්‍රසිරි මහතා RWP USP VSV ndc psc - සභාපති | ආර්. සූරියආරච්චි මහතා - උප සභාපති

වමේ සිට දකුණට හිටගෙන සිටින

ඉංජිනේරු යූ. එස්. මංචනායක මහතා - විධායක නොවන අධ්‍යක්ෂ | ආර්. ඒ. පී. විජේරත්නසේකර මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
ජී. ඒ. ඒ. ප්‍රියන්ත මහතා - විධායක නොවන අධ්‍යක්ෂ / මහා භාණ්ඩාගාර නියෝජිත



ඩී. ඒ. පී. වීරරත්න මහතා, ජනාධිපති නීතිඥ - විධායක නොවන අධ්‍යක්ෂ | ඒ. එස්. වරුෂහෙන්නැදිගේ මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
වී. එල්. උඩුගම්පොල මහත්මිය, AAL - සමාගම් ලේකම්

එස්. සුමනසේකර මහතා - විධායක නොවන අධ්‍යක්ෂ | ඩබ්ලිව්. එම්. ජී. රශාන්ත මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
ඒ. එච්. එස්. ගුණවර්ධන මහතා - ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂක

ජායාරූපයේ නොමැති
සී. විතාරණ මහතා - විධායක නොවන අධ්‍යක්ෂ

නායකත්ව කණ්ඩායම

විශ්‍රාමික මේජර් ජෙනරාල් ජී. ඒ. චන්ද්‍රසිරි මහතා
RWP USP VSV ndc psc

සභාපති

විශ්‍රාමික මේජර් ජෙනරාල් ජී. ඒ. චන්ද්‍රසිරි මහතා, 2019 දෙසැම්බර් මස ගු.ගු.සේ.ස. හි සභාපති ලෙස තේරී පත් වූ අතර, එතැන් පටන් ගු.ගු.සේ.ස. හි සභාපතිතුමා මෙන්ම ප්‍රධාන විධායක නිලධාරී ලෙසද කටයුතු කරයි. ඔහු 2021 වර්ෂයේදී, සමාගම හි උපායමාර්ගික සැලසුම්කරණය සහ කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය සහ ආදායම් උත්පාදනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල මුලසුන දැරීය.

ඔහු ලංකා බැංකුව හි අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස ද සේවය කරයි. ශ්‍රී ලංකා යුද හමුදාවේ මාණ්ඩලික ප්‍රධානී, ඒකාබද්ධ මෙහෙයුම් අණදෙන මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී සහ ශ්‍රී ලංකා යුධ හමුදා විශේෂ කාර්යය බලකායේ රෙජිමේන්තු ආඥාපති, යාපනයේ ආරක්ෂක සේනා මූලස්ථානයේ ආඥාපති, අතිගරු ජනාධිපතිතුමාගේ හමුදා ආරක්ෂක සම්බන්ධීකාරක, සහ යුද්ධයෙන් පසු උතුරු පළාතේ අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා අදාළ නිසි බලධාරීන් ඇතුළු ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රධාන අණදීමේ සහ මාණ්ඩලික පත්වීම් රැසක් දරමින්, හමුදා ක්ෂේත්‍රය තුළ වසර 35ක කීර්තිමත් අත්දැකීම් ඔහු සතුය. එමෙන්ම ඔහු 'රණ වික්‍රම පදක්කම' (RWP), 'විශිෂ්ඨ සේවා විභූෂණ' (VSV) සහ 'උත්තම සේවා පදක්කම' (USP) වැනි කීර්තිමත් සම්මානවලින් පිදුම් ලබා ඇත. තවද ඔහු 2009 වසර සිට 2015 වසර දක්වා උතුරු පළාත් ආණ්ඩුකාරවරයා ලෙස ද කටයුතු කළේය.

විශ්‍රාමික මේජර් ජෙනරාල් ජී. ඒ. චන්ද්‍රසිරි මහතා, ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යායතනය සහ බංගලාදේශයේ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය හි උපාධිධාරියෙකි. ඔහු කෝවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික කාර්යසාධක බලකායේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ අතර, වර්තමානයේ පශ්චාත්-කෝවිඩ් සංචාරක පුනර්ජීවන කාර්යසාධක බලකායේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරනු ලබයි.

ආර්. සූරියආරච්චි මහතා

උප සභාපති

රජීවසිරි සූරියආරච්චි මහතා, 2019 දෙසැම්බර් මාසයේදී ගු.ගු.සේ.ස. හි උප සභාපති ලෙස පත් වූ අතර, සභාපතිවරයාට පසු සමාගම හි එකම පූර්ණ කාලීන විධායක අධ්‍යක්ෂවරයා ලෙස ඔහු කටයුතු කරයි. ඔහු රක්ෂණ, ගෘහ විදුලි උපකරණ සහ ජාත්‍යන්තර ව්‍යාපාර පරිපාලනය යන ක්ෂේත්‍ර හි වසර 30 කට වැඩි පළපුරුද්දක් සහ පුළුල් දැනුමක් සතු අයෙකි. ඔහු පත්වීම් ලද දා සිට, සමාගම යටතේ ඇති සියලුම ගුවන් තොටුපළවල පරිපාලන සහ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කරමින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. එමෙන්ම ඔහු සමාගම හි මානව සම්පත් සහ වේතන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුව හි මුලසුන දැරීය. ඔහු ගු.ගු.සේ.ස. හි මාධ්‍ය ප්‍රකාශක ලෙස ක්‍රියා කරන අතරම, ප්‍රධාන දේශීය සහ ජාත්‍යන්තර කර්මාන්ත පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කරනු ලබයි.

ගු.ගු.සේ.ස. හි නියෝජ්‍ය සභාපතිතුමා ලෙස පත්වීමට පෙර, රජීවසිරි මහතා 2010-2015 කාලය තුළ පුත්තලම ලුණු සමාගම හි සභාපතිවරයා ලෙස කටයුතු කළේය. එමෙන්ම ඔහු 2011-2015 කාලය තුළ සීමාසහිත ගම්පහ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ සභාපති ලෙස ද කටයුතු කර ඇත. ඔහු වර්තමානයේ, 2022 වසර සිට සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම හි උප සභාපති ලෙස කටයුතු කරන අතර, 2016 වසර සිට සීමාසහිත සමූපාකාර රක්ෂණ සමාගමේද 2007 - 2010 කාල පරිච්ඡේදය තුල මාර්ග සංවර්ධන අධිකාරියේ ද අධ්‍යක්ෂක තනතුරු දරා ඇත.

එස්. සුමනසේකර මහතා

විධායක නොවන අධ්‍යක්ෂතුමා

මෙහාන් සුමනසේකර මහතා, 2019 දෙසැම්බර් මාසයේ සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකි. වාණිජ ගුවන් නියමු බලපත්‍රලාභියෙකු වන ඔහු, ගුවන් සේවා ක්ෂේත්‍රයේ වත්මන් ස්වභාවය හා ව්‍යාපාරික අවස්ථාවන් හඳුනා ගැනීමට අවශ්‍ය පරිචය සහ තාක්ෂණික දැනුම ද සතු අයෙකි. ඔහුගේ විවිධාංගීකරණය වූ අත්දැකීම් පරාසය අතර ගුවන් සේවා, තෙල් හා ගෑස්, නාවික හා සැපයුම්, ගල් අඟුරු, රසායනික සහ තාර ආශ්‍රිත නිෂ්පාදන වැනි ක්ෂේත්‍රයන් වේ.

ඔහු මැක්ලොයිඩ්ස් සමාගම (Mcloyds Holdings) හි කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිවරයා වන අතර, තවත් විවිධාංගීකරණය වූ ආයතන තුනක අධ්‍යක්ෂ තනතුරු දරනු ලබයි. සුමනසේකර මහතා වේල්ස් විශ්ව විද්‍යාලයෙන් (එංගලන්තය) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර, ඔහු වාණිජ ගුවන් නියමු බලපත්‍රය ලබා ඇත්තේ ඇමරිකානු එක්සත් ජනපදයේ ෆෙඩරල් ගුවන් සේවා අධිකාරියෙනි (FAA).

වසර ගණනාවක් පුරා, ඔහු කළමනාකරණය කරන සහ නියෝජනය කරනු ලබන සමාගම් සමූහයට සුවිශේෂී ව්‍යාපාර වර්ධනයක් සහ සේවා සහ සැපයුම් දාම කළමනාකරණය පුළුල් කරමින්, තම දායකත්වය ලබා දී ඇත. සුමනසේකර මහතා රාජ්‍ය නොවන සංවිධානයක් වන "ජන සහන පදනම" හි සභාපති තනතුර දරමින්, ජනප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීමට සහය වන අතර, අධ්‍යාපනයේ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම උදෙසා විවිධ වැඩසටහන් මඟින් ශ්‍රී ලංකාවේ බොහෝ දරුවන්ගේ ජීවිත වල සුභදායී පරිවර්තනයක් කිරීමට උත්සහ දරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහු මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ (ම.රා.ජා.ගු.) හාර අධ්‍යක්ෂ ලෙසත්, සියලුම ගුවන් තොටුපළවල මෙහෙයුම් හාර අධ්‍යක්ෂ ලෙසත් පත් කරන ලදී. වාණිජ හා දේපළ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව, ආදායම් උත්පාදන අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුව ලෙස ප්‍රතිසංවිධානය කිරීමට පෙර, 2021 වර්ෂයේදී ඔහු වාණිජ හා දේපළ මණ්ඩල අනු කමිටුවේ සභාපතිත්වය ද දැරුවේය.

ඒ. එස්. වරුෂහෙන්නැදිගේ මහතා

විධායක නොවන අධ්‍යක්ෂතුමා

අරුණ වරුෂහෙන්නැදිගේ මහතා, 2019 දෙසැම්බර් මාසයේ සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකි. ඔහු ප්‍රාග්ධන වෙළෙඳපොළ, ගුවන් තොටුපළ මෙහෙයුම්, ජාත්‍යන්තර ගුවන් සේවා කළමනාකරණය, වෙළෙඳපොළ සැලසුම්කරණය, සන්නාමකරණය

සහ ගුවන් සේවා උපායමාර්ග සංවර්ධනය පිළිබඳ අත්දැකීම් ලබා ඇත. වරුෂහෙන්නැදිගේ මහතා ලන්ඩන් සවුත් බෑන්ක් විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර අලෙවිකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MSc) ලබා ඇත. ගු.ගු.සේ.ස. සමාගම හි සේවා කාලය තුළ සියලුම ගුවන් සේවා ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහුව පත් කරන ලදී.

ඩී. ඒ. ද. ලිවේරා මහත්මිය

විධායක නොවන අධ්‍යක්ෂතුමිය

ඩී. ඒ. ද. ලිවේරා මහත්මිය, 2019 දෙසැම්බර් මාසයේ සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවකි. ඇය සංචාරක සහ ගුවන් සේවා කළමනාකරණ ක්ෂේත්‍රයේ පළපුරුදු වෘත්තිකයෙකු ලෙස දශක ගණනාවක අත්දැකීම් ලද අයෙකි. රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ර.ජා.ගු.) සහ අභ්‍යන්තර ගුවන් තොටුපළ භාර අධ්‍යක්ෂතුමිය ලෙස ලිවේරා මහත්මිය ගු.ගු.සේ.ස. සමාගම හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලදී. ඇය, ගු.ගු.සේ.ස. හි සේවා කාලය තුළ අවදානම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවේ මෙන්ම T2 දෙවන මගී පර්යන්තය සඳහා වූ වාණිජ සැලසුම් පිලියෙල කිරීමේ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවේ සභාපතිතුමිය ලෙස කටයුතු කළාය.

1986 වසරේදී සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ලිවේරා මහත්මිය, ශ්‍රී ලංකාව තුළ ජපාන ගුවන් සමාගම හි (Japan Airlines) මෙහෙයුම් පිහිටුවීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කළ අතර, එතැන් පටන් ගුවන් සේවා සහ කළමනාකරණ ක්ෂේත්‍රයේ දිගු කාලයක් සේවය කර ඇත. ඇය ජපාන ගුවන් සමාගම (Japan Airlines), තායිලන්ත ජාත්‍යන්තර ගුවන් සමාගම (Thai International), ජෙට්වින් ට්‍රැවල්ස් සහ ජෙට්වින් ගුවන් සේවා (Jetwing Travels and Jetwing Air Services) සමාගම් හි මෙහෙයුම් සහ අලෙවිකරණ කාර්යයන් ආවරණය කරමින් ප්‍රධාන තනතුරු දරා ඇත.

ජෙට්වින් ගුවන් සේවා (Jetwing Travels and Jetwing Air Services) සමාගම් හි සේවය කරන කාලය තුළ, ඇය සහරා ඉන්දියානු ගුවන් සමාගම (Sahara India Airlines), මැලේව් හංගේරියානු ගුවන් සේවය (Malev Hungarian Airlines), ටැප් එයාර් පෘතුගාලය ගුවන් සමාගම (Tap Air Portugal), අයිබීරියා ගුවන් සමාගම (Iberia), සහ ලොඩා ගුවන් සමාගම (Lauda Air) වැනි ගුවන් සමාගම් කිහිපයක රට නියෝජනය කරනු ලබන කළමනාකාරිනිය වූ අතර, ඇය ඒ තුළින් ලොව වටා ගුවන් සේවා ක්ෂේත්‍රය පිළිබඳ අත්දැකීම් සහ දැනුම විශාල ප්‍රමාණයක් ලබා ගත්තාය.

ඉංජිනේරු යූ. එස්. මංචනායක මහතා

විධායක නොවන අධ්‍යක්ෂතුමා

ඉංජිනේරු මංචනායක මහතා, 2019 දෙසැම්බර් මාසයේ සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකි. ඔහු ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇති තාක්ෂණික සහ ඉංජිනේරු වෘත්තිකයකු ලෙස විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසර 26 කට වැඩි පළපුරුද්දක් දරයි. ඔහු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද පරිදි සමාගම හි ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවේ සභාපතිතුමා ලෙස 2021 වර්ෂයේදී කටයුතු කළේය.

දැනට, ඔහු ශ්‍රී ලංකා සී/ස ශ්‍රී ලංකා ටෙලිකොම්- ඩිජිටල් තොරතුරු සේවා (පුද්) සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරිතුමා ලෙස සේවය කරයි. ඔහු වසර අටකට වැඩි කාලයක් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීතුමා ලෙස සේවය කර ඇති අතර, එහිදී දිවයින පුරා විදුලි සංදේශ ජාල ව්‍යාප්තිය සහ හඬතල කටයුතු, පුළුල් කලාපීය සහ දත්ත සේවා යන ක්ෂේත්‍රවල වගකීම් දරා ඇත. ඉංජිනේරු. මංචනායක මහතා, රජයේ පළාත් පාලන ක්‍රියා පටිපාටි සහ පුරවැසි සහභාගීත්ව සංවර්ධන කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වන අතර, සමස්ත ලංකා සාමදාන විනිශ්චයකාරවරයෙකි.

ඉංජිනේරු. මංචනායක මහතා ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රෙස්ටන් විශ්වවිද්‍යාලය හි ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයෙන් විදුලි බල ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

ඩබ්ලිව්. එම්. ජී. රශාන්ත මහතා

විධායක නොවන අධ්‍යක්ෂතුමා

ගිහාන් රශාන්ත මහතා 2021 පෙබරවාරි මාසයේ සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි.

රශාන්ත මහතා බහුවිධ අපනයන සංවිධානයක නිර්මාතෘ සහ කළමනාකාර අධ්‍යක්ෂතුමා ලෙස කටයුතු කරන අතර, ජාත්‍යන්තර මැණික් වෙළෙඳ ක්ෂේත්‍රයේ අත්දැකීම් සම්භාරයක් සතු අයෙකි. වර්තමානයේ, ඔහු රාජ්‍ය ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්තුමා ද වේ.

රශාන්ත මහතා ඇමරිකා එක්සත් ජනපදයේ මින්නෙසෝටා ස්ටේට් විශ්වවිද්‍යාලය හි උපාධිධාරියෙකි.

ආර්. ඒ. පී. විජේරත්නසේකර මහතා

විධායක නොවන අධ්‍යක්ෂතුමා

ආර්. ඒ. පී. විජේරත්නසේකර මහතා, 2019 දෙසැම්බර් මාසයේ සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. ඔහු ප්‍රාදේශීය කළමනාකරුවකු, පළාත් පාලන අමාත්‍යවරුන්ගේ සහ කැබිනට් අමාත්‍යවරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් සහ පුද්ගලික ලේකම්වරයෙකු ලෙසත් රාජ්‍ය අංශයේ වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇති අයෙකි.

ඔහු වර්තමානයේ, 2020 වසරේ සිට අපනයන සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන, සංචාරක හා ගුවන් සේවා කටයුතු භාර ගරු අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්තුමා ලෙස ද කටයුතු කරයි.

විජේරත්නසේකර මහතා, සබරගමුව විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (ව්‍යාපාර අධ්‍යයනය) උපාධියක් ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (සේවා කළමනාකරණය) ශාස්ත්‍රපති උපාධියක්ද ලබා ඇත.

ඩී. ඒ. පී. විරරත්න මහතා, ජනාධිපති නීතිඥ

විධායක නොවන අධ්‍යක්ෂතුමා

ජනාධිපති නීතිඥ ඩී. ඒ. පී. වීරරත්න මහතා, ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. වීරරත්න මහතා, සීමාසහිත ලංකා පොස්පේට්, ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි රජයේ ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු දරමින් පුළුල් අත්දැකීම් සම්භාරයක් ඇති අයෙකි. එමෙන්ම ඔහු අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති අපරාධ නීති ප්‍රතිසංස්කරණ කමිටුවේ සාමාජිකයෙකි.

නායකත්ව කණ්ඩායම

ඔහු පසුගිය වසර 20 තුළ ඔහු නිල නොවන මහේස්ත්‍රාත්වරයෙකු ලෙස සහ 1985 වසර සිට මුළු දිවයිනටම සෑම විනිසුරුවරයෙකු ලෙස කටයුතු කර ඇත. ඔහු දැනට පසුගිය වසර 10 පටන් ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ නීතීඥ මණ්ඩලයේ සාමාජිකත්වය දරයි. නීති විශේෂඥයෙකු ලෙස ඔහු නීතීය සම්බන්ධ පොත් ගණනාවක් ලියා ඇත.

පී. ඒ. ඒ ප්‍රියන්ත මහතා

විධායක නොවන අධ්‍යක්ෂතුමා/මහා භාණ්ඩාගාර නියෝජිත

පී. ඒ. ඒ. ප්‍රියන්ත මහතා, 2021 ජුනි මස සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් වන ලදී. ඔහු සමාගමේ විගණන සහ කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා ලෙසද කටයුතු කරයි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ ඇතුළු තනතුරු රැසක සේවය කර ඇති ඔහු මුදල් අමාත්‍යාංශයේ වසර 18කට වැඩි පළපුරුද්දක් දරයි.

ප්‍රියන්ත මහතා, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා ලෙසද කටයුතු කර ඇත. දැනට ඔහු මුදල් අමාත්‍යාංශයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) ලෙස කටයුතු කරයි. ඔහු 2005 වසර සිට බොහෝ රාජ්‍ය ව්‍යවසායන් සහ රාජ්‍ය සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරයකු ලෙස ද කටයුතු කර ඇත.

ප්‍රියන්ත මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (B.Sc.) උපාධියක් ලබා ඇත.

ඒ. එච්. එස්. ගුණවර්ධන මහතා

ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂක

ඒ. එච්. එස්. ගුණවර්ධන මහතා 2019 දෙසැම්බර් මාසයේ සිට ගු.ගු.සේ.ස. අධ්‍යක්ෂ මණ්ඩලයේ අමාත්‍යාංශ නිරීක්ෂකයෙකි. ශ්‍රී ලංකා පරිපාලන සේවය (SLAS) නිලධාරියෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරමින්, ගුණවර්ධන මහතා රාජ්‍ය අංශයේ වසර 24කට අධික කාලයක් සේවය කර ඇත.

ඔහු 1998 වසරේදී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු (SLAS II/II) ලෙස ප්‍රථම වරට පත්වීම ලද අතර, විවිධ අමාත්‍යාංශවල සහ රාජ්‍ය ආයතනවල ජ්‍යේෂ්ඨ තනතුරු දරමින් පන්නරයක් ලද විශාල අත්දැකීම් ඇත්තෙකි. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු (SLAS I) ලෙස සේවය කළ කාලයේ, ඔහු රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන, ඉඩම් ගොඩකිරීමේ කොමිෂන් සභාව, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වැනි බොහෝ රාජ්‍ය ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල හි භාණ්ඩාගාර කටයුතු නියෝජනය කළේය.

වර්තමානයේ ඔහු ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමා (පරිපාලන සහ ගුවන් සේවා) ලෙස කටයුතු කරනු ලබයි. ගුණවර්ධන මහතා පිළිවෙළින් 2019 සහ 2020 වර්ෂයන් තුළ ගු.ගු.සේ.ස. සහ සිවිල් ගුවන් සේවා අධිකාරිය හි වැඩබලන සභාපතිතුමා ලෙස ද කෙටි කාලයක් සේවය කර ඇත.

ගුණවර්ධන මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත. ඔහු එම විශ්වවිද්‍යාලයේම ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය ද ලබා ගත් අතර, දැනට ශාස්ත්‍රපති උපාධියක් සඳහා අපේක්ෂාවෙන් සිටී.

සී. විතාරණ මහතා

විධායක නොවන අධ්‍යක්ෂතුමා

චන්දික විතාරණ මහතා, 2019 දෙසැම්බර් මාසයේ සිට ගු.ගු.සේ.ස. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සේවය කරයි. වසර 30 කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු, නිෂ්පාදන උපායමාර්ග, විකුණුම් ජාල සංවර්ධනය, මූල්‍ය සහ මානව සම්පත් පිළිබඳ විශේෂඥ දැනුමකින් යුතුය.

වර්තමානයේ විතාරණ මහතා සීමාසහිත මොබිටෙල් (පුද්ගලික) සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරිතුමා ලෙස ද කටයුතු කරන අතර, සමාගම දිවයිනේ වඩාත්ම ලාභදායී සහ සාර්ථක ජංගම දුරකථන සේවා ක්‍රියාකරු ලෙස කටයුතු කිරීමට අවැසි නායකත්වය දී ඇත. ඔහු ප්‍රධාන විධායක නිලධාරිතුමා ලෙස පත්වීමට පෙර විදුලි සංදේශ ක්ෂේත්‍රයේ විකුණුම් කළමණාකාරතුමා සහ ජ්‍යේෂ්ඨ සාමාන්‍යාධිකාරීතුමා ලෙස භූමිකාවන් හරහා පන්නරයක් ලබා ඇත.

ඔහු ඉන්දියාවේ දිල්ලි විශ්වවිද්‍යාලයෙන් දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (ගෞරව) උපාධියක් දරයි.

ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම


1


2


3


4


5


6


7


8


9

ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම


10


11


12


13


14


15


16


17


18


19


20


21

1. ජී. චිතානගේ මහතා - සිවිල් ඉංජිනේරු ප්‍රධානී (සැලසුම් සහ නිර්මාණ)
2. එච්. එස්. හෙට්ටිආරච්චි මහතා - ගුවන් තොටුපළ කළමනාකරණ ප්‍රධානී
3. ජේ. ඒ. එම්. ඩී. එස්. එස්. අබේවර්ධන මහතා - මූල්‍ය ප්‍රධානී
4. ඒ. අයි. බී. කරුණාරත්න මහතා - ව්‍යාපෘති ප්‍රධානී
5. එම්. රත්නසිංහ (මහත්මිය) - නීති ප්‍රධානී
6. එච්. පී. එල්. සිරිමාන්න මහතා - සැපයුම් දාම කළමනාකරණ ප්‍රධානී
7. කේ. ඩී. වයි. චාන්දනී (මහත්මිය) - උපායමාර්ගික කළමනාකරණ ප්‍රධානී
8. යූ. එම්. වීරවර්ධන මහතා - විදුලි ඉංජිනේරු අංශ ප්‍රධානී
9. ජේ. එම්. දි කෘස් රුබින් මහතා
   - ගෘහ නිර්මාණ ශිල්පය, භූමි අලංකරණය සහ අභ්‍යන්තර සැලසුම් ප්‍රධානී
10. යූ. ජේ. ලොකුආරච්චි මහතා - තොරතුරු තාක්ෂණ ප්‍රධානී
11. යූ. එස්. ජාගොඩ මහතා - සිවිල් ඉංජිනේරු ප්‍රධානී (නඩත්තු කටයුතු)
12. වින්ග් කොමාන්ඩර් එස්. එම්. ඩී. විජේසූරිය මහතා (විශ්‍රාමික)
    - ගිනි නිවාරණ සහ මුදවා ගැනීමේ සේවා ප්‍රධානී
13. එස්. එස්. ද සිල්වා - අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන ප්‍රධානී
14. එම්. කේ. පී. තෙන්නගේ (මහත්මිය) - අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික ප්‍රධානී
15. ජේ. කේ. රත්නින්ද - ඉලෙක්ට්‍රොනික හා ගුවන් සන්තරණ ඉංජිනේරු අංශ ප්‍රධානී
16. එන්. සී. අබේවර්ධන - ගුවන් සන්තරණ සේවා ප්‍රධානී
17. ආර්. ඩබ්ලිව්. එල්. බී. මැදවැව - භාණ්ඩ හා ගුවන් භාණ්ඩ ප්‍රවාහන කළමනාකරණ ප්‍රධානී
18. ඩී. ජේ. යූ. පුරසිංහ - වාණිජ සහ දේපළ ප්‍රධානී
19. මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ඒ. පී. පල්ලාවෙල RWP RSP - ආරක්ෂක සේවා ප්‍රධානී
20. ලුතිනන් කර්නල් (විශ්‍රාමික) කේ. එච්. සී. කුමාරසිංහ
    - බුද්ධි සහ ආරක්ෂණ මෙහෙයුම් අංශ ප්‍රධානී - සියලුම ගුවන් තොටුපළ
21. එස්. පී. පාලගම - යාන්ත්‍රික ඉංජිනේරු වැඩබලන ප්‍රධානී
22. එස්. ඩී. ඒ. එස්. නිශාන්ත - සමාගමේ වෛද්‍ය නිලධාරී


22

පින්තූරයේ නොමැති
එච්. ඒ. ඒ. කේ. එම්. සෙනෙවිරත්න - සිවිල් ගුවන් සේවා පුහුණු ප්‍රධානී
එම්. සී. ජී. මහීපාල (මහත්මිය) - මානව සම්පත් ප්‍රධානී





නවෝත්පාදනය තුළින් ගුවන් ගමන් වඩාත් ආරක්ෂිත සහ පහසු කිරීම

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු. මෙහි දක්වා ඇති විස්තර, 2007 අංක 7 දරන සමාගම් පනතට අවශ්‍ය අදාළ තොරතුරු සපයන අතර, හොඳම ගිණුම්කරණ පිළිවෙත් අනුව කටයුතු කර ඇත. මෙම සංක්ෂිප්ත වාර්තාව හරහා, සමාගමේ කටයුතුවල තත්ත්වය මෙන්ම ගිණුම්කරණ කාලසීමාව තුළ සිදුවන යම් යම් වෙනස්කම් වෙතොත් ඒ පිළිබඳ අගය කිරීමක් සඳහා කොටස් හිමියන්ට තොරතුරු හෙළිදරව් කිරීම් මනාව සිදු කර ඇති බවට අපි සහතික කර ඇත්තෙමු.

1 සමාගම පිළිබඳ

සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම (ගු.ගු.සේ.ස.) යනු, ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්තොටුපළ කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ව්‍යවස්ථාපිත බලතල සහිත, සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජය සතු සමාගමකි.

2. ප්‍රධාන ක්‍රියාකාරකම්

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත මඟින් 2010 නොවැම්බර් 04 වැනි දින පළ කරන ලද ගැසට් පත්‍රය අනුව පැවරී ඇති බලතල යටතේ, පහත සඳහන් ගුවන් සේවාවල එකම ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු ලෙස ගු.ගු.සේ.ස. එහි ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

2.1 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (බ.ජා.ගු.), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ම.ජා.ගු.), කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ රත්මලාන (කො.ජා.ගු.ර.), මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ම.ජා.ගු), සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ (යා.ජා.ගු), සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

2.2 ඉහත සඳහන් ගුවන් පර්යන්තවල සුපරීක්ෂා කිරීම්, ගිනි නිවීමේ සහ මුදවා ගැනීමේ සේවා සහ ගුවන් ආරක්ෂක සේවා සැපයීම් සහ නඩත්තු කිරීම්.

2.3 කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය තුළ ඇති සියලුම ගුවන් යානා සහ මඟීන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සහතික කරමින්, ගුවන් ගමනාගමන සේවා, ගුවන් ගමන් පිළිබඳ තොරතුරු සේවා, ගුවන් සන්නිවේදන සේවා සහ සන්නිවේදනය, ගගන නාවික කටයුතු, නිරීක්ෂණ සඳහා ගුවන් යානා ආධාර ආදිය සැපයීම.

3. මෙහෙයුම් සමාලෝචනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳ සමාලෝචනයක් සහ ගු.ගු.සේ.ස. හි අනාගත ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ, වාර්ෂික වාර්තාවේ සභාපතිතුමාගේ පණිවුඩය (පිටු අංක 10 සිට 13 දක්වා), කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය (පිටු අංක 34 සිට 45 දක්වා) සහ මූල්‍ය දළ විශ්ලේෂණය (පිටු අංක 50 සිට 55 දක්වා) තුළ සඳහන් කර ඇත. මෙම වාර්තා සහ සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අනිවාර්ය අංගයක් වන අදාළ කටයුතුවල තත්ත්වයන් පිළිබිඹු කරයි.

"තිරසාර ආර්ථිකයක් සඳහා ගෝලීය සම්බන්ධතාවයේ මිත්‍රශීලී ගුවන් සේවා හවුල්කරුවා වීම" නම් වූ ගු.ගු.සේ.ස. හි දැක්ම සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කාර්යසාධන දර්ශක හරහා මෙහෙයුම් කාර්යසාධනය අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි.

4. මූල්‍ය ප්‍රකාශන

මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි පරිදි අත්සන් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිටු අංක 81 සිට 117 දක්වා පිටුවල දක්වා ඇත.

5. වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනස්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/LKASs) අනුකූලව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී. සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අනුගමනය කරන ලද සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති, පිටු අංක 90 සිට 101 දක්වා පිටුවල දක්වා ඇත. සමාලෝචිත වර්ෂය තුළ, සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවූ බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලබයි.

6. මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 7 දරන සමාගම් පනත මඟින් තහවුරු කර ඇති ආකාරයට සමාගමේ තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතු වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, සමාගම් පනත, 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ අනෙකුත් මූල්‍ය වාර්තාකරණ නියාමන අවශ්‍යතාවලට අනුකූලව, පිටු අංක 81 සිට 117 දක්වා පිටුවල ඇති මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

7. ස්වාධීන විගණකවරුන්, විගණක වාර්තාව සහ පාරිශ්‍රමික

2015 මැයි 15 වැනි දින පනවන ලද 19 වැනි සංශෝධනයට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තියේ, ඕනෑම ලිඛිත නීතියක යටතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති සියලුම රජයේ ව්‍යවසායන් පිළිබඳ විගණනය කිරීමට විගණකාධිපතිවරයාට බලය ඇත. මෙම උපදෙස්වලට අනුකූලව 2021 වර්ෂය සඳහා වූ ගු.ගු.සේ.ස. හි විගණනය විගණකාධිපති විසින් සිදු කරන ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව, මෙම වාර්තාවේ පිටු අංක 81 සිට 85 දක්වා පිටුවල ඉදිරිපත් කර ඇත. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණන ගාස්තුව රුපියල් 1,200,000 (එය 2020 වසරේ දී රුපියල් 1,793,000 ක් විය) වූ අතර, විගණනයට අදාළ සේවා සහ විගණන නොවන සේවා සඳහා විගණකවරුන්ට ගෙවන ලද වෙනත් ගාස්තු නොවීය. අධ්‍යක්ෂවරුන්ගේ දැනුම පරිදි, විගණකවරුන්ට සමාගමේ විගණකවරයෙක් වීම හැර සමාගම සමඟ වෙනත් කිසිදු සම්බන්ධතාවක් නැත.

8. අභ්‍යන්තර පාලනයන් සහ ප්‍රධාන අභ්‍යන්තර පාලන ක්‍රියාවලි

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා එහි වත්කම් ආරක්ෂා කර ගැනීමට සාධාරණ පියවර ගෙන ඇත. මෙම කාර්යය සඳහා, වසර පුරාවට සමාගම විසින් මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, වාර්තා පවත්වා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් ඵලදායී සහ පුළුල් අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කර ඇති අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

මෙය අභ්‍යන්තර සමාලෝචන, අභ්‍යන්තර විගණනය සහ අවශ්‍ය මූල්‍ය හා අනෙකුත් පාලන පද්ධතිගෙන් සමන්විත වේ. මෙහෙයුම් විධිමත් ලෙස පවත්වා ගනිමින් වත්කම් ආරක්ෂා කිරීම, වංචා හා වෙනත් අක්‍රමිකතා වැළැක්වීම සහ හඳුනා ගැනීම සහ හැකිතාක් දුරට වාර්තාවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය සුරක්ෂිත කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) විසින් සමාගමේ අභ්‍යන්තර විගණකවරුන්, රජයේ විගණකවරුන් සහ නියාමන බලධාරීන් විසින් හඳුනාගෙන ඇති අභ්‍යන්තර පාලන ගැටලු නිතිපතා සමාලෝචනය කරයි. අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව කළමනාකරණය විසින් තක්සේරු කෙරේ.

9. සමාගමේ ආදායම් ප්‍රකාශය සහ මූල්‍ය තත්ත්වය

9.1 ආදායම

2021 වර්ෂය සඳහා සමාගම විසින් ජනනය කරන ලද ආදායම රුපියල් බිලියන 7.9 ක් (එය 2020 වසරේ දී රුපියල් බිලියන 8.01 ක් විය) වන අතර මෙය පෙර වසරට සාපේක්ෂව 1.6% ක පමණ සුළු අඩුවීමකි. සමාගම් ආදායම පිළිබඳ විශ්ලේෂණයක් 102 වැනි පිටුවේ, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 5 හි අනාවරණය කර ඇත.

9.2 මෙහෙයුම් ප්‍රතිඵල

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමාගම විසින් රුපියල් බිලියන 3.8 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කරන ලදී. වසරකට පෙර වාර්තා වූ රුපියල් බිලියන 4.6 ක මෙහෙයුම් අලාභය සමඟ සසඳන විට, මෙය 18% ක වර්ධනයකි.

පෙර වසරේ දී ඉපයූ රුපියල් බිලියන 2.5 ක ශුද්ධ අලාභයට සාපේක්ෂව, සමාගම විසින් 2021 වසර සඳහා රුපියල් බිලියන 2.1 ක ශුද්ධ අලාභයක් වාර්තා කරන ලදී. මෙයට, ශුද්ධ විනිමය ලාභය සහ මෙහෙයුම් වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු විය.

9.3 සංචිත

කොටස් ප්‍රාග්ධනය, අනෙකුත් සංචිත සහ රඳවා ගත් ඉපයීම්වලින් සමාගමේ සංචිත සමන්විත වේ. වසර සඳහා ශුද්ධ අලාභ පැවතිය ද, ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය හේතුවෙන් සමාගමේ සංචිතවල වැඩිවීමක් වාර්තා විය. ඒ අනුව, පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 37 ට සාපේක්ෂව, 2021 දෙසැම්බර් 31 වන විට වාර්තා වූ මුළු හිමිකම් ප්‍රමාණය රුපියල් බිලියන 41 කි. සමාගම් හිමිකම්හි වලනය පිළිබඳ පිටු අංක 88 හි හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශයේ දැක්වේ.

9.4 ලාභාංශ

සමාලෝචිත වර්ෂය තුළ සමාගම ලාභාංශ ප්‍රකාශ කර නොමැත.

9.5 පරිත්‍යාග

2021 වර්ෂයේ දී, සමාගම විසින් රුපියල් 20,047,158 ක් (2019 වසරේදී: රුපියල් 410,290) වටිනා පරිත්‍යාග සිදු කරන ලදී.

9.6 ප්‍රාග්ධන වියදම

සමාගම 2020 වසරේ ප්‍රාග්ධන වියදම් ලෙස දරන ලද රුපියල් බිලියන 2.1 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ රුපියල් බිලියන 23.0 ක් දරන ලදී. දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් සඳහා වූ ආයෝජනය මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 11 සහ 12 හි දක්වා ඇත.

9.7 රජය වෙත දැක්වූ දායකත්වය

ගු.ගු.සේ.ස. විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකන් ගුවන් සේවය වැනි අනෙකුත් රජයේ අධිකාරීන්ට ගුවන්තොටුපළ තුළ අදාළ සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් අඛණ්ඩව සම්පාදනය කරන ලදී. මෙම ගනුදෙනු සහ ගිණුම් ශේෂයන් 116 පිටුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්හි 32 වන සටහනෙහි අදාළ පාර්ශ්ව ගනුදෙනු යටතේ අනාවරණය කර ඇත.

පසුගිය වසර 3 තුළ බදු ගෙවීම හරහා රජයට වක්‍ර දායකත්වයක් ලබා දීම පිළිබඳ පහත වගුවේ දක්වා ඇත.

වසර	ශ්‍රී ලංකා රු. බිලියන			
	ලාභාංශ	එකතු කළ අගය මත බදු	ආදායම් බදු	උපයන විට ගෙවීම
2019	500	1,543	6,579	112
2020	-	207	1,618	7
2021	-	117	15	6

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

9.8 ආයෝජන

වසර අවසානයේ දී ආයෝජන කළඹේ වටිනාකම රුපියල් බිලියන 2.3 කින් ක්ෂය වී ඇති අතර, එහි විස්තර පහත වගුවේ දක්වා ඇත.

	2021.12.31 දින වන විට (ශ්‍රී ලංකා රුපියල් මිලියන)	2020.12.31 දින වන විට (ශ්‍රී ලංකා රුපියල් මිලියන)
භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර	20	420
කෙටි කාලීන බැංකු තැන්පතු	41,515	41,933
ණයකරවල ආයෝජන	4,088	5,638
දිගු කාලීන බැංකු තැන්පතු	1,267	1,170
	46,890	49,161

9.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමාගමේ කොටස් ප්‍රාග්ධනය රුපියල් 100/- බැගින් වූ සාමාන්‍ය කොටස්වලින් සමන්විත වේ. 2021 දෙසැම්බර් 31 දිනට කොටස් හිමිකාරිත්වය පහත පරිදි විය.

	කොටස් ගණන	2020.12.31 දින වන විට (රු. මිලියන)
භාණ්ඩාගාර ලේකම්	200,000	20,000,000
ලේකම්- සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යාංශය	1	100
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්	1	100
	200,002	20,000,000

9.10 වාර්තා කිරීමේ කාලවකවානුවෙන් පසු සිදුවීම්

පිටු අංක 117 හි සඳහන් මූල්‍ය ප්‍රකාශනයෙහි 33 සටහනේ සඳහන් කර ඇති පරිදි, මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් හෝ හෙළිදරව් කිරීම සඳහා අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් මූල්‍ය තත්ත්වය ප්‍රකාශන දිනයෙන් පසුව සිදුවී නොමැත.

9.11 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ විමසීම් සිදු කොට සාමාන්‍ය පුරෝකථන ක්‍රියාවලිය අධ්‍යයනය කිරීමෙන් ද අනාගත අපේක්ෂාවන් සහ අවදානම් විභවයන් සලකා බැලීමෙන් ද පසු, අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා වන මෙහෙයුම්හි අඛණ්ඩ පැවැත්මට ප්‍රමාණවත් සම්පත් සහ ණය පහසුකම් ගු.ගු.සේ.ස. සතු බව අධ්‍යක්ෂවරු විසින් නිර්ණය කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සියලු මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කර ඇත.

9.12 අවිනිශ්චිතතාවන් සහ බැඳීම්

අවිනිශ්චිත වගකීම් පිළිබඳ විස්තර පිටු අංක 115 හි සඳහන් මූල්‍ය ප්‍රකාශනවල 29 සටහනෙහි අනාවරණය කර ඇත.

10. අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිළිබඳ තොරතුරු

10.1 අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපතිවරයා (79 වැනි වගන්තිය) සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් (82 වැනි වගන්තිය) පත් කිරීම ගු.ගු.සේ.ස. හි සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව සිදු කර ඇත.

10.2 2021 මූල්‍ය වර්ෂය අවසානයේ නිලතල දැරූ වත්මන් අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර

නම	තනතුර	පත්වීම් ලබාදුන් දිනය	ස්වාධීන	කමිටු සාමාජිකත්වය								
				AMC[1]	RMC[2]	HR&RC[3]	RGC[4]	SP&M[5]	FM[6]	DI&IT[7]	PM&M[8]	T2 Com[9]
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඒ. චන්ද්‍රසිරි මහතා RWP USP VSV ndc psc	සභාපති	2019.12.12	ඔව්	නැත	නැත	නැත	ඔව්	ඔව්	ඔව්	නැත	නැත	ඔව්
ආර්. සූරියආරච්චි මහතා	නියෝජ්‍ය සභාපති	2019.12.06	ඔව්	නැත	නැත	ඔව්	ඔව්	ඔව්	නැත	නැත	නැත	නැත
ඒ. එස්. සී. වරුෂහෙන්-නැදිගේ මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	2019.12.12	ඔව්	නැත	නැත	ඔව්	ඔව්	ඔව්	නැත	ඔව්	ඔව්	ඔව්
එස්. එන්. සුමනසේකර මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	2019.12.12	ඔව්	නැත	නැත	නැත	ඔව්	ඔව්	නැත	නැත	නැත	ඔව්
ඉංජිනේරු එස්. එම්. ඒ. යූ. එස්. මංචනායක මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	2019.12.12	ඔව්	ඔව්	ඔව්	නැත	ඔව්	ඔව්	ඔව්	ඔව්	ඔව්	ඔව්
සී. පී. විතාරන මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	2019.12.31	ඔව්	නැත	නැත	නැත	ඔව්	නැත	නැත	නැත	නැත	නැත
ඩී. ඒ. ද ලිවේරා මහත්මිය	විධායක නොවන අධ්‍යක්ෂ	2019.12.31	ඔව්	නැත	ඔව්	නැත	ඔව්	ඔව්	ඔව්	ඔව්	නැත	ඔව්
ආර්. ඒ. පී. විජේරත්නසේකර මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	2019.12.31	ඔව්	නැත	ඔව්	ඔව්	නැත	නැත	නැත	නැත	ඔව්	නැත
ඩබ්ලිව්. එම්. ගිහාන් රශාන්ත මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	2021.02.05	ඔව්	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
ජී. ඒ. අජිත් ප්‍රියන්ත මහතා	විධායක නොවන අධ්‍යක්ෂ / භාණ්ඩාගාර නියෝජිත	2021.06.11	නැත	ඔව්	නැත	නැත	නැත	නැත	නැත	ඔව්	නැත	නැත
ඩී. ඒ. පී. වීරරත්න මහතා, ජනාධිපති නීතිඥ	විධායක නොවන අධ්‍යක්ෂ	2020.03.02	ඔව්	ඔව්	ඔව්	නැත	ඔව්	ඔව්	ඔව්	ඔව්	ඔව්	ඔව්
ඒ. එච්. එස්. ගුණවර්ධන මහතා	ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ නිරීක්ෂක	2019.12.31	ඔව්	නැත	නැත	ඔව්	නැත	නැත	නැත	නැත	නැත	නැත

1. විගණන සහ කළමනාකරණ අනුකමිටුව
2. අවදානම් කළමනාකරණ අනුකමිටුව
3. මානව සම්පත් සහ පාරිශ්‍රමික අනුකමිටුව
4. ආදායම් උත්පාදන අනුකමිටුව
5. උපායමාර්ගික සැලසුම් සහ කළමනාකරණ අනුකමිටුව
6. මූල්‍ය කළමනාකරණ අනුකමිටුව
7. ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අනුකමිටුව
8. ව්‍යාපෘති අධීක්ෂණ සහ කළමනාකරණ අනුකමිටුව
9. දෙවන පර්යන්තයෙහි (T2) වාණිජ සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා වූ අනුකමිටුව

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

10.3 සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

10.3 2021 වර්ෂය තුළ ඉල්ලා අස්වූ අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර

නම	තනතුර	පත්වීම් ලබාදුන් දිනය	ලියාපදිංචි දිනය
ආර්. එම්. ඒ රත්නායක	අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත	2020.01.16	2021.04.27

10.4 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ සහභාගිත්වය

2021 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ කමිටු රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පහත පරිදි වේ.

නම	තනතුර	අධ්‍යක්ෂ මණ්ඩලය	කමිටු සාමාජිකත්වය								
			AMC[1]	RMC[2]	HR&RC[3]	RGC[4]	SP&M[5]	FM[6]	DI&IT[7]	PM&M[8]	T2 Com[9]
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඒ. චන්දසිරි මහතා RWP USP VSV ndc psc	සභාපති	13/13	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	09රැ09	07රැ08	07රැ07	අදාළ නොවේ	අදාළ නොවේ	4රැ12
ආර්. සූරියආරච්චි මහතා	නියෝජ්‍ය සභාපති	13/13	අදාළ නොවේ	අදාළ නොවේ	02/02	06/09	02/08	00/07	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
ඒ. එස්. සී. වරුෂහෙන්නැදිගේ මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	13/13	අදාළ නොවේ	අදාළ නොවේ	02/02	08/09	07/08	00/07	06රැ06	අදාළ නොවේ	7/12
එස්. එන්. සුමනසේකර මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	13/13	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	08/09	07/08	00/07	අදාළ නොවේ	අදාළ නොවේ	5/12
ඉංජිනේරු එස්. එම්. ඒ. යූ. එස්. මංචනායක මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	13/13	06රැ06	09රැ10	අදාළ නොවේ	06/09	06/08	04/07	06/06	01/01	3/12
සී. පී. විතාරන මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	02/13	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	00රැ09	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
ඩී. ඒ. ද ලිවේරා මහත්මිය	විධායක නොවන අධ්‍යක්ෂ	13/13	අදාළ නොවේ	10/10	අදාළ නොවේ	08/09	08/08	05/07	06/06	00/01	12/12
ආර්. ඒ. පී. විජේරත්නසේකර මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	13/13	අදාළ නොවේ	05/10	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	00/01	අදාළ නොවේ
ඩබ්ලිව්. එම්. ගිහාන් රශාන්ත මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	12/13	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
ආර්. එම්. ඒ. රත්නායක මහතා (2021 අප්‍රේල් 27 දින විශ්‍රාම ලත්)	විධායක නොවන අධ්‍යක්ෂ / භාණ්ඩාගාර නියෝජිත	02/13	01/06	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
ජී. ඒ. අජිත් ප්‍රියන්ත මහතා (2021 ජූනි 11 දින පත්වීම් ලත්)	විධායක නොවන අධ්‍යක්ෂ / භාණ්ඩාගාර නියෝජිත	08/13	05/06	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	05/06	අදාළ නොවේ	අදාළ නොවේ
ඩී. ඒ. පී. වීරරත්න මහතා, ජනාධිපති නීතිඥ	විධායක නොවන අධ්‍යක්ෂ	13/13	04/06	අදාළ නොවේ	00/02	01/09	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
ඒ. එච්. එස්. ගුණවර්ධන මහතා	ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ නිරීක්ෂක	13/13	අදාළ නොවේ	අදාළ නොවේ	02/02	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ

10.5 කොටස් හෝ ණයකර ගනුදෙනු කරනු ලබන අධ්‍යක්ෂවරුන් පිළිබඳ අනාවරණය

කිසිදු අධ්‍යක්ෂවරයෙකු කොටස් හෝ ණයකර හිමිකම් දරන්නේ නැත.

10.6 ගිවිසුම් සහ යෝජිත ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ව්‍යාපාරයට සම්බන්ධ ගිවිසුම් හෝ යෝජිත ගිවිසුම් පිළිබඳව කිසිදු අධ්‍යක්ෂවරයකු සෘජුව හෝ වක්‍රව උනන්දුවක් දක්වා නොමැත.

10.7 අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂික සහ අනෙකුත් ප්‍රතිලාභ

සමාගම විසින් 2021 වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ දීමනා ලෙස, රුපියල් මිලියන 11.3 ක් ගෙවා ඇත (2020 - රුපියල් මිලියන 6.6). වසර අවසානයේ දී විධායක අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සඳහා පාරිතෝෂික වශයෙන් රුපියල් මිලියන 2.2 ක් ගෙවා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ දීමනා, සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල්, ප්‍රසාද දීමනා, විනෝදාස්වාද වියදම් ප්‍රතිපූරණය කිරීම, දුරකථන සහ අනෙකුත් දීමනා වැනි සියලුම මූල්‍ය ප්‍රතිලාභ මේ සඳහා ඇතුළත් විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීම සඳහා ගමන් වියදම් සහ අධ්‍යක්ෂ ගාස්තු වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට වර්ෂය තුළ දී රුපියල් මිලියන 9.1 ක මුදලක් ගෙවන ලදී.

11. ආයතනික පාලනය

ඵලදායී ආයතනික පාලන රාමුවක් පවත්වා ගෙන යාමට සහ ආයතනික පාලනයේ හොඳම පිළිවෙත් සහතික කිරීම සඳහා අවශ්‍ය පද්ධති මෙන්ම ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීමටත් ඒවා ඵලදායීව ක්‍රියාත්මක කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටියිග

12. ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය ස්වකීය දැනීමේ හැටියට සමාගම විසින් ගෙවිය යුතු සියලු බදු, ගාස්තු සහ අය කිරීම්, සමාගමේ සේවකයින් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලු දායක මුදල්, අයකිරීම සහ බදු මෙන්ම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට සමාගම විසින් ගෙවිය යුතු වෙනත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් කර ඇති බව හෝ ඒ වෙනුවෙන් අදාළ ප්‍රතිපාදන සලසා ඇති බව සහතික කරයි.

13. නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව, සමාගම රටේ නීති සහ රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නොමැත.

14. වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2022 ජුනි 30 වන දින පෙ.ව. 10:00 ට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ දී පවත්වනු ලබයි.

15. ස්තුතිය

අභියෝග මධ්‍යයේ සමාගමේ තවත් මූල්‍ය වර්ෂයක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් කළමනාකාරීත්ව කණ්ඩායම වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය ස්තුතිය පුද කරනු ලබයි. පසුකාලීන කොවිඩ් වසංගත තත්ත්වය සහ ලොව පුරා සංචාරක සීමා කිරීම් හේතුවෙන්, ගුවන් සේවා අංශය සඳහා මෙම වසර අභියෝගාත්මක වසරක් විය. සමාගමේ පාර්ශ්වකරුවා සහ නියාමකයා වශයෙන් සමාගමේ කටයුතු සඳහා අඛණ්ඩව සහය වූ සංචාරක අමාත්‍යාංශයට සහ අනෙකුත් ආයතනවලට අපගේ විශේෂ කෘතඥතාව පළකර සිටිමු.

තවද, අප කෙරෙහි තබා ඇති අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන් අපගේ ගනුදෙනුකරුවන් ඇතුළු සමාගමේ අඛණ්ඩ මෙහෙයුම් සඳහා සම්බන්ධ වූ සහ දායක වූ සියලුම පාර්ශ්වකරුවන්ට අපගේ අවංක කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමු. අවසාන වශයෙන්, මෙම අනපේක්ෂිත, අභියෝගාත්මක වසර තුළ ඔවුන්ගේ දීර්ඝ කාලීන කැපවීම, අඛණ්ඩතාව සහ වෙහෙස මහන්සි වී කටයුතු කිරීම වෙනුවෙන් සියලුම ගු.ගු.සේ.ස. කාර්ය මණ්ඩලයට අපගේ ස්තුතිය පළ කර සිටිමු.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි



මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඒ. චන්ද්‍රසිරි මහතා **RWP USP VSV ndc psc**
සභාපතිතුමා

2022 ජුනි මස 10 වන දා

විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව (AMC)

අධ්‍යක්ෂ මණ්ඩලයට (මණ්ඩලය) එහි අධීක්ෂණ වගකීම් ඉටු කිරීමේදී සහය වීම, විගණන සහ කළමනාකරණ කමිටුවෙහි මූලික කාර්යභාරයයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන සහ කළමනාකරණ කමිටුව පත් කරනු ලබන අතර, එහි වගකීම් දරයි.

විගණන හා කළමනාකරණ කමිටුවේ (AMC) සැකසුම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණන හා කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කමිටුවේ නියමයන්ට (TOR) අනුව කමිටු ක්‍රියාදාමයන් සිදු කරනු ලබන, ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් (03) සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ සැකසුම පහත පරිදි වේ.

කමිටු සාමාජිකයින්	සාමාජිකත්වය ආරම්භ කළ කාලය	තනතුර
1. ජී. ඒ. ඒ. ප්‍රියන්ත මහතා භාණ්ඩාගාර නියෝජිත	2021.06.29	සභාපති
2. ඉංජිනේරු එස්. එම්. ඒ. යූ. එස්. මංචනායක මහතා	2019.12.12	සාමාජික
3. ජනාධිපති නීතිඥ ඩී. ඒ. පී. වීරරත්න මහතා	2020.10.23	සාමාජික
4. ආර්. එම්. ඒ. රත්නායක මහතා	2020.01.16 සහ 2021.04.27 දින ඉල්ලා අස් විය.	සභාපති

රැස්වීම්

2021 වර්ෂය තුළදී විගණන සහ කළමනාකරණ කමිටුව හි රැස්වීම් අවස්ථා හයක් (06) පැවැත්විණ. විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත දැක්වේ.

අධ්‍යක්ෂතුමාගේ නම	රැස්වීම් සඳහා සහභාගි වූ වාර ගණන
ජී. ඒ. ඒ. ප්‍රියන්ත මහතා	05
ඉංජිනේරු එස්. එම්. ඒ. යූ. එස්. මංචනායක මහතා	06
ජනාධිපති නීතිඥ ඩී. ඒ. පී. වීරරත්න මහතා	04
ආර්. එම්. ඒ. රත්නායක මහතා	01

විගණන සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල ක්‍රියාපටිපාටිය, එහි ලේකම් ලෙස ක්‍රියා කරනු ලබන සමාගම් ලේකම් විසින් වාර්තා කරන ලද අතර, රැස්වීම්වල වාර්තා ඊළඟ ප්‍රායෝගික රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දෙන ලදී.

මෙහෙවර සහ භූමිකාව

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් එහි වගකීම් ඉටු කිරීමේදී, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ මඟින් සපයන විධාන පිළිගෙන ඇත.

කොන්දේසි පිළිබඳ නියමයන් (TOR)

මූල්‍ය වර්ෂය තුළදී, විගණන සහ කළමනාකරණ කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධතිය සහ අභ්‍යන්තර සහ බාහිර විගණනයට අදාළ කාර්යයන් පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය සිදු කිරීම සඳහා මණ්ඩලයට සහය විය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කොන්දේසි පිළිබඳ නියමයන් ප්‍රකාරව, තම වගකීම් ඉටු කිරීමේදී පහත සඳහන් අරමුණු කෙරෙහි විගණන සහ කළමනාකරණ කමිටුව මඟින් අවධානය යොමු කරනු ලබයි.

1. අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය සහ වගකීම් තීරණය කිරීම.
2. වාර්ෂික විගණන සැලැස්ම සහ කාර්ය වැඩසටහන සමාලෝචනය කර අනුමත කිරීම. විගණකාධිපති (බාහිර විගණක) සමඟ සාකච්ඡා කර අභ්‍යන්තර විගණකවරයා විසින් වාර්ෂික විගණන සැලැස්ම සකස් කළ යුතුය.
3. ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කර ඇගයීම.
4. බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වී, නීතිපතිතුමාගේ කළමනාකරණ ලිපිය සහ ඒ සඳහා කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය පසු විපරම් කිරීම.
5. අයවැය සමාලෝචන වාර්තා ඇතුළු මූලික අභ්‍යන්තර මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම.
6. ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුකූල වීම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම.
7. අභ්‍යන්තර විගණකවරුන් සහ බාහිර විගණකවරුන් සමඟ කටයුතු කිරීම.
8. ජ්‍යේෂ්ඨ කළමනාකාරණ කාර්ය මණ්ඩලය, ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නීති රීති සහ රෙගුලාසි පිළිබඳව දැනුවත් යැයි සහතික කර ගැනීම සහ ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සමාලෝචනය කිරීම.
9. අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්තාව/ විමසීම් නිතිපතා සමාලෝචනය කිරීම සහ පෙන්වා දෙන ලද අඩුපාඩු සම්බන්ධයෙන් එක් එක් අංශ ප්‍රධානීන් විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම.
10. බාහිර විගණකවරුන්ගේ වාර්තාව/ විමසීම් සමාලෝචනය කර, පුනරාවර්තන වැළැක්වීම උදෙසා අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම.
11. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය කිරීම සහ ඒවා පිළිබඳ ක්‍රියාමාර්ග/ සහතික කිරීම් වරින් වර අධීක්ෂණය කිරීම.
12. අභ්‍යන්තර විගණකවරුන්ගේ අඛණ්ඩ අපක්ෂපාතීත්වය සහ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය සමාලෝචනය කිරීම.
13. අභ්‍යන්තර/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සහ කෝප් කමිටුවේ නිර්දේශ සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහය ලබා දීම.
14. ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට සහ ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීම.
15. අවම වශයෙන් මාස තුනකට වරක් රැස්වී එහි නිර්දේශ, නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සැලසීම සඳහා රැස්වීමේ වාර්තාව සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දීම.

මූල්‍ය වාර්තාකරණය

වාර්තාකරණ කාලසීමාව තුළ පාර්ශ්වකරුවන්ට සපයනු ලබන තොරතුරුවල විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ කාර්යසාධනය පිළිබඳ කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. ගිණුම් පොත් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, සත්‍ය සහ සාධාරණ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ

වගකීම ඉටු කිරීමට කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහය විය. සියලුම ගනුදෙනු නිවැරදිව සහ සම්පූර්ණයෙන් ගිණුම් පොත්වල සටහන් කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා, අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ ක්‍රියා පටිපාටිවල ප්‍රමාණවත් බව සහ කාර්යසාධනය, කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී සිදු කරන ලද සැලකිය යුතු උපකල්පන සහ විනිශ්චයන් ඇතුළත් ආධාරක තොරතුරු සමඟින්, මාසික පදනම මත සකස් කරන ලද අතුරු මූල්‍ය ප්‍රකාශ කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. එමෙන්ම, කාරක සභාව විසින්, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශ කෙටුම්පත්, 2021 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර සමාලෝචනය කරන ලදී.

පවතින අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියා පටිපාටි තක්සේරු කිරීමෙන් පසු, සමාගමේ මූල්‍ය තත්ත්වය මනාව නිරීක්ෂණය කර නිවැරදිව වාර්තා කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා ප්‍රමාණවත් පාලන සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක බව කමිටුවේ දැක්ම වේ.

අභ්‍යන්තර පාලනය

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ කාර්යසාධනය තක්සේරු කරන ලදී. විවිධ අවදානම් අවම කිරීම සහ නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා, මෙම ක්‍රියාවලිය මඟින් අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව සහ කාර්යසාධනය තක්සේරු කරන ලදී. ගු.ගු.සේ.ස හි අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික කිරීමේ ප්‍රධානියාගේ නිර්දේශ මත කළමනාකාරීත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවට විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සහතික කරනු ලබයි. අභ්‍යන්තර පාලන රාමුවේ පදනම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට එහි කාර්යයන් පවත්වා ගෙන යාමට සහ අවශ්‍ය පියවර ගැනීමට සහය ලබා දේ.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන (IA) ක්‍රියාවලිය ස්වාධීන සහ අපක්ෂපාතී තක්සේරු කිරීමේ කාර්යයක් වන අතර, එය ගු.ගු.සේ.ස සඳහා එහි සමස්ත පාලන රාමුව වැඩිදියුණු කිරීමට සහය වේ. ගු.ගු.සේ.ස හි අවදානම් කළමනාකරණය, පාලනය සහ පාලන ක්‍රියාවලි හි සැලසුම් සහ කාර්යසාධනය ඇගයීම සහ වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමානුකූල සහ විනයානුකූල ප්‍රවේශයක් පවත්වා ගැනීමට අභ්‍යන්තර විගණන කාර්යය දායක වේ.

අභ්‍යන්තර විගණන ක්‍රියාකාරිත්වය, ගු.ගු.සේ.ස. හි මූල්‍ය සහ ගිණුම්කරණ මෙහෙයුම් සත්‍ය වශයෙන්ම සිදු කිරීම සඳහා වගකිව යුතු අයගේ මෙන්ම, යෝජනා ක්‍රම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියැලී සිටින අයගේ පාලනයෙන් ස්වාධීන වන බවට හෝ ගු.ගු.සේ.ස විසින් සිදු කරනු ලබන කාර්යය සහ සේවාවන් ක්‍රියාත්මක කිරීමේ දී යහපත් ආයතනික පාලන පිළිවෙත් වලට අනුකූලව සහ අපක්ෂපාතීව, ප්‍රවීණත්වය සහ නිසි වෘත්තීය රැකවරණයක් සහිතව සිදු කරන බවට විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සහතික විය. විගණන සහ කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික කිරීමේ අංශයේ ක්‍රියාකාරකම්වල විෂය පථය, සම්පත්, ප්‍රමාණය සහ කාර්යසාධනය අධීක්ෂණය කර සමාලෝචනය කරන ලදී.

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් 2022 වර්ෂය සඳහා වන වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර, තක්සේරු කර අනුමත කරන ලදී. එමෙන්ම විගණන සහ කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණනයේ සැලකිය යුතු විගණන ප්‍රතිඵල සහ නිර්දේශ සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය කර අධීක්ෂණය කරන ලදී.

බාහිර විගණනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව අනුව, ගු.ගු.සේ.ස. හි බාහිර විගණනය සිදු කිරීමට විගණකාධිපතිවරයාට බලය පවරා ඇත. ඒ අනුව, විගණකාධිපතිවරයා, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ බාහිර විගණකවරයා ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සමඟ මූල්‍ය ප්‍රකාශ වල අනුකූලතාව පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ වගකීම දරනු ලබන බාහිර විගණකවරයා සමඟ විගණන සහ කළමනාකරණ කමිටුව සමීපව කටයුතු කරයි.

සියලුම විගණන සහ කළමනාකරණ කමිටුවේ සියලුම රැස්වීම් සඳහා ස්වාධීන නිරීක්ෂකයෙකු ලෙස බාහිර විගණකවරයාට ආරාධනා කරන ලද අතර, එමඟින් කමිටුවට ඔවුන්ගේ අදහස් දැරීමට සහ නියාමන සහ අනුකූලතා අවශ්‍යතා සහ පාලන හෝ ක්‍රියා පටිපාටි දුර්වලතා තිබේ නම් ඒවා පිළිබඳ ඔවුන්ගේ අවබෝධය සාකච්ඡා කිරීමට හැකි විය.

යහපාලනය

PED චක්‍රලේඛ වැනි නියාමන අවශ්‍යතා අනුගමනය කිරීමේ වැදගත්කම සහ අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කිරීම මඟින් ගු.ගු.සේ.ස. හි යහපාලනය, ක්‍රියාශීලී සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටුව මඟින් ඉමහත් දායකත්වයක් ලබා දිය හැකිය.

නිගමනය


මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන්, අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ කාර්යසාධනය, බාහිර විගණනය සහ නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා, ගු.ගු.සේ.ස. හි ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඔවුන්ගේ බැඳීම් සහ වගකීම් ඉටු කිරීමට, අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීම සහ මඟපෙන්වීම සමඟ ගු.ගු.සේ.ස හි ව්‍යාපාරවල ස්වාධීන අධීක්ෂණය සමතුලිත කිරීමට විගණන සහ කළමනාකරණ කමිටුව කටයුතු කර ඇත. විගණන සහ කළමනාකරණ කමිටුව වසර තුළ සිය රාජකාරී සාර්ථකව සහ උසස් ප්‍රමිතියකින් ඉටු කර ඇති බවට විශ්වාසය තැබීමට හේතු රාශියක් ඇති බවත්, එය සමාගමේ වටිනාකම් ශක්තිමත් කිරීමට උපකාරී වන බවත් කමිටුව විශ්වාස කරයි.



ජී. ඒ. ඒ. ප්‍රියන්ත මහතා
සභාපති - විගණන සහ කළමනාකරණ කමිටුව (AMC)
2022 ජූනි 10 වෙනිදා



විශිෂ්ටම තාක්ෂණය යොදා ගනිමින් සංචාරක කටයුතු පහසු කරලීමට සහය වීම



කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය



2021 මූල්‍ය වර්ෂය කෙටියෙන්

සංචාරක සීමා කිරීම්, දේශසීමා සඳහා සීමා පැනවීම, වසා දැමීම් සහ වෛරසය පැතිරීමේ බිය හේතුවෙන්, ගුවන් ගමන් සහ ජාත්‍යන්තර සංචාර සඳහා ඇති ඉල්ලුම ලෝකයේ දකුණු දෙසට යොමු වූ බැවින්, පෙර වසරේ සිට පැවති තත්ත්වයන්ගෙන් මතු වූ අඛණ්ඩ අභියෝගවලට මුහුණ දීමේ අපගේ ශක්තිය 2021 මූල්‍ය වර්ෂය තුළ තවදුරටත් පරීක්ෂාවට ලක්විය. මේ නිසා සාම්ප්‍රදායික ගුවන්තොටුපළ ආදායම් මාර්ගවලට පෙර මෙන් ආදායම් උපයා ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත්, වසංගතයෙන් අපේ රට සාපේක්ෂව යථා තත්ත්වයට පත්වීම අප බලාපොරොත්තු වූවාට වඩා කලින් සිදු වූ අතර 2021 වසර සිව්වන කාර්තුවේ දී රුපියල් මිලියන 574 ක ආන්තික මෙහෙයුම් ලාභයක් උපයා ගැනීමට අපට හැකි විය. 2021 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 1.1 ක ශුද්ධ අලාභයක් වාර්තා කළ ද එය පෙර වසරේ (2020 වසරේ) දී වාර්තා කළ රුපියල් බිලියන 2.1 ක ශුද්ධ අලාභය හා සසඳන විට සැලකිය යුතු වර්ධනයක් බව පෙනී යයි.

දිගු කාලීන පැවැත්ම සඳහා මෙහෙයුම් සහ ව්‍යාපාරික අඛණ්ඩතාව සහතික කිරීමට සමාගම දරන උත්සාහය මෙම සමාලෝචනයේ දී විස්තර කොට ඇත.

2021 මූල්‍ය වර්ෂයේ ගු.ගු.සේ.ස. හි ප්‍රධාන කාර්යසාධන සුවිශේෂතා

මගී සංචලන (ජාත්‍යන්තර)
37% ↓
1,505,479

ගුවන් යානා සංචලන (ජාත්‍යන්තර)
1% ↑
21,204

පියාසර සංචලන
43% ↓
9,339

ගුවන් භාණ්ඩ (මෙ.ටො.) (ජාත්‍යන්තර)
1% ↑
241,506



කර්මාන්තයේ දළ විශ්ලේෂණය

ගෝලීය සන්දර්භය

මෑතක දී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) විසින් සිදු කරන ලද සිවිල් ගුවන් සේවා මත කොවිඩ්-19 ආර්ථික බලපෑම් විශ්ලේෂණයට අනුව, ගෝලීය ගුවන් මගී ගමනාගමනය 2021 වසරේ දී ලොව පුරා මගීන් බිලියන 2.3 ක් වූ අතර එය පූර්ව වසංගත (2019) මට්ටම්වලට වඩා 49% කින් යථා තත්ත්වයට පත්වීමක් පෙන්වූව ද, 2020 වසරේ දී 60% ක අඩුවීමක් දක්නට ලැබුණි. එම කාලසීමාව තුළ දී, ගුවන් සේවා ආසන ධාරිතාව ගෝලීය වශයෙන් 20% කින් වැඩි වූ අතර, මගී ඉල්ලුමේ ද වැඩි වීමක් දක්නට ලැබේ. 2019 වසරේ පැවති 82% ක් වූ ගෝලීය මගී පැටවුම් සාධකය, 2021 වසරේ දී 68% ක් දක්වා සංකෝචනය වූ අතර ලොව පුරා ගුවන් සමාගම්වලට 2020 වසරේ දී හිමි වූ ඇමරිකානු ඩොලර් බිලියන 372 ක ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 324 ක් දක්වා අඩු විය.

2021 පළමු කාර්තුවේ කොවිඩ්-19 ආසාදන සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන්, ගෝලීය ගුවන් ගමනාගමන ප්‍රතිසාධන අනුපාතය මන්දගාමී විය. දෙවන හා තුන්වන කාර්තුවේ දී, එන්නත් කිරීමේ අනුපාත වර්ධනය වීම සහ ඉහළ සංචාර පවතින කාලය තුළ ලෝකයේ ප්‍රදේශ කිහිපයක ගමන් සීමා ලිහිල් කිරීම හේතුවෙන්, තත්ත්වය සුළු වශයෙන් ස්ථාවර විය. කෙසේ වෙතත්, සිව්වන කාර්තුවේ දී ඔමික්‍රෝන් ප්‍රභේදය මතුවීමත් සමඟ, මෙම ඉහළ යාමේ ප්‍රවණතාවය අනපේක්ෂිතව නතර විය.

ඔමික්‍රෝන් නිසාවෙන් ඇති වූ බාධා නොතකා, එන්නත් කිරීම තුළින් පැතිරයන වසංගතය පාලනය කිරීමට ගත් ප්‍රයත්නයන් හේතුවෙන් තවත් වෙළඳපොළවල් නැවත විවෘත වූ බැවින්, වසර අවසානය දක්වා ගුවන් ගමන් නොනවත්වා පැවතුණි. 2020 වසරේ දී ගුවන් සේවා කර්මාන්තය පුරා මගී කිලෝමීටරයකට ආදායම් (RPKs) ප්‍රතිශතය 34.2% වූ අතර 2021 වසරේ දී එය 41.6% දක්වා වැඩි වී ඇත. කෙසේ වෙතත් 2019 දෙසැම්බර් මාසයේ පූර්ව කොවිඩ් කාලය සමඟ සසඳන විට තවමත් එය 45.1% ක අඩු වීමකි.

ශ්‍රී ලංකාවේ තත්ත්වය

ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ දී 3.6% කින් පහත වැටීම සමඟ සසඳන විට, 2021 වසරේ දී 3.7% ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. 2020 ට සාපේක්ෂව, 2021 වසරේ දී අපගේ ගුවන්තොටුපළවල ජාත්‍යන්තර මගී සංචලනය සහ අප ගුවන් කලාපය හරහා සිදු වූ පියාසර සංචලන පිළිවෙළින් 37% සහ 43% කින් අඩු වූ අතර ජාත්‍යන්තර ගුවන් යානා සංචලනයන් සහ ගුවන් භාණ්ඩ සංචලනයන් එලෙසම පැවතුණි.

සාර්ව ආර්ථික සාධකවල බලපෑම

බොහෝ සාර්ව ආර්ථික සාධක 2021 මූල්‍ය වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළ සහ ගුවන් සේවා මෙහෙයුම් කෙරෙහි ඍණාත්මක ලෙස බලපෑවේය. ප්‍රධාන සාධක වනුයේ:

- **ජාත්‍යන්තර ගුවන් ගමන් සහ සංචාරක කටයුතු සඳහා ඇති ඉල්ලුම**

ගුවන්තොටුපළ ව්‍යාපාර මූලික වශයෙන් ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා ඇති ඉල්ලුම මත පදනම් වේ. එබැවින්, ගුවන් ගමන් සඳහා ඇති ඉල්ලුම මත සියලු ගුවන් ආදායම් සහ ගුවන් නොවන ආදායම් බොහොමයක් රඳා පවතී. ගුවන්තොටුපළ භාවිත කරන මගීන්ගෙන් සැලකිය යුතු කොටසක් සංචාරකයින් (25% - 40%) වේ.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය
වසංගත තත්ත්වය හේතුවෙන්, ලොව පුරා ගුවන් ගමන් විශාල ලෙස අඩු වීම ගෝලීය සහ දේශීය ගුවන්තොටුපළ හා ගුවන් සේවා කර්මාන්තයට සමස්තයක් ලෙස බලපෑවේය.

✈ විනිමය අනුපාත උච්චාවචනය

ගු.ගු.සේ.ස. ඉපයීම්වලින් 50% ක් පමණ විදේශ මුදල් වේ. විදේශ මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ආදායම සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. මෙයට විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ආයෝජන සහ ඒවායේ පොලී ඉපයීම් ඇතුළත් වේ. එමෙන්ම රුපියල අවප්‍රමාණය වීම විදේශ ණය ප්‍රමාණයන්වල වටිනාකම සහ ණය වාරික ගෙවීමට දැඩි ලෙස බලපෑවේය. කෙසේ වෙතත්, ගු.ගු.සේ.ස. හි ණයවලින් වැඩි ප්‍රමාණයක් ජපන් යෙන් (JPY) වීමත් ජපන් යෙන් වසර තුළ විශාල වශයෙන් උච්චාවචනය නොවීමත් නිසා එහි බලපෑම අවම විය.

✈ සේවා නියුක්තිය

ආර්ථිකයේ සේවා නියුක්ති මට්ටම් සෘජුවම ජාත්‍යන්තර සංචාර කෙරෙහි බලපායි. වසංගත ව්‍යාප්තිය ආදායම් ඉපයීම් හා සේවා නියුක්තිට ඇති කළ බලපෑම හේතුවෙන්, බොහෝ සංචාරකයින් ඔවුන්ගේ විදේශ ගමන් සීමා කළහ. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතන සිය කාර්ය මණ්ඩලය ලබා දෙන විදේශ පුහුණු වීම්, ව්‍යාපාරික සම්මන්ත්‍රණ හා සම්මේලනවලට සහභාගී වීම් අවලංගු කළ අතර, ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ට ද සංචරණය සීමා පැනවිණි. මෙය ගුවන් ගමන් සහ ගුවන්තොටුපළ ආදායම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය.

✈ පොලී අනුපාත

වසර පුරාවටම පොලී අනුපාත සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවති අතර, වසර තුළ ගු.ගු.සේ.ස. විසින් නව ණය ලබා නොගත් නිසා මෙම ණය අනුපාතවලට නිරාවරණය නොවීය. එමෙන්ම, 2021 වසර තුළ පොලී අනුපාතවල අස්ථාවරත්වය හේතුවෙන් සමාගමේ පොලී ආදායමට බලපෑමක් සිදු නොවීය.

ගතික ව්‍යාපාරික පරිසරයට ඔරොත්තු දෙමින් ස්ථිරව පැවතීම

ගු.ගු.සේ.ස. විසින් ප්‍රත්‍යාස්ථව සහ නොනැසී පැවතීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලදී. ගු.ගු.සේ.ස. විසින් වර්ෂය පුරා පැවති අහිතකර වෙළඳපල තත්ත්වයන් යටතේ, පවතින ව්‍යාපාරික අවස්ථා ප්‍රශස්ත ලෙස යොදා ගන්නා ලදී.

ගුවන් ගමන් ජාලය ප්‍රතිස්ථාපිතකරණය

කොවිඩ්-19 ට පෙර, කාලසටහන් ගත ගුවන් සේවා 30 කට අධික සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළ හා සම්බන්ධ වූ අතර ඇතැම් ගුවන් සේවා 2020 වසරේ දී සම්පූර්ණයෙන් පියාසර ලැයිස්තුවෙන් ඉවත් විය. 2021 වසරේ දී, බොහෝ ගුවන් සමාගම් විසින් සතියකට අවම වාර සංඛ්‍යාවක් ක්‍රියාත්මක වීමට නියමිත ගුවන් ගමන් නැවත ආරම්භ කිරීම සහ එය ක්‍රමානුකූලව වැඩි කරන බව තහවුරු කළේය. ඉන්දිගෝ, සුවිස් ඉන්ටනැෂනල්, විස්තාරා, සහ ලොට් පෝලිෂ් (LOT Polish) හතරවන කාර්තුවේ දී නැවත මෙහෙයුම් ආරම්භ කරන ලදී. තවද, නව ගුවන් සේවා දෙකක් බ.ජා.ගු. සිට/ දක්වා මෙහෙයුම් ආරම්භ කරන ලදී. එයාර් ප්‍රාන්ස් විසින් මාලේ හරහා පැරිස් දක්වා කොළඹට යන මාර්ගයේ මෙහෙයුම් ආරම්භ කළ අතර, කසකස්තාන ධජය යටතේ එයාර් අස්ටානා ගුවන් යානා 2021 දෙසැම්බර් මාසයේ සිට බ.ජා.ගු. වෙත නියමිත මෙහෙයුම් ආරම්භ කළේය.

අපගේ ප්‍රධාන ජාත්‍යන්තර ගුවන් දොරටු විවර කළ දා පටන් විශේෂ අයිතිවාසිකම් භුක්ති විඳි උපායමාර්ගික ගුවන් සේවා හවුල්කරුවන් නැවත ගෙන්වා ගැනීමෙන්, රටෙහි නොපසුබට උත්සාහය මත, ගුවන් ගමන් ජාලය නැවත ස්ථාපිත කරන ලදී. ගු.ගු.සේ.ස. විසින් ඩුබායිහි පැවති 'එයාර් සර්විස් වර්ල්ඩ් කොන්ග්‍රෙස්- ෆෝරම් 2021' සහ මාර්ගස්ථව පැවති 'වර්ල්ඩ් රූට්ස් ප්‍රමෝෂනල් ඉවෙන්ට්- 2021' වැනි ගුවන් සේවා සංසදවලට සහභාගී වෙමින් ගුවන් සමාගම් සමඟ සාකච්ඡා කිරීමට උත්සාහ කරන ලදී. මෙම උත්සහයේ ප්‍රතිඵලයක් ලෙස ධනාත්මක ගුවන් සමාගම් සාකච්ඡා ආරම්භ කිරීමට යොමු වීම, නැවත ගුවන් ගමන් ආරම්භ කිරීම සහ ගුවන් ගමන් වාර ගණන වැඩි කිරීම යන කාර්යසාධන දර්ශකය සැලකිය යුතු ලෙස ඉහළ නැගීම සිදු වූ අතර එය සංචාරක හා ගුවන් සේවා පිළිබඳ රටේ බලාපොරොත්තු සමෘද්ධිමත් කරනු ලැබිණි.

අවධානයට ලක්වන ගුවන්තොටුපළ සහ ගුවන් ගමනාගමන සංඛ්‍යාලේඛන

වසංගත තත්ත්වයේ අනපේක්ෂිත බලපෑම හේතුවෙන් ජාතිය සංචාරක ව්‍යාපාරයේ ගිලිහී ගිය අවස්ථාවන් නැවත අත්කර ගැනීමට උත්සාහ කරන අවස්ථාවක, ගු.ගු.සේ.ස. හි විෂය පථය යටතේ ඇති ගුවන්තොටුපළවල ගුවන් යානා සංචලනය, මගී සංචලනය සහ භාණ්ඩ සංචලනය යන සියලුම ගුවන් ගමනාගමන සංඛ්‍යාලේඛන සමඟ පැමිණෙන සංචාරක අගයන් සියල්ලන්ගේම අවධානයට ලක් විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 12% ක් සංචාරක සහ ගුවන් සේවා නියෝජනය කිරීමත්, එය රටේ තුන්වන විශාලතම විදේශ ආදායම් ඉපයීම වීමත් බලපාන ලදී.




"එයාර් අස්ටානා" පිළිගැනීම සඳහා ජල ඉසින




"ස්විස් ඉන්ටනැෂනල්" ගුවන් ගමන් නැවත ආරම්භ කිරීමේ නිල උත්සවය


බ.ජා.ගු. මගී සංචලනයන්



ම.රා.ජා.ගු. මගී සංචලනයන්



කො.ජා.ගු.ර. මගී සංචලනයන්



බ.ජා.ගු.

අභියෝගාත්මක වසරක් වූ බැවින්, ජාත්‍යන්තර ගුවන් යානා සංචලනයන් 20,607 ක් සහ දේශීය ගුවන් යානා සංචලනයන් 3,729 කින් සමන්විත සමස්ත ගුවන් යානා සංචලනයන් 24,336 ක් පමණක් බ.ජා.ගු. විසින් හසුරුවා ඇත. 2021 වසරේ දී ජාත්‍යන්තර මගීන් 1,472,506 ක් සහ දේශීය මගීන් 127 ක් විසින් බ.ජා.ගු. භාවිත කරන ලදී. බ.ජා.ගු. විසින් හසුරුවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 200,138 කි. භාණ්ඩ ප්‍රවාහනයට අමතරව, බ.ජා.ගු. හි අනෙකුත් සියලුම ගුවන් ගමනාගමන සංඛ්‍යාලේඛන පෙර වසරට සාපේක්ෂව අඩුවීමක් පෙන්නුම් කළේය. ඒ අනුව, ගුවන් යානා සංචලනයන් සහ මගී සංචලනයන් පිළිවෙළින් 2% කින් සහ 37% කින් අඩු වී ඇත. කෙසේ වෙතත්, භාණ්ඩ ප්‍රවාහනය 2020 වසරට සාපේක්ෂව 33% කින් වැඩි වී ඇත.

ම.රා.ජා.ගු.

2021 වසරේ දී කොවිඩ්-19 ගෝලීය වසංගතය මධ්‍යයේ, ම.රා.ජා.ගු. 2013 වසර ආරම්භයේ පටන් මේ දක්වා වූ වැඩිම මගී පැමිණීම් සංඛ්‍යාවක් වාර්තා කළේය. මෙය වාර්තා වූයේ ජාතික ගුවන් සේවය වන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි ප්‍රතිව්‍යුහගත කිරීමේ උත්සාහයන් හේතුවෙන්, 2015 සිට ම.රා.ජා.ගු. වෙත පියාසර නොකළ පසුබිමකය. ම.රා.ජා.ගු. මුළු ගුවන් යානා සංචලනයන් 722 ක් හසුරුවා ඇති අතර, ඉන් 584 ක් ජාත්‍යන්තර ගුවන් යානා සංචලනයන් වන අතර මගීන් 32,957 ක් සඳහා පහසුකම් සැලසීය. මෙම කාලය තුළ භාණ්ඩ මෙට්‍රික් ටොන් 41 ක් හසුරුවා ඇත.

සංචාරකයින් කොවිඩ් තත්ත්වයෙන් ආරක්ෂා කිරීමේ "බයෝ බබල්" සංකල්පය යටතේ වූ නියමු ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා 2020 වසර අවසානයේ ගු.ගු.සේ.ස. විසින් ම.රා.ජා.ගු. තෝරා ගන්නා ලදී. එය සාර්ථකව ක්‍රියාත්මක වූ අතර, ම.රා.ජා.ගු. මූලික කර ගත් අපගේ ගමනාන්ත අලෙවිකරණ ප්‍රයත්නයන් අභ්‍යන්තර සංචාරක ව්‍යාපාරයේ ප්‍රබෝධයක් ඇති කළේය.

කො.ජා.ගු.ර.

බ.ජා.ගු. සහ ම.රා.ජා.ගු. රටේ ජාත්‍යන්තර ගුවන් දොරටු ද්විත්වය ලෙස සලකා බලන විට, ජාත්‍යන්තර ව්‍යාපාරික ජෙට් යානාවලට අදාළ උප වෙළඳපොළෙහි තේරීම වනුයේ කො.ජා.ගු.ර. යි. දේශීය ගුවන් සේවා ප්‍රවර්ධනය කිරීමේ දී රටේ ප්‍රධාන අභ්‍යන්තර ගුවන්තොටුපළ ලෙස ද, කො.ජා.ගු.ර. සියලු වර්ගවල පුහුණු ගුවන් ගමන් සඳහා පහසුකම් සලසයි. 2021 වර්ෂය තුළ ගුවන් මගී සංචලනයන් 3,011 කට පහසුකම් සලසමින්, මුළු ගුවන් යානා සංචලනයන් 22,043 ක් (පුහුණු පියාසැරි ඇතුළුව) හසුරුවා ඇත.

යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ

කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් පසුව, ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සමාලෝචිත වර්ෂය තුළ යා.ජා.ගු. හි ජාත්‍යන්තර මෙහෙයුම් කිසිවක් සිදු කර නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස යා.ජා.ගු. විසින් 2021 වසර තුළ දී මගීන් 110 ක් සමඟින් අභ්‍යන්තර සංචලනයන් 32 ක් පමණක් හසුරුවා ඇත.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

මධ්‍යකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ

සියලුම ගුවන්තොටුපළ සඳහා ගු.ගු.සේ.ස. හි ව්‍යාපාරික සැලසුම්වලට අනුව, ම.ජා.ගු. 2018 වසරේ දී නැවත විවෘත කළ දා පටන් අභ්‍යන්තර ගුවන්තොටුපළක් ලෙස දිගටම සේවය කර ඇත. 2021 වසරේ දී. ම.ජා.ගු. ගුවන් යානා සංචලනයන් 258 ක් සහ මගීන්ගේ සංචලනයන් 1,082 ක් සඳහා පහසුකම් සලසා ඇත. බ.ජා.ගු. සහ ම.රා.ජා.ගු. හි පවතින ප්‍රමිතිගත තත්ත්වයට ළඟා වීම සඳහා කො.ජා.ගු.ර. සහ ම.ජා.ගු. හි දැනට පවතින යටිතල පහසුකම් සහ වැඩිදුර සේවා පහසුකම් ඉහළ නැංවීම අවශ්‍ය වේ.

කො.ජා.ගු.ර. යෝග්‍යතමයාගේ පැවැත්ම

බාහිර අහිතකර පරිසරය හේතුවෙන් අපගේ ව්‍යාපාර සැලසුම්වල හඳුනාගත් වර්ධන සැලසුම් තාවකාලිකව අත්හිටුවීමට ගු.ගු.සේ.ස. හට සිදු විය. එබැවින්, දිගු කාලීනව පවත්වාගැනීමේ ප්‍රධාන අරමුණ වූයේ 'යෝග්‍යතමයාගේ පැවැත්මයි'. ජාත්‍යන්තර මගීන් සහ ගුවන් යානා සංචලනය හැරුණු කොට අනෙකුත් ද්විතීයික ආදායම් මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කරමින්, පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සහ වටිනාකම් තහවුරු කරලීම අපගේ පැවැත්ම තහවුරු කිරීමට ප්‍රධාන ලෙස අවධානය යොමු කළ අංශය විය.

පාර්ශ්වකරුවන්ගේ වටිනාකම් වෙනස

වසරකට වැඩි කාලයක් පුරා ගුවන් මගී සංඛ්‍යාව අනපේක්ෂිත ලෙස අඩුවීමත් සමඟ, ගු.ගු.සේ.ස. විසින් ගුවන්තොටුපළ තුළ ව්‍යාපාරික කටයුතු සිදු කරන්නන් වෙත පිරිවැටුම මත සිදු කරන ගෙවීම් සහ බිම් කුලී ගාස්තු අනුව ඔවුන් මුහුණ දෙන මූල්‍ය බර බෙදාගැනීමේ අරමුණින් වට්ටම් ලබා දීමට අබණ්ඩව කටයුතු කළේය. එය ගු.ගු.සේ.ස. හි ඉහළම ආදායම් සංරචක පහෙන් දෙකකි.

වසංගත තත්ත්වයෙන් පසු ගුවන් සමාගම් සිය මෙහෙයුම් කටයුතු සඳහා දැරිය යුතු සම්පූර්ණ පිරිවැය ලෙස අවධානය යොමු කොට, ගු.ගු.සේ.ස. විසින් ම.ජා.ගු. සහ කො.ජා.ගු.ර. යන ගුවන්තොටුපළවල ගොඩබෑමේ සහ නැවැත්වීමේ ගාස්තු සහ අපගමන බදු ආදායම ඉවත් කර, මගීන් වෙත අවම ගාස්තු යටතේ සහන ලබා දෙමින්, ගුවන් සමාගම්වල වියදම් සඳහා යම් සහන ලබා දීමට පියවර ගන්නා ලදී. ආයෝජන මත ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා දිගු කාලීනව වැදගත් වන ඉලක්කය වූයේ වෙළඳපළ සංවර්ධනයයි.

අනුබද්ධ ආදායම මූලික වීම

කොවිඩ් තත්ත්වය හේතුවෙන් කිසිදු සාර්ථකත්වයක් නොමැති වීමෙන් ලෝකයේ බොහෝ ගුවන්තොටුපළවල් පාඩු ලබන විට, ගුවන්තොටුපළ ව්‍යාපාර කිරීමට සහ ව්‍යාපාර විවිධාංගීකරණය සඳහා අවම ඉඩක් ඇති බැවින් ගු.ගු.සේ.ස. ගුවන්තොටුපළ ව්‍යාපාර රාමුව තුළ අනුබද්ධ ආදායම් මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලදී.

දේශීය ගුවන් සේවා එහි විභවයන්ට ඉඩදීම

අවශ්‍ය යටිතල පහසුකම්, අවශ්‍ය පහසුකම් සහ සේවා සපයමින්, ඔවුන් සමඟ ඒකාබද්ධ අලෙවිකරණ ව්‍යාපාර ක්‍රියාත්මක කරමින්, ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ගුවන්තොටුපළ මෙන්ම, සුප්‍රසිද්ධ සංචාරක ස්ථාන ප්‍රවර්ධනය කිරීම සඳහා ගු.ගු.සේ.ස. දේශීය ගුවන් සමාගම් සමඟ සම්බන්ධ විය. එල්ටීටීඊය සමඟ ඇති වූ වාර්ගික යුද්ධයට පෙර 1970 වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ ගුවන් සේවයේ දේශීය ගුවන් සේවාව ප්‍රබල අංශයක් වූ අතර එම විභවය තවමත් පවතී.



කො.ජා.ගු.ර. හි බිම්තල සැලැස්ම පුළුල් කිරීමේ සාකච්ඡාව



කො.ජා.ගු.ර. හි ගුවන් ධාවන පථය අලුත්වැඩියාව

✈ නව බිම් හැසිරවීමේ ඒකකයක් ස්ථාපිත කිරීම

ම.රා.ජා.ගු., කො.ජා.ගු.ර., යා.ජා.ගු. සහ බ.ජා.ගු. හි බිම් හැසිරවීමේ සේවා සැපයීමේ දී ගු.ගු.සේ.ස. වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලතල අනුව, 2015 ජූලි 07 දිනැති අංක 1922/4 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට සහ 2019 ඔක්තෝබර් 11 දිනැති අංක 2144/64 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයෙහි අවශ්‍ය නියාමන අනුමැතියට යටත්ව, ගු.ගු.සේ.ස. විසින් නව හැකියාවන් හඳුනාගැනීම මඟින් මානව සම්පත් සංචිතයක් ගොඩනැඟීමේ ප්‍රධාන අරමුණ ඇතිව, මූලික පියවර ලෙස කො.ජා.ගු.ර. හි නව බිම් හැසිරවීමේ ඒකකයක් ස්ථාපිත කරන ලදී.

මේ දක්වා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් යානාවල බිම් හැසිරවීමේ එකම සේවා සපයන්නා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වූ අතර, අවම පිරිවැය යටතේ මෙහෙයවන ගුවන් යානා (the Low Cost Carriers) සඳහා මෙන්ම ජාත්‍යන්තර වාණිජ ජෙට් සහ පුද්ගලික ජෙට් අංශ සඳහා ආකර්ශනීය වන පරිදි පවතින බිම් මෙහෙයුම් ගාස්තු පහත හෙළීම සිදු කළ යුතුය. ගුවන් සේවා කර්මාන්තය දිගු කාලීනව ඉදිරියට යාමට නම් මිලකරණයේ මෙම වෙනස්කම් සිදු කිරීම තීරණාත්මක අවශ්‍යතාවයක් බව තේරුම් ගැනීමත්, ජාතික ගුවන් සේවයේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලසුම් අනුව බිම් හැසිරවීම සඳහා හදිසි අවස්ථා සැලැස්මක් තිබීමේ අවශ්‍යතාවය පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්වීමත්, ගු.ගු.සේ.ස. විසින් බිම් හැසිරවීමේ මෙහෙයුම්වලට පිවිසීමට තීරණය කිරීමේ ප්‍රධානතම හේතූන් විය.

ගු.ගු.සේ.ස. විසින් 2021 වර්ෂය තුළ දැනට සිටින කාර්ය මණ්ඩලය 30 දෙනෙකු බිම් හැසිරවීමේ මෙහෙයුම්වලට පුහුණු කර ඇති අතර විශේෂඥ දැනුමක් සහිත 08 දෙනෙකු අලුතින් කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදී. මේ සඳහා අවශ්‍ය උපකරණවල ප්‍රධාන කොටස ගු.ගු.සේ.ස. සතු වූ අතර ඇතැම් දෑ අඩු මුදලකට කුලියට ගත හැකි වූ බැවින් ප්‍රාග්ධන වත්කම් අලුතින් අත්පත් කර ගැනීම අවශ්‍ය නොවන ලදී.

✈ සමාගමේ පුහුණු අංශය ශක්තිමත් කිරීම

ගු.ගු.සේ.ස. හි පුහුණු අංශය වන සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය ජාතික මට්ටමින් ඇකඩමියක් ලෙස ලැයිස්තුගත කිරීමට අවශ්‍ය සියලුම පහසුකම්වලින් සමන්විත වූ බැවින් 2021 වසරේ දී "ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමිය" (SLA) ලෙස නැවත නම් කරන ලදී.

✈ ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමිය සතු විදේශ සබඳතා

ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමිය විසින් පවත්වනු ලබන ගුවන් සේවා අධ්‍යයන ඩිප්ලෝමාව, නවසීලන්තයේ කීර්තිමත් මැසේ විශ්වවිද්‍යාලය විසින් පිළිගෙන ඇති අතර, එම ඩිප්ලෝමාව සාර්ථකව සම්පූර්ණ කරන සිසුන්ට මැසේ විශ්වවිද්‍යාලයේ තුන් අවුරුදු ගුවන් සේවා උපාධි පාඨමාලාවේ දෙවන වසර සඳහා සෘජුවම ඇතුළත් වීමට හැකි වන පරිදි, විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා දීමට සිසු හුවමාරුව සඳහා පිළිගෙන ඇත. 2021 නොවැම්බර් මාසයේ දී මේ සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙමඟින් සිසුන්ට උපකාරක පන්ති ගාස්තු සහ වසරක විදේශ ජීවන වියදම් මඟින් සහය ලබා දෙන අතරම රටට විදේශ මුදල් ඉතිරියක් ලබා දේ.



බිම් හැසිරවීමේ පුහුණුව සම්පූර්ණ කිරීමේ සහතික ප්‍රදානය කිරීම



CATC හි නැවත සන්නාමකරණය සනිටුහන් කරමින් ඵලකය විවෘත කිරීම

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

✈ ගුවන් සේවා නොවන ක්‍රියාකාරකම්

දේශීය සංචාරකයින් අතර ගුවන්තොටුපළ ප්‍රචලිත කිරීම සහ අමතර ආදායමක් උපයා ගැනීමේ ක්‍රමයක් ලෙස, ගු.ගු.සේ.ස. විසින් ඡායාරූපකරණය, විලාසිතා උළෙල සහ ඒ හා සමාන ක්‍රියාකාරකම් සඳහා කො.ජා.ගු.ර. පරිශ්‍රය කුලියට දීම ආරම්භ කළේය.





31 වැ ඒෂියා ස්ටාර් උළෙල





දේශීය ගුවන් සේවා ප්‍රවර්ධන දීමනා

අනාගතය වෙත නැවතත්

තරඟකාරී වෙළෙඳපොළ තුළ අපගේ අනාගතය සූදානම් කිරීම සඳහා, ගු.ගු.සේ.ස. විසින් තිරණාත්මක ප්‍රාග්ධන ව්‍යාපෘති අඛණ්ඩව සිදු කරන ලදී. මෙම ප්‍රාග්ධන වියදම්වලින් වැඩි ප්‍රමාණයකට ලබාගත් ණය ආපසු ගෙවීම සඳහා දිගු කාල සීමාවක් ඇති අතර, මෙම ව්‍යාපෘති නිසා පාරිභෝගිකයින්ට සහ ගුවන්තොටුපළවල සියලුම පරිශීලකයින්ට සුවපහසුව, විශ්වසනීයත්වය සහ ආරක්ෂාව තුළින් ක්ෂණික ප්‍රතිලාභ ලැබෙනු ඇත.

නව ධාරිතාවන් ඇති කරලීම

✈ බ.ජා.ගු. හි දෙවන පර්යන්ත (T2) ව්‍යාපෘතිය

බ.ජා.ගු. හි දෙවන පර්යන්ත ව්‍යාපෘතිය, පැකේජ් යටතේ මගී පර්යන්තය හා ඒ ආශ්‍රිත කටයුතු වසර අවසානයේ දී 3% ක ප්‍රගතියක් සමඟින් (ඉලක්කගත ප්‍රගතිය 4% විය) ඉදිරියට සිදු කරගෙන යනු ලබයි. නියමිත ඉදිකිරීම් කාලය මාස 36 ක් වන අතර ඉදිකිරීම් 2020 දෙසැම්බර් 15 වන දින ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ජපානයේ සංස්ථාපිත ඉදිකිරීම් නියෝජිතායතනයේ ණය මුදලකින් අරමුදල් සපයනු ලබන අතර ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත මුදල ජපන් යෙන් මිලියන 41,554 සහ රුපියල් මිලියන 35,136 වේ.



දෙවන පර්යන්තය පැකේජය- A ඉදිකිරීම් කටයුතු

සමාලෝචිත වර්ෂය තුළ, දුරස්ථ ගුවන් යානා හැසිරවීමේ අංගනය සහ ගුවන් ධාවන පථය ඉදිකිරීමේ B පැකේජය සම්පූර්ණ කළ අතර, එය 2021 නොවැම්බර් 25 වන දින ගුවන් සමාගම් සඳහා විවෘත කරන ලදී.

පළවන පර්යන්තය හා සසඳන විට දෙවන පර්යන්තයේ (A පැකේජය සහ B) පැකේජය ව්‍යාපෘති අපේක්ෂිත ධාරිතාව / පහසුකම් වැඩිදියුණු කිරීම)

පහසුකමේ ස්වභාවය	දැනට පවතින පර්යන්තය (පළවන පර්යන්තය)	' සහ ඊ පැකේජ (දෙවන පර්යන්තය)	මුළු ගණන (දෙවන පර්යන්තය සම්පූර්ණ කිරීමෙන් පසු)
භූමි ප්‍රමාණය	ව.මීටර් 90,000	ව.මීටර් 185,900	ව.මීටර් 275,900
ඇතුළු වීමේ කවුළු ගණන	53	අංක 96	අංක 149
විගමන කවුළු	අංක 21 යි	32 යි	53 යි
ආගමන කවුළු	කවුළු 27 යි	කවුළු 56 යි	කවුළු 83 යි
ගුවන් පථ ආරක්ෂක පාලන ස්ථාන	1 වන මගී පාලම අසළ ස්ථාන 8යි බස්රථ ගේට්ටුව අසළ ස්ථාන 2යි	2 වන සහ 3 වන මගී පාලම් අසළ ස්ථාන 20යි	ස්ථාන 30 යි
සම්බන්ධතා ගේට්ටු	ගේට්ටු 8 යි	ගේට්ටු 16 යි	ගේට්ටු 24 යි
බස්රථ ගේට්ටු	ගේට්ටු 6 යි	ගේට්ටු 10 යි	ගේට්ටු 16 යි
ගුවන්සේවා විවේකාගාර	4 යි	6 යි	10 යි
ගමන් මලු ලබාගැනීමේ අංගන	අංගන 6 යි	අංගන 7 යි	අංගන 13 යි
ගමන් මලු සැකසීමේ අංගන	3 යි	7 යි	10 යි
ගුවන් යානා නැවැත්වීමේ ස්ථාන	ස්ථාන 26 යි	ස්ථාන 23-28 යි	ස්ථාන 49-54 යි
මගීන් හැසිරවීමේ ධාරිතාව	වසරකට මිලියන 6	වසරකට මිලියන 9	වසරකට මිලියන 16

✈ ආනයන භාණ්ඩ පර්යන්තය ඉදිකිරීම

මෙමඟින් බ.ජා.ගු හි ගුවන් භාණ්ඩ හැසිරවීමේ ධාරිතාව වසරකට මෙ.ටොන් 150,000 කින් වැඩි කර සමස්ත හැසිරවීමේ ධාරිතාව මෙ.ටොන් 400,000 දක්වා වැඩි කරයි. ව්‍යාපෘතිය 2021 ජනවාරි මස ආරම්භ වූ අතර, 2021 වසර අවසන් වන විට 24% ක ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. එය 2023 ජනවාරි මාසයේ දී නිම කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ මුළු වියදම රුපියල් බිලියන 2.6 කි.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

නැවත සකස් කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම

පූර්ව වසංගත යුගයේ අත්විඳින ලද අධි ධාරිතාව සඳහා විසඳුමක් ලෙස, 2021 දී ගු.ගු.සේ.ස. විසින් බ.ජා.ගු. හි දැනට පවතින මගී පර්යන්ත ගොඩනැගිල්ලේ (PTB) සේවා මට්ටම ඉහළ නංවන අතරම, පවතින ධාරිතාව ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා ඇතැම් ව්‍යාපෘති අඛණ්ඩව සිදු කරන ලදී.

✈ **"අරලිය" විවේකාගාරය ප්‍රතිසංස්කරණය**

ක්‍රමයෙන් ක්‍රියාත්මක වන විවේකාගාර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස, "අරලිය" විවේකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම 2021 පෙබරවාරි මාසයේ දී අවසන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා සමාගම රුපියල් මිලියන 202 ක් වැය කරන ලදී. මෙම නව පහසුකම, සුවපහසු සහ ප්‍රමාණවත් ආසන, සන්සුන් පරිසරයක් සහ ගුවන්තොටුපළ පාරිභෝගික සේවා සඳහා වඩා හොඳ තත්ත්වයේ ප්‍රවේශයක් සමඟින් ඉඩකඩ සහිත වන අතර, අපහසුතාවයකින් තොර සංක්‍රමණ සහ සංචාරක අත්දැකීමක් අපේක්ෂා කරන වෙහෙසට පත් සංචාරකයින්ට ඉතා වටිනා සුවපහසුවක් ලබා දෙයි. ඉහළ වටිනාකමක් ඇති ව්‍යාපාරික මගීන්ගේ අපේක්ෂාවන්ට ඉඩ සලසමින්, අරලිය විවේකාගාරයේ ඔවුන්ට ඉහළ සත්කාරකත්වය ලබා දීමෙන් බ.ජා.ගු. සිය ගෞරවනීය හවුල්කාර ගුවන් සේවා සඳහා පහසුකම් සපයයි.

✈ **විගමන කලාපය නැවත ස්ථානගත කිරීම**

ජනාකීර්ණ තත්ත්වය නිසා ඇතිවන ප්‍රමාදයන් අවම කිරීම මඟින්, වේගවත් නිෂ්කාශන ක්‍රියා පටිපාටි සඳහා පහසුකම් සැලසීමේ අරමුණින්, නව විගමන කවුන්ටර 23 ක් එක් කිරීමට සැලසුම් කර ඇති විගමන ප්‍රදේශය නැවත ස්ථානගත කිරීම, වසර අවසානය වන විට 98% ක ප්‍රගතියක් ලබා ඇත.

✈ **නව ආගමන ශාලාව සහ බන්ධිත පහසුකම් සහිත ඉලෙක්ට්‍රොනික් වෙළඳ සංකීර්ණය**

බ.ජා.ගු. හි නව ආගමන ශාලාව සහ බන්ධිත පහසුකම් සහිත ඉලෙක්ට්‍රොනික් වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 56% ක ප්‍රගතියක් ලබා ඇත. මේ සඳහා විගමන ශාලාව අමතර ඉඩක් සහිතව නැවත සකස් කිරීමට ඉඩ ලබා දෙමින් පළමු මහලේ තිබූ තීරු බදු රහිත සාප්පු දෙවන මහලට ගෙන යමින් නැවත සකස් කර ඇත.

සමස්ත ව්‍යාපෘති වටිනාකම පිළිවෙළින් රුපියල් මිලියන 472 ක් සහ රුපියල් මිලියන 430 කි. ඉලෙක්ට්‍රොනික් වෙළෙඳ සංකීර්ණ ක්‍රියාකරුවන්ට, වෙළඳ භාණ්ඩ ගුවන්තොටුපළට ලැබුණු අවස්ථාවේ සිට ඒවා බෙදාහැරීමට සූදානම් වන තෙක් ගබඩා කළ හැකි බන්ධිත ගුදම් 25 කින් සමන්විත බන්ධිත ගබඩාවක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2021 වසර අවසන් වන විට 88% ක ප්‍රගතියක් සහිතව සිදු වෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා සමාගම රුපියල් මිලියන 120 ක පිරිවැයක් දරන ලදී.



ආනයන ගුවන් භාණ්ඩ පර්යන්තයට මුල්ගල තැබීමේ උත්සවය



ආනයන ගුවන් භාණ්ඩ පර්යන්තයේ වැඩ කටයුතු සිදු වෙන ආකාරය



නැවත ස්ථාපිත කළ අරලිය විවේකාගාරය



නැවත ස්ථාපිත කළ විගමන පරිශ්‍රය

තාක්ෂණික වැඩිදියුණු කිරීම

ව්‍යාපාර මෙහෙයුම් සඳහා සහය දැක්වීමේ අරමුණින් නව තාක්ෂණික හඳුන්වාදීම් කිහිපයක් සිදු කරන ලද අතර පවතින තාක්ෂණවල වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.

✈ ERP අදියර I

අංගසම්පූර්ණ ERP පද්ධතියක් හඳුන්වාදීම සඳහා සමාගමේ සැලසුමට අනුව, ගු.ගු.සේ.ස. විසින් 2021 වර්ෂයේ දී ව්‍යාපෘතියේ පළමු අදියර සම්පූර්ණ කරන ලද අතර, එමඟින් මූල්‍ය සහ සැපයුම් දාම මොඩියුල ආවරණය කරයි. තොරතුරු අවශ්‍යතා හඳුනාගෙන, ඒ අනුව යෝජනා සඳහා ඉල්ලීම (RFP) සකස් කිරීම සඳහා බාහිර උපදේශන සමාගමක සේවය ලබා ගනිමින් ව්‍යාපෘතියේ II අදියර දැනට සිදු කෙරේ. අදියර 1 ව්‍යාපෘතියේ වියදම ආසන්න වශයෙන් රුපියල් මිලියන 180 කි.

ERP අදියර I - සැපයුම් දාම සහ මූල්‍ය මොඩියුල ක්‍රියාත්මක කිරීමත් සමඟ, අනුමත කිරීමේ චක්‍ර කාලය අඩුවීම, අවම ලේඛන කටයුතු, වඩා හොඳ භාණ්ඩ තොග නිරීක්ෂණය සහ සැලසුම් කිරීම, විශ්ලේෂණය කළ තොරතුරු පහසුවෙන් ලබාගත හැකිවීම ප්‍රධාන ලෙස දැකගත හැකි ප්‍රතිලාභ වේ.

✈ අධ්‍යක්ෂ මණ්ඩල පාලන ක්‍රියාවලිය

2020 දී සාර්ථක අත්හදා බැලීමේ කාල සීමාවක් සම්පූර්ණ කිරීමෙන් පසු, 2021 දී ඩිජිටල්කරණය වූ අධ්‍යක්ෂ මණ්ඩල පාලන විසඳුමක් එළිදක්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ සමාගම් ලේකම්වරිය මෙන්ම ආරාධිතයන් ද මෙම ඩිජිටල්කරණ විසඳුම් මඟින් සැලකිය යුතු කාල ඉතිරියක්, තීරණවලට අදාළ සොයා ගැනීමේ සහ අනුගමනය කිරීම්, සියලු පාර්ශ්ව සම්මුතිය සමඟ සහයෝගී තීරණ ගැනීමේ හැකියාව, අවම කඩදාසි භාවිතය, කාර්යක්ෂම ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය ආදී ප්‍රතිලාභ ලබා ගත්හ.

✈ POS පද්ධතිය

සියලුම ගනුදෙනුවල විනිවිදභාවය සහතික කරමින්, මඟීන්ට සහ සාප්පුවල සේවය කරනු ලබන පිරිසට වඩා හොඳ සහ පහසු සේවාවක් ලබා දීම සඳහා, ගු.ගු.සේ.ස. හි තොරතුරු තාක්ෂණ කණ්ඩායම විසින් සංවර්ධනය කරන ලද මෘදුකාංගයක් යෙදවීමෙන්, බ.ජා.ගු. හි පවත්වාගෙන යනු ලබන තීරුබදු රහිත වෙළඳසැල් සඳහා ගු.ගු.සේ.ස. විසින් ඉලෙක්ට්‍රොනික් විකිණුම් ස්ථාන (Point of Sale) පද්ධතියක් හඳුන්වා දෙන ලදී.

✈ ගූගල් අභ්‍යන්තර සිතියම් ආරම්භ කිරීම

ඇපල් සහ ඇන්ඩ්‍රොයිඩ් යන උපාංග දෙකෙහිම ස්මාර්ට් දුරකථන සහ ටැබ් මඟින් ප්‍රවේශ විය හැකි, ගූගල් අභ්‍යන්තර සිතියම්, 2021 අප්‍රේල් මාසයේ දී බ.ජා.ගු. හි දී දියත් කරන ලද අතර, එය ශ්‍රී ලංකාවේ මෙම විශේෂාංගය සක්‍රීය කළ පළමු ගෘහස්ථ පහසුකම බවට පත් විය. මඟීන් සහ අමුත්තන් ඔවුන්ගේ ගමන ආරම්භ කිරීමට හෝ ගුවන්තොටුපළට පැමිණීමට පෙර ඔවුන්ට ලබා ගත හැකි සේවා හා පහසුකම් සොයා ගැනීම සඳහා ගූගල් අභ්‍යන්තර සිතියම පහසුකම් සපයයි. බ.ජා.ගු. හි මඟීන්ට සහ අමුත්තන්ට ස්මාර්ට් ජංගම දුරකථන හෝ ටැබ් මඟින් පහසුවෙන් පිටත්වීමේ, සංක්‍රමණ සහ පැමිණීමේ පර්යන්තවල සවිස්තරාත්මක ඩිජිටල් බිම් සැලසුම් වෙත ප්‍රවේශ විය හැක. බ.ජා.ගු. හි බලයලත් ගොඩබිම් හසුරුවන්නා ලෙස ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සහ ගුවන්තොටුපළ ක්‍රියාකරු ලෙස ගු.ගු.සේ.ස. විසින් මඟීන්ගේ සංචාරය වඩාත් ප්‍රතිලාභදායක කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය දියත් කරන ලදී.

✈ ගුවන් ගමන් තොරතුරු කළමනාකරණ පද්ධතිය (AIM)

රුපියල් මිලියන 750 ක පිරිවැයෙන් ගුවන් තොරතුරු සේවා වැඩිදියුණු කිරීම සඳහා නව ගුවන් ගමන් තොරතුරු කළමනාකරණ පද්ධතිය හඳුන්වා දෙන ලදී. 2021 වසර අවසානයේ ව්‍යාපෘතිය 92% ක ප්‍රගතියක් ලබා ඇත.

✈ ගුවන් ගමන් කළමනාකරණ පද්ධතිය (ATM) ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

ගුවන් ගමන් පාලන මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ අරමුණින් රුපියල් මිලියන 965 ක වියදමකින් ආරම්භ කරන ලද නව ගුවන් ගමන් කළමනාකරණ පද්ධතිය (ATM) ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු 2021 වසර අවසන් වන විට 85% ක ප්‍රගතියක් ලබා ඇත. මෙය පැරණි ටර්මිනල් රේඩාර් දත්ත සැකසුම් පද්ධතිය (TRDPS) වෙනුවට නව තාක්ෂණික විශේෂාංග රැසක් සමඟින් ස්ථාපනය කරන අතර Mode-S රේඩාර්, ADS-B, WAM වැනි බහු ආවේක්ෂන පද්ධතීන් සම්බන්ධ කිරීමේ හැකියාව පවතී. ඊට අමතරව, ක්‍රියාකාරී ඕඑඒ පද්ධතියට බාධාවකින් තොරව දෘඩාංග සහ මෘදුකාංග පරීක්ෂණ සඳහා භාවිත කළ හැකි පරීක්ෂණ පද්ධතියක් (Offline Test System) එහි ඇත. නව පද්ධතිය හරහා ලැබී ඇති විශේෂාංග හරහා ගුවන් ගමනාගමන කළමනාකරණ කටයුතු 100% විශ්වසනීයත්වයකින් යුතුව කරගෙන යාම සඳහා පහසුකම් සලසා ඇත.

✈ දුරකථන සහ රේඩියෝකථන සන්නිවේදන පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

දුරකථන සහ රේඩියෝකථන සන්නිවේදන පද්ධතියේ සවි කිරීමේ වැඩ කටයුතු එය පිහිටුවීමට නියමිත පාලන මධ්‍යස්ථානයන් වන බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සහ රත්මලාන ගුවන් පාලන මධ්‍යස්ථානයෙහි වර්ෂ 2021 හි අග භාගයේ ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතියේ අවසන් අදියරේ වැඩ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින අතර ඉහත කී පාලන මධ්‍යස්ථානයන්හි පැරණි පද්ධතිය සමඟ සමාන්තරව මෙම නව පද්ධතියත්, ගුවන් ගමන් පාලන කටයුතු සඳහා යොදා ගනිමින් පවතියි.

දුරකථන සහ රේඩියෝකථන සන්නිවේදන පද්ධතිය ගුවන් පාලකවරුන්හට ගුවන් පාලනය හා සම්බන්ධ රේඩියෝකථන සහ දුරකථන හුවමාරු සඳහා සරල ප්‍රදර්ශන මෙවලමක් (Display) ලබාදෙයි. මෙම සන්නිවේදන පද්ධතිය මඟින් IP තාක්ෂණය භාවිත කරමින් සිදුකරන දුරකථන සහ රේඩියෝකථන (VoIP) හරහා වඩා විශ්වසනීය මෙන්ම කාර්යක්ෂම සන්නිවේදනයන් ලබාගත හැකිවීම විශේෂත්වයක්. දුරකථන සහ රේඩියෝකථන සන්නිවේදන පද්ධතිය සමඟ පිදුරුතලාගල පිහිටි ගුවන් පාලනය සඳහා භාවිත වන VHF රේඩියෝ පද්ධතිය මෙම නව තාක්ෂණය (VoIP) සමඟ සිදුකරන හුවමාරු සාර්ථකව අත්හදා බලා ගුවන් පාලනය සඳහා භාවිත කෙරෙමින් පවතියි.

✈ ස්වාධීන ස්වයංක්‍රීය කාලගුණ නිරීක්ෂණ පද්ධතිය (AWOS) යා.ජා.ගු. හි ස්ථාපනය කිරීම

ස්වාධීන ස්වයංක්‍රීය කාලගුණ නිරීක්ෂණ පද්ධතිය, ගුවන් යානා සඳහා බිම් මට්ටමේ කාලගුණ දත්ත සපයන තීරණාත්මක පද්ධතිවලින් එකකි. නව පද්ධතිය මඟින් සුළඟේ වේගය, සුළං දිශාව, වායුගෝලීය පීඩනය, ආර්ද්‍රතාවය සහ උෂ්ණත්ව තොරතුරු පිළිබඳ ඉතා නිවැරදි දත්ත ගුවන් නියමුවන්ට කාර්යක්ෂමව ක්‍රියා කිරීම සඳහා ලබා දීමේ හැකියාව ඇත. මෙම ව්‍යාපෘතියට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් අරමුදල් සපයන ලද අතර, ස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය ගු.ගු.සේ.ස. විසින් සිදු කරන ලදී.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

✈ **ඩිජිටල් සෞඛ්‍ය ප්‍රකාශන පත්‍ර**

ගු.ගු.සේ.ස. විසින් භෞතිකව ආකෘති පත්‍ර පිරවීමේ භාවිතය අවම කිරීම සඳහා ඩිජිටල් සෞඛ්‍ය ප්‍රකාශ පද්ධතියක් හඳුන්වා දුන් අතර, ශාරීරික සම්බන්ධතා සහ මගී පිරිසැකසුම් කිරීමේ කාලය අවම කරමින් මාර්ගගත වේදිකාවක් තෝරා ගැනීමට මගීන්ව දිරිමත් කරනු ලබයි.

✈ **ගුවන්තොටුපළ ඩිජිටල්කරණ නියමු ව්‍යාපෘතිය**

අපගේ ඩිජිටල්කරණ ප්‍රයත්නවල කොටසක් ලෙස "ඩිජිටල් පිවිසුම (Smart Check-in)", "ඩිජිටල් දොරටු (e-Gates)", "සියල්ලම එක් මෘදුකාංගයකින් (All-in-One App)", සහ "අන්තර්ජාලය පාදක වූ මගී සහය/තොරතුරු සේවා (Web-based passenger assistance/ information services)" හඳුනාගෙන ඇති අතර, නියමු ව්‍යාපෘතිය 2022 දී එලෙසම ක්‍රියාත්මක කෙරේ. ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ එක්ව අවශ්‍ය සහය සේවා සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අධීක්ෂණය කරනු ඇත.

අනාගත සැලසුම්

ඉදිරි වසර සඳහා උපායමාර්ගික ප්‍රවේශය "යථා තත්ත්වයට පත් වීම" වනු ඇත. බිඳවැටුණු ගුවන් සේවා කර්මාන්තය යළි යථා තත්ත්වයට පත් කිරීම සහ නැවත ආරම්භ කිරීම සඳහා, මගීන්ට සහ ගුවන්තොටුපළ භාවිත කරන්නන්ට ඔවුන්ගේ යහපැවැත්ම සහතික කර ඇති බවට විශ්වාසයක් ගොඩනැගීම අත්‍යවශ්‍ය වේ. කොවිඩ්-19 උවදුරෙන් යථා තත්ත්වයට පත්වීමේ සාපේක්ෂ වේගය සමඟ, ශ්‍රී ලංකාව සාමාන්‍ය ජනතාවගේ සහ ලොව පුරා සංචාරකයින්ගේ විශ්වාසය දිනා ගන්නා ලදී.

උපායමාර්ගික ප්‍රතිසාධනය මඟින් සැලකිය යුතු විදේශ මුදල් ප්‍රමාණයක් රට තුළට ගෙන එනු ඇත. ශ්‍රී ලංකාවට පැමිණෙන ජාත්‍යන්තර සංචාරකයින්ගේ විශ්වාසය වර්ධනය කිරීම සඳහා, අනාගතයේ දී රට තුළ පවතින අහිතකර ආර්ථික තත්ත්වය යටතේ පැනනගින අභියෝගවලට මුහුණ දිය යුතු වේ.

දෙවන පර්යන්ත මෙහෙයුම් සඳහා සූදානම් වීම සඳහා ඉදිරි වසරවල දී ප්‍රධාන අවධානය යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහෙයුම් ආරම්භයේ දී පාර්ශ්වකරුවන් සමඟ විශාල සහයෝගිතා උත්සාහයන් අවශ්‍ය වන අතර, අලෙවිකරණය, මානව ප්‍රාග්ධන සංවර්ධනය, වාණිජ සැලසුම් සකස් කිරීම සහ වඩාත්ම ශක්‍ය ව්‍යාපාර ආකෘතිය තෝරා ගැනීම, මෙහෙයුම් සූදානම සහ පරිවර්තනය වැනි ක්‍රමෝපායික පියවරයන් අවශ්‍ය වනු ඇත. වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීමේ සැලසුම් අනුගමනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයන් සමඟ ක්‍රියාකාරී කමිටු කිහිපයක් පිහිටුවා ඇත. වත්මන් පර්යන්තයේ (T1) ප්‍රතිසංස්කරණ සැලසුම්, දෙවන පර්යන්තයෙහි ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි සිදු වේ.



Artist view of T2



තිරසාර කළමනාකරණය



ගු.ගු.සේ.ස. හි තිරසාර ප්‍රතිපත්තිය

පාරිසරික තිරසාරභාවය සඳහා වූ කැපවීම යළි යළිත් අවධාරණය කරනු වස් සියලුම පාර්ශ්වකරුවන්ට ඉහළ දිගු කාලීන ප්‍රතිලාභ ලබා ගැනීමට බාධා නොවන පරිදි, අපගේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අප නිරන්තරයෙන් සැලකිල්ලක් දක්වන්නෙමු. ඒ අනුව විමෝචන පාලනය, කාබන් පියසටහන අවම කිරීම, ස්වභාවික සම්පත් පුනර්ජනනයට සහය වීම සහ මානව තිරසාරත්වයට ඇති බාධක ඉවත් කිරීම යන අංශ 04 කෙරෙහි ගු.ගු.සේ.ස. අවධානය යොමු කරයි.

විමෝචන පාලනය

සමාගම විසින් ස්වාභාවික පරිසරයට එකතු වන හෝ මුදා හරින සියලුම දෑ අඛණ්ඩව ඇගයීමට ලක් කරන අතර, එමඟින් විමෝචනය අවම කර, හරිතාගාර ආවරණය පාලනය කරයි.

- ජලාපවහන පවිත්‍රාගාරය - පරිසරයට මුදා හරින අපද්‍රව්‍යවල හානිදායක මට්ටම පාලනය කිරීම
- දාහකය සහ අපද්‍රව්‍ය කළමනාකරණය - ගු.ගු.සේ.ස. විසින් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා භාවිත කරනුයේ, මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද, පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) සහිතව පවත්වාගෙන යන අති නවීන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ දාහකයකි.

කාබන් පියසටහන් අවම කිරීම

ගු.ගු.සේ.ස. හි බලශක්ති කළමනාකරණ ක්‍රමවේද නවීන, තිරසාර විසඳුම් මාලාවක් හරහා ක්‍රියාවට නංවන ලදී.

- පවතින ගොඩනැගිලි බලශක්ති කාර්යක්ෂම ආලෝකකරණය, ආලෝක පාලන සහ මෝටර් පාලන පද්ධති (උදා: T5 ප්‍රතිදීප්ත උපාංග, C-Bus පාලන පද්ධතිය, AHU, PAU සඳහා ධාවකයන්) සහිතව නැවත සකස් කරන ලදී.
- සිසිලන යන්ත්‍ර සඳහා පවතින ගොඩනැගිලි කළමනාකරණ පද්ධතිය සමඟ නව සිසිලන පද්ධති ඒකාබද්ධ කිරීම.
- ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිවල දී බැලස්ට් සහ බල්බ භාවිත කරන ලදී.
- විචල්‍ය වේග ධාවකයන් සහ මෘදු ආරම්භක පාලන සහිත ගොඩනැගිලි වායු හැසිරවීමේ ඒකක වැඩිදියුණු කිරීම.
- උණු වතුර පද්ධති සඳහා සූර්ය තාපක හඳුන්වාදීම.
- හිරු එළිය භාවිත කිරීම සහ අඳුර පාලනය කිරීම මඟින් ස්වභාවික ආලෝකය භාවිතය ප්‍රශස්ත කිරීම.
- මගී පර්යන්ත ගොඩනැගිල්ලේ චලන සංවේදක, උපයෝජන සංවේදක භාවිත කිරීම.
- බල සාධක නිවැරදි කිරීම්, මාර්ගස්ථ හෝටලයේ යතුරු ටැග් සක්‍රිය කළ ප්‍රධාන ස්විච, ආහාර උණුසුම් කිරීම සඳහා "හොට් කබඩ්" වෙතින් ක්ෂුද්‍ර තරංග උඳුන් දක්වා මාරු වීම බලශක්ති ඉතිරියක් ඇති කරයි.
- කාර්යාල වේලාවෙන් පසු සහ සති අන්තයේ කාර්යාල පරිශ්‍රයේ වායු සමීකරණ භාවිතයෙන් වැළකී, විද්‍යුත් පංකා භාවිත කිරීම.
- ඉහළ පාරිසරික වටිනාකමක් ඇති ගුවන්තොටුපළ පරිශ්‍රයේ පිහිටි ගස් 200 ක් ගු.ගු.සේ.ස. හි කලපු භූමියේ නැවත සිටුවීම ආරම්භ කළ අතර, තවත් ගස් 200 ක් පමණ ඉදිකිරීම් කටයුතු සඳහා නොකපා එම ස්ථානයේම සංරක්ෂණය කිරීමට වෙන් කර ඇත. මෙම සංරක්ෂණ සැලැස්මට අමතරව, ගු.ගු.සේ.ස. විසින් බ.ජා.ගු. සංවර්ධන ව්‍යාපෘති සමඟ එක්ව නව රුක් රෝපණ කටයුතු ආරම්භ කර ඇත.

ස්වාභාවික සම්පත් පුනර්ජනනය උදෙසා සහය වීම

ආයතනික අවශ්‍යතා සපුරාලීම සඳහා විකල්ප සම්පත් සොයමින් ස්වභාවික සම්පත් මත යැපීම අවම කිරීමේ අභියෝගය ගු.ගු.සේ.ස. විසින් භාර ගෙන ඇත.

ජල සංරක්ෂණය - බ.ජා.ගු. හි දෛනික පානීය ජල අවශ්‍යතාවයෙන් 50% කට වඩා, ආසන්න වශයෙන් මුළු ඝන මීටර 2,200 ප්‍රමාණයෙන් ඝන මීටර 1,200 ක් පරිශ්‍රයේ ළිං ජලය මඟින් සපුරාලයි.

මානව තිරසාරත්වය අවහිර කරනු ලබන බාධක ඉවත් කිරීම

- **ශ්‍රී ලංකාවේ තෘතීයික අධ්‍යාපනය සඳහා සහය වීම**

සමාගම විසින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින්, ඩිප්ලෝමාධාරීන් සහ කාර්මික අභ්‍යාසලාභීන් සඳහා තොරතුරු තාක්ෂණ, මූල්‍ය, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික ඉංජිනේරු, සාමාන්‍ය පරිපාලන, ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය සහ මෝටර් රථ ඉංජිනේරු ඇතුළු විවිධ විෂයයන් පිළිබඳ පුහුණුව ලබා දෙයි.

- **කොවිඩ්-19 රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා රුපියල් මිලියන 10ක්.**

හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි වෛද්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා PCR පරීක්ෂණ යන්ත්‍රයක් සහ උපකරණ මිලදී ගැනීම සඳහා ගු.ගු.සේ.ස. විසින් රුපියල් මිලියන 10ක් පරිත්‍යාග කරන ලදී.

- **බ.ජා.ගු. සහ ඒ අවට තදබදය අවම කිරීම සඳහා නව රථවාහන සැලැස්මක්**

කටුනායක අවට මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් ඇවරිවත්ත හන්දියේ සිට ආයෝජන මණ්ඩල පිවිසුම දක්වා මංසන්ධි වැඩිදියුණු කිරීම් ඇතුළුව, මීටර් 660 ක් දිග මංතීරු හතරකින් යුත් ද්විත්ව මාර්ගයක් ඉදිකිරීමට සමාගම පියවර ගන්නා ලදී. ව්‍යාපෘතිය සඳහා ගු.ගු.සේ.ස. සහ මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) එක්ව අරමුදල් සපයන ලදී. ගු.ගු.සේ.ස. විසින් සමාගමේ අරමුදල්වලින් රුපියල් මිලියන 900 ක් වියදම් කරන ලදී. අධික රථවාහන තදබදය හේතුවෙන් ඇතිවන කාබන් විමෝචනය අවම කිරීමට දායක වන බැවින් මෙය පරිසර හිතකාමී ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලදී.




“අපි සංචාරක
ව්‍යාපාරය සහ
අනෙකුත් දේශීය
කර්මාන්ත
සඳහා පහසුකම්
සපයන්නෙමු...”

මූල්‍ය සමාලෝචනය



ආදායම

7,879 රු. මිලියන

(2020 රු. මිලියන 8,011)



මූල්‍ය ආදායම

3,321 රු. මිලියන

(2020 රු. මිලියන 3,665)



මෙහෙයුම් අලාභය

3,776 රු. මිලියන

(2020 රු. මිලියන 4,611)



බදු පසු අලාභය

2,084 රු. මිලියන

(2020 රු. මිලියන 2,504)



වත්කම්

126,844 රු. මිලියන

(2020 රු. මිලියන 103,216)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂයේ දී, පෙර වසරවල කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් ඇති වූ සිය මෙහෙයුම් අලාභ අඩු කර ගැනීමට ගු.ගු.සේ.ස සමත් විය. අඩු මගී සංඛ්‍යාව සහ ගුවන් යානා පැමිණීම් වර්ධන ඉලක්ක පිළිබඳ පුරෝකථනයට බාධාවක් වූ අතර, සමාගම 2020 වර්ෂයට සමාන ආදායමක් පවත්වා ගෙන ගිය නමුත්, ගෝලීය එන්නත් කිරීමේ ක්‍රියාවලියේ සහය ඇතිව, වසර අගභාගයේදී දේශසීමා සහ ගුවන් ගමන් නැවත ආරම්භ වූ බැවින්, වසර අවසානයේ සමාගම ධනාත්මක සටහනක් තබන ලදී. වසරේ සමස්ත කාර්යසාධනය ඍණාත්මකව තිබිය දී, සිව්වන කාර්තුව සඳහා මෙහෙයුම් ලාභයක් වාර්තා කිරීමට මෙය හේතු විය.

ගෝලීය සමාජ-ආර්ථික තත්ත්වයන් මත යැපෙන සහ බලපෑමට ලක්වන කර්මා-න්තයක් වීම තුළ, වසරේ මන්දගාමී ගෝලීය ප්‍රතිසාධනය, ආර්ථික සහ සෞඛ්‍ය ගැටලු 2021 වසරේ ව්‍යාපාරික මෙහෙයුම් කෙරෙහි ඍණාත්මකව බලපාන ලදී. කෙසේ වෙතත්, සමාලෝචිත මූල්‍ය වර්ෂය, 2020 වසර සමඟ සසඳන විට අගභාගයේ සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු ඉහළ ප්‍රවණතාවක් අත්විඳ ඇත.

වසංගතය හේතුවෙන් අඩුවෙන්ම බලපෑමට ලක්වූ ව්‍යාපාරික අංශය, භාණ්ඩ මෙහෙයුම් අංශය වේ. අඩු නිෂ්පාදනය හෝ රට වසා තැබීම හේතුවෙන් ආනයන හා අපනයන අවශ්‍යතා පහත වැටුණු මාස හැර, 2021 වසර තුළ භාණ්ඩ ප්‍රවාහනය සැලකිය යුතු ලෙස වර්ධනය විය.

සැලසුම්ගත ව්‍යාපෘති ඉදිරියට ගෙන යාමේ දී ගු.ගු.සේ.ස සැලකිලිමත් වූ අතර, වසංගත තත්වය මුල් කරගෙන ඇති වූ මූල්‍ය අර්බුදය හේතුවෙන් හට ගත් මූල්‍ය සීමා පාදක කරගෙන ව්‍යාපෘති ගණනාවක් අවලංගු කිරීමට සහ කල් දැමීමට සිදු විය.


ආදායම

ගු.ගු.සේ.ස හි සාම්ප්‍රදායික ආදායම් ප්‍රවාහ දේශ සීමා සහ රට වසා දැමීම හේතුවෙන් වසරේ වැඩි කාලයක් අක්‍රිය විය. කෙසේ වෙතත්, ගෝලීය වශයෙන් එන්නත් කිරීමේ ක්‍රියාවලිය සැකසීම සහ සංචාරක සීමාවන් ඉවත් කිරීමත් සමඟ ආදායම් මාර්ග වැඩිදියුණු වී, රු. මිලියන 7,879 ක් වාර්තා කර ඇත. මෙයින් රු. මිලියන 2,299 ක් ගගන නාවික මෙහෙයුම් මඟින් වූ අතර, ගගන නාවික නොවන ආදායම රු. මිලියන 5,087 කි. අනෙකුත් ආදායම් රු. මිලියන 493 ක් වාර්තා කර ඇත.

ප්‍රධාන ගගන නාවික ආදායම
- ගොඩ බැසීමේ සහ නැවතුම් ආදායම
- හරහා පියාසර ආදායම
- ගුවන් පාලම් ආදායම

ප්‍රධාන ගගන නාවික නොවන ආදායම
- අපගමන බද්ද
- අනුග්‍රාහක ගාස්තු
- බදු කුලී


සමාලෝචිත වර්ෂය තුළ සමාගම රු. මිලියන 2,299 ක ගගන නාවික ආදායමක් වාර්තා කර ඇති අතර, එය 2020 වසරේ ගගන නාවික ආදායමට සමාන වේ.




ගුවන් ගමනාගමන සංචලනයන් හි හැසිරීම

විස්තරය	2021	2020	2019	2018	2017
ජාත්‍යන්තර මගී සංචලනය	1,505,479	2,375,056	9,958,688	10,884,028	9,957,502
ජාත්‍යන්තර ගුවන්යානා සංචලනය	21,204	20,881	62,195	67,351	62,850
හරහා පියාසර සංචලනය	9,339	16,370	45,674	43,804	39,413
භාණ්ඩ සංචලනය	241,506 MT	150,075 MT	259,089 MT	279,559 MT	274,044 MT

මූල්‍ය සමාලෝචනය




සමාලෝචිත වර්ෂය සඳහා ගගන නාවික නොවන ආදායම රු. මිලියන 5,087 ක් වාර්තා වූ අතර, 2020 වසර සමඟ සසඳන විට එය 7% ට සමාන රු. මිලියන 399 ක අඩුවීමක් වේ. එසේ වුවද, ගගන නාවික නොවන ආදායම් හි අනෙකුත් කාණ්ඩ හරහා අපගමන බද්ද වැඩි වූ අතර, වසර තුළ මගී සංචලනය පහත වැටීම සහ තීරුබදු රහිත ව්‍යාපාරික ස්ථාන වෙත කුලී සහන ලබා දීම හේතුවෙන්, බදු කුලී ආදායම ඉහළ අනුපාතයකින් අඩු විය.



ලාභදායීත්වය


සමාලෝචිත වර්ෂය තුළ, අඩු වූ මෙහෙයුම් අලාභ අනුව, සමාගමේ ලාභදායීතාවය වර්ධනය විය. මෙහෙයුම් අලාභය පෙර වසරේ වාර්තා වූ රු. මිලියන 4,611 සිට රු. මිලියන 3,776 දක්වා 18% කින් අඩු වී ඇත. ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇමරිකානු ඩොලරය ශක්තිමත් වීමෙන් වැඩි වූ විනිමය ලාභ, පසුගිය වසරට වඩා මෙහෙයුම් අලාභ අඩු කිරීමට සහය විය.

සමාගම විසින් 2021 වසරේදී බදු ගෙවීමට පෙර රු. මිලියන 961 ක අලාභයක් වාර්තා කළේය. වර්ෂය සඳහා සමාගමේ බදු පසු අලාභය රු. මිලියන 2,084 කි.



මෙහෙයුම් වියදම්


ගු.ගු.සේ.ස හි මෙහෙයුම් වියදම් පෙර වසරේ රු. මිලියන 12,622 සිට 2021 වසරේදී රු. මිලියන 11,655 දක්වා අඩු වී ඇති අතර, එය 8% ක වෙනසක් වේ. මෙහෙයුම් වියදම් අවම කර ගැනීම සඳහා වියදම් කළමණාකරණ ප්‍රයත්න කිහිපයක් ක්‍රියාත්මක කළ අතර, මෙහෙයුම් වියදම් අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ, රු. මිලියන 1,244 කින් බොල් ණය ප්‍රතිපාදන ආපසු හැරවීමයි. ක්ෂයවීම් වියදම සහ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ද පිළිවෙලින් රු. මිලියන 207 කින් සහ රු. මිලියන 196කින් අඩු විය.



	2021	2020
කාර්ය මණ්ඩල පිරිවැය	64%	59%
ණයගැතියන්ගේ හානිකරණය සඳහා ප්‍රතිපාදන	-5%	5%
අලුත්වැඩියාව සහ නඩත්තුව	3%	2%
විදුලිය	7%	6%
ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය	23%	23%
වෙනත් වියදම්	8%	5%


ශුද්ධ මූල්‍ය පිරිවැය/ආදායම

මූල්‍ය ආදායම 9% කින් අඩු වුව ද, 2020 වසරේදී රු. මිලියන 1,497 ක අලාභයක් ව පැවති විදේශ ව්‍යවහාරික ණය මුදල් සහ තැන්පතු පරිවර්තනයෙන් රු. මිලියන 634 ක ශුද්ධ විනිමය ලාභයක් ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස, ශුද්ධ මූල්‍ය ආදායම රු. මිලියන 878 සිට රු. මිලියන 2,815 දක්වා 221% කින් වැඩි වී තිබේ. 2021 වසරේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වූ අතර, ජපන් යෙන් එකකට සාපේක්ෂව එහි අගය වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඇමරිකානු ඩොලර් වලින් නම් කරන ලද ස්ථාවර තැන්පතු වල පරිවර්තන ලාභය සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 771 සිට රු. මිලියන 2,775 දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, ණය පරිවර්තනය මත විනිමය අලාභය පෙර වසරේ වාර්තා වූ රු. මිලියන 2,268 සිට, 2021 වසරේදී රු. මිලියන 2,141 දක්වා පහත වැටුණි. ජපන් යෙන් වලින් නම් කරන ලද ණය වලින් මෙන්ම, වසර තුළ ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව අවප්‍රමාණය වූ ණය වලින් සමාගමේ ණය කළඹ සමන්විත වීම මගින් මෙය පැහැදිලි වනු ඇත.



විනිමය අනුපාත ලාභ


ශ්‍රී ලංකා රුපියල වසරින් වසර 7% කින් අවප්‍රමාණය වූ අතර, 2021 වසර අවසානයේ දී ශ්‍රී ලංකා රුපියල 203 ඇමරිකානු ඩොලරය (විකුණුම් අනුපාතය) දක්වා ඉහළ ගියේය. මහ බැංකුව විසින් ඩොලරයට සාපේක්ෂව රුපියල ස්ථාවර කිරීමට උත්සාහ කළ ද, රුපියල තවදුරටත් අවප්‍රමාණය වීම වළක්වා ගැනීම සඳහා මහ බැංකුව ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ස්ථාවර කිරීමෙන් පසු, අපනයන ඉපැයීම් සහ වාණිජ බැංකු හරහා රට තුළට එන ශ්‍රමික ප්‍රේෂණ අඩුවීම නිසා දිගින් දිගටම ඇමරිකානු ඩොලරය සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ විකුණුම් අනුපාත අවප්‍රමාණය විය. නමුත් ජපන් යෙන් සහ යුරෝ වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල පිළිවෙළින් 4% සහ 0.2% කින් අගය වැඩි වූ බව සටහන් විය.



මූල්‍ය තත්ත්වය


වත්කම්

2021 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය රු. මිලියන 126,844 ක් වූ අතර, එම කාලපරිච්ඡේදය ආරම්භයේ දී රු. මිලියන 103,216 ක් විය. ඒ අනුව, වසර ආරම්භයේ ප්‍රමාණයන්ට සාපේක්ෂව, මුළු වත්කම් ශේෂය රු. මිලියන 23,628 කින් වර්ධනය විය. II වන අදියර 2 වන පියවර ඉදිකිරීම් කටයුතු සහ වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ එකතු කිරීම, නොනිමි ප්‍රාග්ධනය වැඩිවීමට ප්‍රධාන හේතුව විය.



වගකීම්


සමස්ත වගකීම් රු. මිලියන 19,297 කින් වැඩි වී ඇති අතර, එය II වන අදියර ව්‍යාපෘතිය වෙනුවෙන් ණය ලබා ගැනීම තුළින් ප්‍රධාන වශයෙන් සිදු වී ඇත.



මූල්‍ය සමාලෝචනය

කාරක ප්‍රාග්ධනය

සමාලෝචිත වර්ෂය අවසානයේ දී, ගු.ගු.සේ.ස හි ජංගම වත්කම් සහ වගකීම් පිළිවෙලින් රු. මිලියන 47,430 සහ රු. මිලියන 7,927 ක් වූ අතර, ශුද්ධ කාරක ප්‍රාග්ධන ශේෂය රු. මිලියන 39,503 ක් විය. පෙර වසරට සාපේක්ෂව, කෙටි කාලීන ආයෝජන සහ මුදල් හා මුදල් සමාන දෑ හි අඟයන් රු. මිලියන 831 කින් අඩුවීම සහ කෙටි කාලීන ණය වගකීම් රු. මිලියන 550 කින් වැඩි වීම හේතුවෙන් කාරක ප්‍රාග්ධනය 5% කින් අඩු වී ඇත.



සමාගමේ මුළු වත්කම් පදනම වන රු. මිලියන 126,844 න් 33% ක්, කොටස් හිමියන්ගේ අරමුදල් සහ කොටස් හිමිකම විය.

ණය සහ ප්‍රාග්ධන ව්‍යුහය


2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු ණය ගැනීම් රුපියල් බිලියන 68.7 ක් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 34%ක වර්ධනයකි.

සමාගම විසින් විදේශීය ණය සහ දේශීය ණය සඳහා ප්‍රාග්ධන ආපසු ගෙවීම පිළිවෙලින් රු. මිලියන 4,289 ක් සහ රු. මිලියන 133 ක් විය. වර්ෂය තුළ "II වන අදියර 2 වන පියවර ව්‍යාපෘතිය" සඳහා රු. මිලියන 19,833 ක විදේශ මුදල් ණයක් ලබා දී ඇති අතර, දේශීය ණය කිසිවක් ලබාගෙන නොමැත.

2021 දෙසැම්බර් 31 වන විට, කොටස් හිමියන්ගේ අරමුදල් සහ හිමිකම් සමාගමේ මුළු වත්කම් පදනම වන රු. මිලියන 126,844 න් 33% ක් ද, ජංගම නොවන වගකීම් 61% ක් ද, ජංගම වගකීම් 6% ක් ද විය. වසර ආරම්භය සමඟ සසඳන විට සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහයේ සැලකිය යුතු වෙනසක් සිදු නොවීය.

පෙර වසර අවසානයේ පැවති 1.38 ක වටිනාකම සමඟ සැසඳීමේ දී, වත්මන් වර්ෂය අවසානයේ දී ණය සහ හිමිකම් අනුපාතය 1.66 ක් විය.

මුදල් ප්‍රවාහය



කාල සීමාව අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ රු. මිලියන 413 දක්වා 50% කින් අඩු විය. කෙටිකාලීන මුදල් ප්‍රවාහ අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන අර්ධ වශයෙන් ඉවත් කර ගැනීම මේ සඳහා හේතු වන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ, මෙහෙයුම් ක්‍රියාකාරකම් හේතුවෙන් 2020 වසරේදී සිදු වූ රු. මිලියන 2,116 ක මුදල් පිටතට ගලායාමට සාපේක්ෂව, රු. මිලියන 715 ක ශුද්ධ මුදල් පිටතට ගලායාමක් සිදු විය.

පෙර වසරේ රු. මිලියන 1,654 ක ශුද්ධ මුදල් පිටතට ගලා යාම සමඟ සසඳන විට, සමාගම හි රු. මිලියන 413 ක ශුද්ධ මුදල් ගලායාමක් සිදු විය.

ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳ සමාගමේ ක්‍රමෝපායන් හි මූලික ඉලක්කය වන්නේ, එහි මෙහෙයුම් පවත්වා ගැනීමට සහ කොටස් හිමියාගේ වටිනාකම උපරිම කර ගැනීම සඳහා ශක්තිමත් ප්‍රාග්ධන ව්‍යුහයක් සහ සාර්ථක ප්‍රාග්ධන අනුපාත පවත්වා ගැනීම යි. පහත දැක්වෙන පරිදි සමාගම විසින් එහි සම්පූර්ණ තෝලන අනුපාතය භාවිත කරමින් ප්‍රාග්ධන උපයෝජනය නිරීක්ෂණය කරයි.

	2021	2020
මුළු ණය ගැනීම්	68,724,683,990	51,172,796,305
අඩු කිරීම: මුදල් සහ මුදල් සමාන දෑ (සටහන 17)	(413,045,010)	(826,225,883)
අඩු කිරීම: කෙටි කාලීන බැංකු තැන්පතු	(41,515,132,946)	41,932,637,264)
ශුද්ධ ණය	26,796,506,034	8,413,933,157
මුළු හිමිකම්	41,314,321,699	36,982,901,554
මුළු ප්‍රාග්ධනය	68,110,827,732	45,396,834,712
තෝලන අනුපාතය	39%	19%


වර්ෂය තුළ රු. මිලියන 2,084 ක ශුද්ධ අලාභයක් සිදු වුව ද, කොටස් හිමියන්ගේ අරමුදල් රු. මිලියන 36,982 සිට රු. මිලියන 41,314 දක්වා 12% කින් වැඩි වී ඇත. මෙම වැඩිවීමට ප්‍රධානතම හේතුව වූයේ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය හේතුවෙන් රු. මිලියන 5,766 ක ප්‍රත්‍යාගණන සංචිතයක් පැවතීමයි.

අගය එකතු කිරීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් ('000) හි අගයන්

	2021	2020
ආදායම	7,386,170	7,776,338
වෙනත් ආදායම්	492,782	234,400
මූල්‍ය ආදායම	3,321,110	3,665,085
ආයුගණක උපකල්පනයේ වෙනස්කම් මත ඇතිවන ලාභය	667,426	377,899
	11,867,489	12,053,722
පරිපාලන, ආයතනික සහ වියදම්	(1,509,513)	(2,345,566)
අගය එකතු කිරීම	10,357,976	9,708,155

එකතු කළ අගය බෙදා හැරීම			%		%
සේවකයින් වෙත	වේතන සහ ප්‍රතිලාභ	7,496,875	72%	7,421,979	76%
රජය වෙත	බදු	-	0%	-	0%
කොටස් හිමියන් වෙත	ලාභාංශ	-	0%	-	0%
ණය ප්‍රාග්ධනය සපයන්නන්ට	පොලී	1,140,366	11%	1,289,674	13%
ව්‍යාපාරය තුළ රඳවා ගන්නා ලද	ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය	2,648,419	26%	2,853,960	29%
ව්‍යාපාරය තුළ රඳවා ගන්නා ලද	සංචිත	(927,685)	-20%	(1,857,458)	-19%
		10,357,976	100%	9,708,155	100%



මානව ප්‍රාග්ධන කළමනාකරණය



මානව ප්‍රාග්ධනය, ගු.ගු.සේ.ස. හි ඉපැයීමේ විභවය සහ දිගු කාලීන ශක්‍යතාවයේ වැදගත්ම සාධකය වන බැවි අප සහතික වන්නෙමු. ගු.ගු.සේ. සමාගම හි මානව සම්පත් උපායමාර්ගය වනුයේ, හොඳම දක්ෂතා සහ ව්‍යක්තිකයන් ආකර්ෂණය කර ගැනීම, තෝරා ගැනීම, අභිප්‍රේරණය කිරීම, සංවර්ධනය කිරීම සහ රඳවා තබා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම සහ ස්ථාපිත කිරීමයි.

අපගේ මානව ප්‍රාග්ධන කළමනාකාරිත්වය මඟින් සමස්ත ආයතනික දිශානතියට මෙන්ම, ආයතනික ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඵලදායී ලෙස දායක වීමට සේවකයින්ට ඉඩ ලබා දී ඇත. මේ සඳහා තෝරා ගැනීම් සහ බඳවා ගැනීම්, කාර්යසාධන කළමනාකරණය, පුහුණු සහ සංවර්ධනය සහ සුබසාධනය ඇතුළත් වන නමුදු එය ඊට පමණක් සීමා නොවේ.

ගු.ගු.සේ.ස. හි මානව ප්‍රාග්ධනය වසර ගණනාවක් තිස්සේල ආයතනයේ දිගුකාලීන සාර්ථකත්වය සහතික කිරීම උදෙසා නිර්මාණාත්මක යොමුකිරීමක් ලබාදීම හා ඉගෙනීමට, අනුවර්තනය වීමට, නව්‍යකරණය කිරීමට අභිප්‍රේරණය කර ඇත. රාජ්‍ය අංශයේ වඩාත්ම ගෞරවනීය ආයතනයක් ලෙස, ගු.ගු.සේ.ස. ගුවන් සේවා ක්ෂේත්‍රයේ මෙන්ම සාමාන්‍ය විෂයන් පිළිබඳ ශ්‍රී ලංකාව සතු හොඳම දක්ෂතා ආකර්ෂණය කර ගෙන ඇත.

මානව ප්‍රාග්ධනය පිළිබඳ පැතිකඩ

අඛණ්ඩ සේවා සැපයීම සහ ආයතනික පොදු වටිනාකම් නිර්මාණය කිරීම තුළින් සමාගමේ තිරසාර වර්ධනයට දායක වන විවිධ දක්ෂතා සහිත සේවකයින් 3,985 ක කණ්ඩායමක් (2021 වසර අවසානය වන විට) ගු.ගු.සේ.ස. සතුව.

පැතිකඩ	මිනුම්	වර්ෂය		
		2021	2020	2019
කණ්ඩායමේ ශක්තිය	සේවකයින් සංඛ්‍යාව	3,985	4,098	4,182
සේවකයින් ඉල්ලා අස්වීමේ අනුපාතිකය	සේවකයින්ගේ සාමාන්‍ය ප්‍රතිශතයක් ලෙස සේවක පිරිවැටුම (%)	4.1	3.4	3.1
ස්ත්‍රී/ පුරුෂභාවය අනුව ව්‍යාප්තිය	සමස්ත සේවකයින්ගෙන් ප්‍රතිශතයක් ලෙස සේවිකාවන් (%)	22	21	21
වයස අනුව ව්‍යාප්තිය	වයස අවුරුදු 40ට අඩු සේවකයින්ගේ ප්‍රතිශතය (%)	48	68	51
දැනුම සහ හැකියා සංවර්ධනය	සේවකයෙක් සඳහා ලබා දී ඇති සාමාන්‍ය පුහුණු කාලය	35	9	12

විවිධ කාණ්ඩවලට සේවකයින්ගේ ව්‍යාප්තිය පිළිබඳ පහත දැක්වේ.

අංක	කාණ්ඩය	සේවකයින් ගණන
1	විධායකයින්	376
2	සුපරීක්ෂක /තාක්ෂණික නිලධාරීන්	262
3	ලිපිකාර සහ සමාන්තර ශ්‍රේණි	686
4	පුහුණු සහ අර්ධ පුහුණු කම්කරුවන්	2,093
5	සුළු සේවකයින් සහ නුපුහුණු සේවකයින්	560
6	සාමාන්‍ය සහ පුහුණු	8
	එකතුව	3,985



සේවක බඳවා ගැනීම් සහ රඳවා තබා ගැනීම

සමාලෝචිත වර්ෂය තුළ, පහත දැක්වෙන පරිදි විවිධ මූලාශ්‍රවලින් දක්ෂතා උකහා ගැනීමට ගු.ගු.සේ.ස. සමත් විය.

පිළිවෙල	කාණ්ඩය	සංඛ්‍යාව
1.	බාහිර බඳවා ගැනීම්	72
2.	අභ්‍යන්තර බඳවා ගැනීම්	29
3.	ස්ථාවර සේවක සංඛ්‍යාව තුළ සිදු කළ උසස් කිරීම්	99
4.	රේඛීය උසස්කිරීම්	316
	මුළු සංඛ්‍යාව	516



මානව ප්‍රාග්ධනය කළමනාකරණය

බඳවා ගැනීම, රඳවා ගැනීම සහ උසස් කිරීමේ ක්‍රියාවලිය

සේවක ඵලදායිතාව සහ තෘප්තිය වැඩි කරන අතරම, නවමු දක්ෂතා ආකර්ශනය කර ගැනීමට, පවතින කුසලතා රඳවා ගැනීමට සහ දිරිගැන්වීම උදෙසා සමාගම සැලකිය යුතු වැදගත්කමක් ලබා දෙයි. එමඟින් සේවකයාට සහ ආයතනයට වටිනාකමක් එක් කරයි.

මානව සම්පත් (HR) අංශය සමාගම හි සේවක රඳවා තබා ගැනීම සහ පිරිවැටුම අඛණ්ඩව අධීක්ෂණය කරන අතර, කාර්ය මණ්ඩල අවශ්‍යතා සපුරාලීමට උත්සාහ කරයි. මානව සම්පත් අංශය හොඳම දක්ෂතා ලබා ගැනීමට සහ ඔවුන් සුදුසු වෘත්තීය මාර්ගවල ස්ථානගත කිරීම සඳහා පුළුල් වූ තෝරා ගැනීමේ, බඳවා ගැනීමේ සහ උසස්වීම් ලබාදීමේ ක්‍රමයක් අනුගමනය කරයි.

මාර්ගගත බඳවා ගැනීමේ පරීක්ෂණ

ගු.ගු.සේ.ස. ඉතිහාසයේ ප්‍රථම වතාවට, බාහිර අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා මාර්ගගත බඳවා ගැනීමේ පරීක්ෂණයක් පවත්වන ලදී. "ගුවන් ගමනාගමන ආරක්ෂණ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු නිලධාරීන්" බඳවා ගැනීම් සඳහා ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමිය විසින් 2021 සැප්තැම්බර් මාසයේදී බාහිර අයදුම්කරුවන් සඳහා මෙම මාර්ගගත බඳවා ගැනීමේ පරීක්ෂණය සාර්ථකව පවත්වන ලදී. අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට මෙය නව අත්දැකීමක් වූ බැවින් ඔවුන්ගේ යහපත උදෙසා පුහුණු පරීක්ෂණයක් ද පවත්වන ලදී.

සම්පූර්ණ පරීක්ෂණ පසුබිම ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමියේ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු පුහුණු අංශය විසින් සංවර්ධනය කරන ලද අතර, තොරතුරු තාක්ෂණ අංශය විසින් සපයන ලද සහ සහය දක්වන ලද සත්කාරක යටිතල පහසුකම් භාවිත කරමින් පරිපාලනය සිදු කරන ලදී.

සේවක වටිනාකම් නිර්මාණය

කුසලතා සංවර්ධනය කිරීම

අධීක්ෂකවරයා සමඟ සාකච්ඡා කර, කාලානුරූපීව සිදුවන කාර්යසාධන ඇගයීම් පෝරමයේ, ඔවුන්ගේ ප්‍රධාන කාර්යසාධන දර්ශකය සහ සංවර්ධන ඉලක්ක සැකසීමේ දී, ඊට සමගාමීව සේවකයින්ගේ පුහුණු අවශ්‍යතා ද හඳුනා ගැනේ. මෙසේ හඳුනාගන්නා පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය කර, වාර්ෂික පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා මානව සම්පත් අංශය විසින් පවත්වා ගෙන යනු ලබන වෙනම ලැයිස්තුවලට එකතු කරනු ලැබේ. මෙසේ එකතු කරන ලද දත්ත මත පදනම්ව, මානව සම්පත් අංශය දේශීය සහ ජාත්‍යන්තර පුහුණු සැසි හඳුනා ගනිමින්, අභිරුචිකරණය කළ, සාමාන්‍ය පුහුණු සහ කුසලතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කරයි.

ව්‍යාපාර රික්තකය සමනය කිරීම

ව්‍යාපාරික අභියෝගවලට මුහුණ දීම සඳහා අභ්‍යන්තර ව්‍යාපාර ව්‍යුහය 'ශක්තිමත්' බව සහතික කරනු වස් ගු.ගු.සේ.ස. විසින් අඛණ්ඩව ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන ලදී. සමාගමේ විවිධ අංශ වෙත පවරන ලද වගකීම්වල යම් හිඩැසක් නිසා එය තරඟකාරිත්වයට බාධාවක් වන්නේ නම්, එම බාධා ඉවත් කිරීමට ව්‍යාපාරික උපායමාර්ගය වලට අනුකූලව අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කරන ලදී. එවැනි හඳුනාගත් රික්තයන් පිරවීම සඳහා නව තනතුරු නිර්මාණය කරනු ලබයි. 2021 වසරේ දී ගුවන් භාණ්ඩ ප්‍රවාහන කළමනාකරණ අංශය පිහිටුවීම මෑත කාලයේදී ගත් එවැනි පියවරකි.

අලුතින් පිහිටු වන ලද අංශයේ ප්‍රධාන තනතුරු සඳහා අභ්‍යන්තරව වඩාත් සුදුසු අපේක්ෂකයින් හමු නොවූ අවස්ථාවක, බාහිර අයදුම්කරුවන් තෝරා ගන්නා ලදී. සිවිල් ගුවන් පුහුණු අංශයේ නිලධාරීන් විසින් මාර්ගගත විභාගය නිරීක්ෂණය කරනු ලබයි.




CATD නිලධාරීන් මාර්ගස්ථ විභාගය අධීක්ෂණය කරමින්

ගු.ගු.සේ.ස. සේවක කාර්යසාධනය ඇගයීම සහ පිළිගැනීම

කාර්යසාධන කළමනාකරණ පද්ධතිය මඟින්, සමාගමේ අරමුණු සහ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින්, කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වේ. පුහුණු සහ සංවර්ධන අවස්ථා, වෘත්තීය සංවර්ධන අවස්ථා මෙන්ම, කාර්යසාධන වෙනස්කම්, පුහුණු අවශ්‍යතා, උසස්වීම් සහ ඇගයීම් සඳහා අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවලියට කාර්යසාධන ප්‍රතිඵල සම්බන්ධ වේ.

කාර්යසාධන කළමනාකරණ පද්ධතිය හරහා පසුගිය වසරේ දී (2021) සේවකයන් 3071ක් කාර්යසාධනය ඇගයීමට ලක් කළ අතර, සේවක කාර්යසාධනය මත පදනම්ව වාර්ෂික වැටුප් වර්ධක ලබා දෙන ලදී.



✈ ගු.ගු.සේ.ස. හි දී ගුවන් ගමන් පාලකවරුන්ගේ ජාත්‍යන්තර දිනය සැමරීම

ගුවන් ගමන් සුරක්ෂිත කිරීම සඳහා දිවා රාත්‍රී සේවය කරන ගුවන් ගමන් පාලකවරුන් විසින් ඉටු කරන ලද සේවාවන්ට උපහාරයක් වශයෙන්, ගුවන් ගමන් පාලකවරුන්ගේ ජාත්‍යන්තර දිනය 2021 ඔක්තෝම්බර් 25 වන දින ගු.ගු.සේ.ස. හි දී සමරන ලදී. ශ්‍රී ලංකාවේ ගුවන් කලාපය ලෝකයේ සුරක්ෂිතම ගුවන් කලාපයන්ගෙන් එකකි. සෑම වසරකම ඔක්තෝබර් 20 වන දින, 1961 දී එම දිනයේම ආරම්භ කරන ලද ජාත්‍යන්තර ගුවන් ගමන් පාලකවරුන්ගේ සංගමය (IFATCA) හි සංවත්සරය සනිටුහන් කරයි.





ගුවන් ගමන් පාලකවරුන්ගේ දිනය සැමරීමට සමගාමීව මෙම මාර්ගගත සම්මන්ත්‍රණය පැවැත්විණි.

සේවක සංවර්ධනය

වසංගත තත්වය අතරතුර මුහුණ දුන් අභියෝග මධ්‍යයේ වුවද, සේවකයින්ට ඔවුන්ගේ හැකියාවන් දියුණු කරලීමට අවශ්‍ය දැනුම ලබා ගැනීම සහතික කිරීම සඳහා, ගු.ගු.සේ.ස. විසින් පුහුණුව සහ සංවර්ධනය සඳහා අඛණ්ඩව ආයෝජනය කරන ලදී.

වර්ෂය තුළ, ගු.ගු.සේ.ස. කාර්ය මණ්ඩල සාමාජිකයින් 974 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මුළු පුහුණු පැය 34,442 ක් පවත්වන ලදී. 'නව සාමාන්‍යය තත්වයන්ට' අනුකූලව, සෞඛ්‍ය මාර්ගෝපදේශ දැඩි ලෙස අනුගමනය කරමින්, පුහුණු පැයවලින් 90% ක් මාර්ගගත පුහුණු ක්‍රමය භාවිතයෙන් පවත්වන ලදී. ගු.ගු.සේ.ස. සේවකයින් සඳහා වසර තුළ පුහුණුව ලබා දීමෙන් ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමිය දළ වශයෙන් රුපියල් මිලියන 600 ක ඉතිරියක් ලබා ගත් අතර, එසේ නොවුවහොත් එය බාහිර පුහුණුව සඳහා වැය වනු ඇත.

පුහුණුව ලබා දීමේ පරමාර්ථය, වැඩ ආශ්‍රිත කුසලතා වැඩි දියුණු කිරීමට පමණක් සීමා නොවූ අතර, එය පෞරුෂ සංවර්ධනය, චිත්තවේගීය ස්ථාවරත්වය සහ ශාරීරික යෝග්‍යතා නඩත්තුව දක්වා ව්‍යාප්ත විය.

මානව ප්‍රාග්ධනය කළමනාකරණය

✈ **ගුවන් ගමන් පාලන විඩම්බකය යොදා ගනිමින් සිදු කළ නිරීක්ෂණ පාලන පාඨමාලාව** (Surveillance Control Course)
ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමියේ (SLAAA) ගුවන් ගමන් සේවා පුහුණු අංශය විසින් 2021 සැප්තැම්බර් මාසයේදී ගුවන් ගමන් නියාමකවරුන් හය දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා නව Adacel MaxSim 3D විඩම්බකය භාවිත කරමින් සිය පළමු නිරීක්ෂණ පාලන පුහුණු වැඩසටහන පවත්වන ලදී.

මෙය ශ්‍රී ලංකාවේ දෙවන වරට පවත්වන ලද නිරීක්ෂණ පාලන පුහුණු වැඩසටහනයි. 2007 වසරේ දී ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමියේ (SLAAA) පැරණි විඩම්බකය මත පළමුවැනි පුහුණුව සිදුවිය. නිරීක්ෂණ පාලන ශ්‍රේණිගත කිරීම මඟින් ගුවන් ගමනාගමන නියාමකවරුන් සඳහා වෘත්තීය සංවර්ධනයේ උච්චතම අවස්ථාව සලකුණු කරයි. ඇකඩමියේ ගුවන් ගමනාගමන සේවා පුහුණු අංශයේ ප්‍රධාන උපදේශකවරයාට සහය වීම සඳහා සේවාවෙන් විශ්‍රාම ගිය මනා පළපුරුද්දක් ඇති ජෙෂ්ඨ ගුවන් ගමන් පාලකවරුන් තිදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමියේ (SLAAA) උපදේශකයන් ලෙස අනුයුක්ත කරන ලදී.

✈ **ගුවන් ආරක්ෂාව යටතේ කඩිනම් යෙදවුම් කණ්ඩායම** (Rapid Deployment Team)
නොහික්මුණු සහ ප්‍රචණ්ඩකාරී මඟින්, අනෙක් මඟින්ට කරදරයක් හෝ බාධා කිරීමකින් තොරව හැකි ඉක්මනින් කළමනාකරණය කිරීමේ අරමුණින්, ගුවන් ආරක්ෂාව සහතික කිරීම සඳහා නිරායුධ සටන් ක්‍රම සහ කරාතේ වැනි සටන් කුසලතාවන්ගෙන් යුතු කණ්ඩායමක් පුහුණු කරන ලදී. මෙය ගුවන් තොටුපළ මෙහෙයුම් සඳහා නව හඳුන්වාදීමක් වන අතර, ඔවුන් දවස පුරා බ.ජා.ගු මඟී පර්යන්තවල සේවයේ යොදවා ඇත.





සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව

ගු.ගු.සේ.ස. විසින් සියළුම සේවකයින් සඳහා ආරක්ෂිත සේවා පරිසරයක් සහතික කිරීම කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කර ඇති අතර, සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගැටලු වලට ප්‍රමුඛතාවය දී ඒවාට විසඳුම් ලබා දීම සහතික කිරීමට පියවර ගන්නා ලදී. වසංගතය පැතිරීමත් සමඟ, ගුවන්තොටුපළ ඊට වඩාත් නිරාවරණය වූ අතර, එය ගුවන් සේවා කර්මාන්තය අයහපත් ලෙස බලපාන ලදී. මෙම තත්ත්වයට මුහුණදීම සඳහා ගු.ගු.සේ.ස. විසින් දැඩි ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- කොවිඩ් 19 ආශ්‍රිත කාරණා සම්බන්ධයෙන් ක්‍රියාශීලීව සහ කඩිනමින් කටයුතු කිරීම සඳහා මෙහෙයුම් කමිටුවක් පිහිටුවන ලදී.
- රජයේ ආරක්ෂක මාර්ගෝපදේශයන්ට අනුකූලව, මසකට රු. මිලියන 3.2 ක් වටිනා ආරක්ෂක ආම්පන්න අදාළ සියලුම සේවකයින් වෙත ලබා දෙන ලදී.
- මාත්‍රා 16,000 කට අධික ප්‍රමාණයක් වූ කොවිඩ් 19 එන්නත් ගු.ගු.සේ.ස. හි සේවකයින්ට සහ ගුවන් තොටුපළ හි අනෙකුත් ආයතනවල සේවය කරන සේවකයින්ට, මුරකරුවන්ට, බඩු රැගෙන යන සේවකයින්ට සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය මණ්ඩලයට ලබා දෙන ලදී.
- රෝග ලක්ෂණ සහිත සේවකයින් සඳහා නොමිලේ RAT/ PCR පරීක්ෂණ පහසුකම් සහ අතරමැදි මධ්‍යස්ථාන සංවිධානය කරන ලදී.



- ආසාදිත සේවකයින් සඳහා පෞද්ගලික සහ රජයේ රෝහල්වල සත්කාර මධ්‍යස්ථාන පහසුකම් ලබා දුන් අතර, විශේෂ වැටුප් සහිත නිවාඩු, සුභසාධන සහන ලබා දෙන ලදී.
- නිවසේ සිට රැකියා කටයුතු කිරීම (WFH) හඳුන්වා දෙමින්, එය පවත්වා ගෙන යාමට අවශ්‍ය උකරණ සේවකයින්ට ලබා දෙන ලදී.
- කොවිඩ් හේතුවෙන් සංචරණ සීමා පනවන ලද ප්‍රදේශ වල පදිංචිය සහ රාජකාරියේ නියැලීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ඕනෑම අවස්ථාවක මුළු සේවක සංඛ්‍යාවෙන් තුනෙන් එකක් හෝ අඩකට අනුගත වෙමින් දෛනික රාජකාරි කටයුතු වල නියැලෙන සේවක සංඛ්‍යාව හි වෙනස්කම් සිදු කරන ලදී.

සේවක සුභසාධනය සහ තෘප්තිය

කාර්ය මණ්ඩලය අතර සේවා-ජීවිත සමතුලිතතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් සේවක සුභසාධන පහසුකම් ආරම්භ කරන ලදී. මෙහි වේතනවලට අමතරව සපයනු ලබන පහසුකම් සහ සේවාවන් ඇතුළත් වේ.

ගු.ගු.සේ.ස. සේවකයින් සඳහා ප්‍රතිලාභ යෝජනා ක්‍රම

ආයතනයේ සේවකයින් සඳහා ආකර්ශනීය ප්‍රතිලාභ ලබාදීමේ වැදගත්කම ගු.ගු.සේ.ස. විසින් හඳුනාගෙන ඇත. කාර්යමණ්ඩල තෘප්තිමත් මට්ටම් ඉහළ නැංවීම සඳහා සමාගම ප්‍රතිලාභ රැසක් ලබා දුන්නේය. ආයතනික වෛද්‍ය පහසුකම් ක්‍රමය, කාර්යමණ්ඩල ණය යෝජනා ක්‍රමය, කාර්යමණ්ඩල ප්‍රවාහන සේවා, පුද්ගලික අනතුරු රක්ෂණය, නිවාඩු බංගලා පහසුකම්, මේ යටතේ අබණ්ඩව ලබා දුන් ප්‍රතිලාභ කිහිපයක් වන අතර, මේ සඳහා ගු.ගු.සේ.ස. විසින් වාර්ෂිකව රුපියල් මිලියන 415 ක පිරිවැයක් දරන ලදී.

සන්නාමයේ අගය පවත්වා ගෙන යාම

ගු.ගු.සේ.ස., රාජ්‍ය අංශයේ වැඩිම ඉල්ලුමක් ඇති සේවා යෝජකයෙකු ලෙස පිළිගැනෙන අතර, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ කීර්තිමත් සම්මාන සහ ඇගයීම් වලින් පිදුම් ලබා ඇත. සන්නාමයේ ප්‍රතිරූපය, දක්ෂතා ආකර්ෂණය කර ගැනීමට සහ පැවැත්ම සඳහා උපකාරී වේ.

රැකියා සුරක්ෂිතභාවය

'රැකියා සුරක්ෂිතතාව' සේවකයින්ට වඩා හොඳින් ක්‍රියා කිරීමට මානසික ස්ථාවරත්වයක් ඇති කරන බැව් සැලකිල්ලට ගනිමින්, ගු.ගු.සේ.ස. විසින් මූල්‍ය අභියෝග මධ්‍යයේ මෙම වසර තුළ 'කාර්ය මණ්ඩලය ඉවත් නොකිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. ලොව පුරා ගුවන් සමාගම් සහ ගුවන් තොටුපළවල් පිරිවැය ඉතිරි කිරීමේ උපායමාර්ගයක් ලෙස කාර්ය මණ්ඩල අවමකිරීම් අනුගමනය කළ අවස්ථාවේ මෙය ක්‍රියාත්මක විය.

"බිරේන් චැම්ප්ස්"

ගු.ගු.සේ.ස. හි ව්‍යාපාරික කටයුතු සහ කර්මාන්ත ප්‍රවණතා සහ ප්‍රවෘත්ති පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම සඳහා, 'බිරේන් චැම්ප්ස්' යන ප්‍රශ්න විචාරාත්මක සැසිය ගු.ගු.සේ.ස. විසින් 2021 වසරේදී සංවිධානය කරන ලදී. මාසිකව පවත්වනු ලබන සැසිය, මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී. ජයග්‍රාහකයින් පැය 24 ක් ඇතුළත ප්‍රකාශයට පත් කරන ලදී. පවත්වන ලද ප්‍රශ්න විචාරාත්මක සැසි අටෙන්, ජයග්‍රාහකයින් 48 දෙනෙකුට ඇගයීම් ත්‍යාග සහ සහතික පත් ප්‍රදානය කරන ලද අතර, ඉහළම ජයග්‍රාහකයින් හට දේශීය ගුවන් සේවා හවුල්කරුවෙකු විසින් අනුග්‍රහය දක්වන ලද දේශීය ගුවන් චාරිකාවක් ප්‍රදානය කරන ලදී.



මානව ප්‍රාග්ධනය කළමනාකරණය



ක්‍රීඩා ක්‍රියාකාරකම් නංවාලීම

මානව ප්‍රාග්ධනය කළමනාකරණය

ගු.ගු.සේ.ස. විසින් ක්‍රිකට්, වොලිබෝල්, පැසිපන්දු, එල්ලේ, පිහිනුම්, පාපන්දු, හොකී සහ බැඩ්මින්ටන් වැනි ක්‍රීඩා වල නිරත වීමට සේවකයින් දිරිමත් කරමින් ඔවුන්ගේ කුසලතා සහ කණ්ඩායම් ගොඩනැගීම සිදු කරයි. සමාගමේ ක්‍රීඩා සමාජය විසින් වසර පුරා සිය සාමාජිකයින් සඳහා ක්‍රීඩා සංවර්ධන කටයුතු දියත් කරන ලදී.

ගු.ගු.සේ.ස. කණ්ඩායම වෙළඳ සේවා තරඟාවල ඇතුළුව බොහෝ ක්‍රීඩා ඉසව් සඳහා සහභාගී වූ අතර සම්මාන කිහිපයක් දිනා ගත්තේය.





මානව ප්‍රාග්ධනය සඳහා අනාගත දැක්ම

වෙළඳසේවා බැඩ්මින්ටන් තරඟාවලියේ ජයග්‍රාහකයින්

✈ අභිලාෂයන් සකස් කිරීම

කාර්යසාධන ඇගයීම් ආකෘති පත්‍ර සහ උපස්වීම් සම්මුඛ පරීක්ෂණ මගින් සේවක අභිලාෂයන් හඳුනා ගැනේ. ඔවුන් ආයතනික අභිලාෂයන් සමඟ පෙළගැස්වීමෙන් සමාගම් උපායමාර්ගික උත්සාහයන් තුළ හඳුනා ගනු ලැබේ.

✈ ව්‍යාපාර පරිණතභාවයේ ඉහළ මට්ටමට ළඟා වීම උදෙසා කුසලතා සහ නිපුණතා සකස් කිරීම

අති නවමු තාක්ෂණික විශේෂාංග භාවිතයෙන් බ.ජා.ගු. හි හැසිරවීමේ ධාරිතාව 1.5 ගුණයකින් වැඩි කිරීමෙන් නවීන ව්‍යාපාරික පරිණතභාවයක් ලබා ගත හැකි බව ගු.ගු.සේ.ස. විශ්වාස කරයි. මගී පර්යන්තය හැසිරවීමේ අභියෝගය භාර ගැනීමට සේවකයන් 'අනාගතය සුදානම් කරලීම සඳහා නිපුණතා වෙනස්කම් හඳුනා ගනිමින් පරතරය පියවා ගැනීමට අවශ්‍ය වැඩසටහන් සකස් කරමින් පවතී.

✈ අනුප්‍රාප්තික සැලසුම්කරණය

අනුප්‍රාප්තික සැලසුම්කරණය සඳහා සියලුම ප්‍රධාන තනතුරු හඳුනා ගනිමින් විස්තීර්ණ අනුප්‍රාප්තික සැලසුම් වැඩසටහනක් සංවර්ධනය කෙරේ. මෙයට අන්‍යෝන්‍ය මාරුවීම් සහ උපස්වීම් ඇතුළත් වේ. මේ සඳහා වර්ධනය සහ රැකියා මට්ටම අතර වගකීම්, කුසලතා සහ නිපුණතා සපුරාලීමට අවශ්‍ය වනු ඇත.

✈ මිනිස්බල සැලසුම් කිරීම

දැනට සිටින සේවකයින්ගේ විභවයන් වඩා හොඳින් උපයෝගී කර ගැනීම සඳහා, ගු.ගු.සේ.ස. විසින් ඉදිරි වසර කිහිපය තුළ අමතර සේවක සංඛ්‍යාවකින් තොරව එම සේවක සංඛ්‍යාවම පවත්වාගෙන යාමට උත්සාහ කරයි.

අවස්ථාවන් සඳහා සේවකයින් වෙත දොරටු විවෘත කිරීම

දොරටු විවෘත කිරීම යනු, සමස්ත ගුවන් සේවා අගය දාමයේ ඉදිරිපෙළ කාර්යාල කටයුතු සහ පහු කාර්යාල කටයුතු ද වර්ධනය කරන්නක් බැවින්, දෙවන පර්යන්තය හරහා දැනට සිටින සේවකයින්ට මෙන්ම ගු.ගු.සේ.ස. හි සෘජු රැකියා යටතේ මෙන්ම, අනෙකුත් පාර්ශවකරුවන් යටතේ ගුවන් සේවා අංශයේ රැකියා සොයන අපේක්ෂකයින්ට ද වටිනා අවස්ථාවන් නිර්මාණය කිරීමයි.



අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය ආයතනයක ඉදිරි සැලසුම් නිර්වචනය කිරීම සඳහා ඉතාමත් තීරණාත්මක ක්‍රියාවලියකි. එලදායී අවදානම් කළමනාකරණය අපගේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන අතර එමඟින් වඩාත් හොඳ ශ්‍රී ලාංකේය අත්දැකීමක් දෛනික පදනම්න් ජාත්‍යන්තර ගුවන් මඟීන්හට ලබා දීමට හැකිය.

අපි, ශ්‍රී ලංකා රජයේ (GoSL) ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස බ.ජා.ගු., ම.රා.ජා.ගු., කො.ජා.ගු.ර., යා.ජා.ගු. සහ ම.ජා.ගු. යන ජාත්‍යන්තර ගුවන්තොටුපළ 5 හි කළමනාකරණ සහ සංවර්ධන කටයුතු සිදු කරන්නෙමු. ඒ අනුව, ආයතනයේ මෙහෙයුම් සහ මූල්‍ය කාර්යසාධනයට පමණක් නොව, රටේ ප්‍රතිරූපයට ද තර්ජනයක් වන විවිධ අවදානම්වලට ගු.ගු.සේ.ස. නිරාවරණය වේ.

ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ ප්‍රවේශය ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇත. මෙම අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ආයතනික පාලන රාමුවේ එක් ප්‍රධාන අංගයක් වන බැවින්, මෙම ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලබයි.

ගු.ගු.සේ.ස. එහි අවදානම් කළමනාකරණය තුළින් පහත සඳහන් දෑ සාක්ෂාත් කර ගැනීමට අරමුණු කර ඇත:

- විවිධ අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම.
- ආයතනික පරිසරයේ නව අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් අවදානමක් ඇති තර්ජන අවම කිරීම සහ/හෝ තුරන් කිරීම.
- සමාගමේ සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීමට සහය වීම.
- සමාගම තුළ අවදානම් සන්නිවේදනය සාර්ථකව කළමනාකරණය කිරීම.
- සමාගමේ පැවැත්මට සහ දිගු කාලීන වර්ධනයට දායක වන, ගු.ගු.සේ.ස. හි සැබෑ හිමිකරුවන් වන සාමාන්‍ය ජනතාවට සාධාරණයක් ඉටු කිරීම.

ගුවන් මෙහෙයුම්වල ප්‍රධාන අභියෝග

ඉහළ නඩත්තු පිරිවැය

පිරිවැය ව්‍යුහයේ විචල්‍ය පිරිවැයේ අඩු ප්‍රතිශතයට සාපේක්ෂව, ගුවන්තොටුපළ යටිතල පහසුකම් නඩත්තු කිරීමේ දී විශාල ස්ථාවර පිරිවැයක් දැරීමට සිදු වීම.

සීමිත ව්‍යාපාර විවිධාංගීකරණය

වෙනත් කර්මාන්ත සමඟ සසඳන විට, ගුවන් සේවා ක්ෂේත්‍රයේ ව්‍යාපාර විවිධාංගීකරණය සඳහා ඇති ඉඩකඩ බෙහෙවින් අඩුය. විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය වැනි තත්ත්වයක් තුළ, මෙය අපගේ විකුණුම් සහ ආදායම සඳහා බලපෑමක් ඇති කරයි.

පහසුකම් යාවත්කාලීන බැව් සහතික කිරීම

සේවාව මත පදනම් වූ ක්ෂේත්‍රයක් වන බැවින්, ගුවන්තොටුපළ වෙත පැමිණෙන සියලුම පිරිස් සඳහා සුවපහසු සහ උසස් ආගන්තුක අත්දැකීම් සහතික කිරීම අතිශයින් වැදගත් වේ. මේ සඳහා කලාපයේ අනෙකුත් ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් හා සමගාමීව ගුවන්තොටුපළ පහසුකම් සහ යටිතල පහසුකම් නඩත්තු කිරීම අවශ්‍ය වේ.

සංචාරක කර්මාන්තයේ අස්ථාවරත්වය

ගුවන් සේවා, ගෝලීය ආර්ථික තත්ත්වයන් සහ වෙනස්වීමේ අවදානමක් ඇති සංචාරක කර්මාන්තය මත දැඩි ලෙස රඳා පවතී. වසංගතයෙන් පසු ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම නිසාවෙන් ගුවන් සේවා අංශයේ ප්‍රකෘතිය ද මන්දගාමී විය. වසංගත තත්ත්වය හේතුවෙන් විදේශකයින්ගේ සහ සංචාරකයින්ගේ ප්‍රමුඛතා මෙන්ම අපේක්ෂාවන් වෙනස් වීමකට ලක් වූ අතර, එම අපේක්ෂාවන් සපුරාලීම අභියෝගාත්මක වී ඇත. මෙම අපේක්ෂාවන් සඳහා ගුවන්තොටුපළවල ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි වෙනස් කිරීමට භාජනය කිරීම අවශ්‍ය වේ. සෞඛ්‍ය සහ ආරක්ෂිත අවශ්‍යතා පිළිබඳ වැඩි අවධානයනයක් යොමු කිරීම මඟීන්ගේ සුවපහසුව අවම වීමට බලපා ඇත.

මෙහෙයුම් පිරිවැය වැඩි කිරීම

ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන් ඉන්ධන මිල ඉහළ යාම මඟින් ගුවන් සමාගම්වල මෙහෙයුම් පිරිවැය ඉහළ ගිය අතර එමඟින් ගුවන් යානා සම්බන්ධ මිල ගණන් ඉහළ නංවා ඇත. ප්‍රවේශපත්‍ර මිල ඉහළ යාම හේතුවෙන් අඩු මඟී ප්‍රමාණයක් හරහා ගුවන්තොටුපළ මෙහෙයුම්වලට ද මෙය අහිතකර ලෙස බලපානු ලබයි. එමෙන්ම ගුවන් සමාගම්, ගුවන්තොටුපළ ක්‍රියාකරුවන්ගෙන් මිල සහන ඉල්ලා සිටීම ද වර්ධනය වී ඇත.

වේගයෙන් වෙනස් වන තාක්ෂණය

ගුවන්තොටුපළෙහි ක්‍රියාකරුවන් විසින් තාක්ෂණික විශේෂාංග යොදා ගනිමින් සිදු කරනු ලබන වෙනස්කිරීම් සඳහා වෙනස්වන තාක්ෂණය හේතු වී ඇත. මෙය ගුවන්තොටුපොළවල් අතර තරඟකාරීත්වය වැඩි කරන අතර, ගුවන්තොටුපළ ක්‍රියාකරුවන් විසින් නව තාක්ෂණය සඳහා වැඩි ආයෝජනයක් කිරීම ද අවශ්‍ය වේ. අවම මිනිස් සහභාගිත්වයක් ඇති හෝ කිසිසේත්ම එවැන්නක් නොමැති සම්බන්ධතා රහිත ගුවන්තොටුපළ මෙහෙයුම් සාක්ෂාත් කර ගැනීම දුෂ්කර ඉලක්කයක් වී ඇත.

පාරිසරික බලපෑම්

ගුවන්තොටුපළ මෙහෙයුම් මඟින් පරිසරයට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. ගුවන් යානාවල කාබන් විමෝචනය සඳහා ගුවන් සමාගම් වගකිව යුතු අතර, මේ සම්බන්ධයෙන් ගුවන්තොටුපළවලට ද කාර්යභාරයක් ඇත. අවම කාබන් විමෝචනයක් පවත්වා ගැනීම අරමුණු කරගනිමින්, අවම ඉන්ධන පරිභෝජනයක් සහතික කිරීම සඳහා ගුවන් මාර්ග ව්‍යුහය වඩාත් කාර්යක්ෂම කිරීම කෙරෙහි ගුවන්තොටුපළ විශේෂයෙන් අවධානය යොමු කළ යුතුය.

ශබ්ද දූෂණයල ගුවන්තොටුපළ මෙහෙයවන්නන්ට මුහුණ දීමට සිදුවන තවත් අභියෝගයක් වන අතර ගුවන්තොටුපළ මෙහෙයුම්ල අවට පරිසරයේ වෙසෙන මිනිසුන්ට සහ සතුන්ට බාධා වන පරිදි විශාල ශබ්ද ජනනය කරයි. එබැවින් පරිසරයේ සිටින ප්‍රජාවන්ට සහ සත්ත්ව විශේෂයන්ට සිදුවන බාධාවන් අවම වන පරිදි මෙහෙයුම් සැලසුම් කර ඇත.

ගුවන්තොටුපළවල් සැලකිය යුතු අපද්‍රව්‍ය ප්‍රමාණයක් ජනනය කරන අතර ඒවා නිසි ලෙස බැහැර කළ යුතුය. පාරිසරික මාර්ගෝපදේශ සහ හොඳම භාවිතයන්ට අනුකූලව ගු.ගු.සේ.ස. හි මෙය සිදු කරන බව සහතික කිරීම ඉතා වැදගත් වේ. අප අපගේ පරිසර හිතකාමී අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් සනාථ කරමින් මධ්‍යම පරිසර අධිකාරියෙන් සහ අනෙකුත් නියාමන ආයතනවලින් සහතික ලබා ගෙන ඇත.

දිගු කාලීන අභියෝග සහ ඒවා අවම කිරීමේ පියවර

වෙනස් වන තාක්ෂණයට අනුවර්තනය වීම, තිරසාර බව සහතික කිරීම, ශක්‍යතා කළමනාකරණය සහ දක්ෂ ශ්‍රම බලකාය ආකර්ෂණය කර ගැනීම ගු.ගු.සේ.ස. විසින් දිගු කාලීනව මුහුණ දෙනු ලබන අභියෝග ලෙස අපි පුරෝකථනය කරමු.

තාක්ෂණික දියුණුව යනු වෙනස්වන තාක්ෂණික දියුණුව සමඟ ඉදිරියට යා යුතු අඛණ්ඩ ක්‍රියාවලියකි. ජෛවමිතික හඳුනා ගැනීමේ පද්ධති භාවිතයෙන් සම්බන්ධතා රහිත මගී පිරිසැකසුම් භාවිතය, ස්වයං-පරීක්ෂා කිරීම සහ ගමන් මලු ගුවන් යානා වෙත යැවීම, ස්වයං ඇතුළුවීමේ ප්‍රවේශ සහ ජංගම ගෙවීම් ආදිය භාවිත කිරීම අනාගතයේ දී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින් මෙම පහසුකම් අපගේ ගුවන්තොටුපළ තුළත් සැලසීම අත්‍යවශ්‍යයි. ඉදිරි වසර පහ තුළ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිතය. කෙසේ වෙතත්, ඉන් ඇතිවන සයිබර් ආරක්ෂණ අවදානම් විසඳීම පිළිබඳව ද සැලකිය යුතුය.

ලෝකය කෙමෙන් කෙමෙන් පරිසර හිතකාමී වෙමින් පවතී. මෙය අනාගතයේ දී කාබන් ප්‍රශස්තව පවත්වා ගැනීම උදෙසා බලපෑම් කරනු ලබයි. ඒ අනුව ඉදිරි දශක කිහිපය සඳහා කාබන් විමෝචනය අවම කිරීමේ ඉලක්ක සපුරාලීමට අපට සිදු වනු ඇත. එය ගු.ගු.සේ.ස. ආයතනික ඉලක්කයන්හි තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) අතරින් එකකි. ගුවන් මාර්ග ප්‍රතිව්‍යුහගත කිරීම හරහා ගොඩබිම් ක්‍රියාකාරකම් මත මෙන්ම කොළඹ ගුවනේ පියාසැරි කලාපය (FIR) තුළ කාබන් විමෝචනය අවම කිරීම සඳහා උපායමාර්ග සකස් කරනු ලබයි.

සමස්ත ගෝලීය ගුවන් මගී කිලෝමීටර ප්‍රමාණය හා සසඳා බලන විට, ආසියානු කලාපය පමණක් ඉන් තුනෙනේ එකකට හිමිකම් කියයි. වසංගතයේ බලපෑමෙන් කර්මාන්තය යථා තත්ත්වයට පත් වූ පසු මෙම පරිමාව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ පරිමාවක් ඇති කලාපය තුළ පිහිටීම හේතුවෙන්, මගී ගමනාගමන වැඩිවීමෙන් ශ්‍රී ලංකාවට ද ප්‍රතිලාභ ලැබෙනු ඇත. ක්‍රියාවලි වෙනස්කම් සහ තාක්ෂණික දියුණුව හැරුණු විට, වසංගත තත්ත්වයෙන් පසු පාරිභෝගික අවශ්‍යතා සමඟ කටයුතු කිරීම, පුද්ගලයන්ට විශේෂිත වූ සේවා සැපයීම සහ ජනවිකාශන සාධක මත පදනම්ව පාරිභෝගික වරණයන් හඳුනා ගැනීම දිගු කාලීනව විශාල අභියෝගයක් වනු ඇත. CRM (පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ) ක්‍රියාවලියක් හඳුන්වා දීමේ පළමු පියවර ලෙස තනි පොදු දත්ත සමුදායක් සංවර්ධනය කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පවත්වනු ලබයි.

සියලුම පාර්ශ්වකරුවන්ගේ තෘප්ති මට්ටම් ඉහළ නැංවීමට තුඩු දෙන අභ්‍යන්තර ව්‍යාපාර ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතා මට්ටම් වැඩිදියුණු කිරීම සඳහා ගු.ගු.සේ.ස. තුළ අංගසම්පූර්ණ ERP පද්ධතියක් හඳුන්වා දීමට ද කටයුතු කරමින් සිටී.

මීට අමතරව, ගු.ගු.සේ.ස. ආයතනික සැලසුම් සංවර්ධනය කිරීමේ දී, ඉහත අභියෝග සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ රාමුව

1. අවදානම් හඳුනා ගැනීම
   - උපද්‍රවයන් හඳුනා ගැනීම, අසාර්ථකවීම් හඳුනා ගැනීම සහ අහිතකර ප්‍රතිවිපාක හඳුනා ගැනීම අවදානම් හඳුනා ගැනීම සඳහා ඇතුළත් වේ. එමෙන්ම බාහිර පරිසරයේ ඇතිවන නව ව්‍යාපාරික අවස්ථා හඳුනා ගෙන එමඟින් ආදායම ඉහළ නැංවීම ද ඊට ඇතුළත් වේ
2. අවදානම් තක්සේරුව
   - අවදානම් තක්සේරුව මඟින් අරමුණු සාක්ෂාත් කර ගැනීමට බලපෑම් කළ හැකි සිදුවීම් පිළිබඳ දැක්මක් කළමනාකරණයට ලබා දීම අපේක්ෂා කරයි.
3. අවදානම් ප්‍රතිචාර තක්සේරුව සහ තෝරා ගැනීම
   - අවදානම් හඳුනා ගැනීම සහ ව්‍යාපාරයට එයින් වන බලපෑම මත පදනම්ව, එක් එක් විශේෂිත අවදානම පිළිගත යුතු ද නැතහොත් අවදානම් ශක්‍යතාව සමඟ සැසඳීමෙන් විසඳුම් සෙවිය යුතු ද යන්න පිළිබඳව තීරණ ගනු ලැබේ.
4. අවදානම් කළමනාකරණ ශිල්පීය ක්‍රම ක්‍රියාත්මක කිරීම
   - අවදානම් කළමනාකරණ ශිල්පීය ක්‍රම සඳහා අවදානම් වාර්තා කිරීම, අවදානම් සඳහා විසඳුම්, පවත්නා තොරතුරු වාර්තාකරණය සහ අධීක්ෂණය ඇතුළත් වේ.
5. අවදානම් නැවත තක්සේරුව
   - අවදානම පිළිගත හැකි මට්ටමකට අවම කළ පසු, අවදානම අඛණ්ඩව පාලනය කිරීම සහතික කිරීම සඳහා අවදානම නිරීක්ෂණය කළ යුතුය.

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම

අවදානම් කළමනාකරණයේ වැදගත්කම හඳුනා ගනිමින්, සමස්ත අවදානම් කළමනාකරණ වගකීම ගු.ගු.සේ.ස. හි උපායමාර්ගික කළමනාකරණ අංශය වෙත පැවරී ඇති අතර, එමඟින් සමාගමේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී කිසිදු බාධාවක් ඇති නොවන බව සහතික කිරීම සඳහා, සුදුසු අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයක් සමාගම තුළ හඳුන්වා දීමට සහ පවත්වාගෙන යාමට පියවර ගැනීමේ වගකීම දරයි. අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී ඇතිවෙන අවදානම් සාධක හඳුනා ගැනීම උදෙසා SWOT විශ්ලේෂණය, PESTEEL සහ Porter's 5 forces වැනි මෙවලම් භාවිතයෙන්, බාහිර සහ අභ්‍යන්තර ව්‍යාපාරික පරිසරය තක්සේරු කරනු ලබයි. "අවදානම් කළමනාකරණය සෑම කෙනෙකුගේම වගකීමයි" යන ආදර්ශ පාඨය මූලික කරගනිමින්, ඉහළ සිට පහළට සහ පහළ සිට ඉහළට යන ප්‍රවේශයන් අනුගමනය කරමින් සියලුම අංශ හා සේවක මට්ටම් සමඟ සාකච්ඡා කර එය කරගෙන යනු ලබයි.

අවදානම් කළමනාකරණ කමිටුව (RMC)

ගු.ගු.සේ.ස. හි, අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කිරීම සඳහා අවදානම් කළමනාකරණ කමිටුව (RMC) නමින් වෙනම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් පිහිටුවා ඇත.

අවදානම් ලේඛනය, ප්‍රධාන වශයෙන් භාවිත වන්නේ අවදානම්වල සම්භාවිතාව සහ බරපතලකම හඳුනා ගැනීම සඳහා ය. එහි අවදානම් අවම කිරීමේ යෝජිත ක්‍රමවේද සෑම අංශයක් විසින්ම යාවත්කාලීන කරන අතර උපායමාර්ගික කළමනාකරණ අංශය මඟින් අධීක්ෂණය කරනු ලැබේ. විසඳුම් ලබා නොදුන් ඕනෑම අවදානමක් සහ ඒ ආශ්‍රිත ගැටලු අවදානම් කළමනාකරණ කමිටුව වෙත යොමු කරයි.

ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් සියලුම අංශවල සහභාගිත්වයෙන් මාසිකව පවත්වනු ලබන අතර එහි දී ආයතනයේ තීරණාත්මක මෙහෙයුම් කටයුතුවලට බලපාන, උපායමාර්ගික අවදානම් පිළිබඳ සාකච්ඡා කිරීම සහ ඒවා අවම කර ගැනීමට වඩාත් සුදුසු ක්‍රම සොයා ගැනීම පිළිබඳ සාකච්ඡා කරයි. මෙම රැස්වීම්වල දී, තෝරාගත් අවදානම් ක්ෂේත්‍ර කිහිපයක් න්‍යාය පත්‍රයට ඇතුළත් කරන අතර, එමඟින් එම ක්ෂේත්‍රවල අවදානම් ඵලදායී ලෙස සාකච්ඡා කළ හැකිය. කෙසේ වෙතත්, න්‍යාය පත්‍රයට සීමා නොවී කාලෝචිත, තීරණාත්මක අවදානම් සාකච්ඡා කිරීමට සහභාගිවන්නන් සැමවිටම දිරිමත් කරනු ලැබේ. ඇතැම් උපායමාර්ගික අවදානම්, මානව සම්පත් කළමනාකරණ අවදානම් සහ තාක්ෂණය ආශ්‍රිත අවදානම් අනෙකුත් මණ්ඩල අනුකමිටු හරහා ද ඇගයීමට ලක් කෙරේ. මෙය හැකි සෑම අංශයකින්ම හේතුව සහ බලපෑම නිරීක්ෂණය තුළින් අවම කිරීමේ ක්‍රම ශක්තිමත් කිරීමට උපකාරී වේ.

තවදුරටත්, ගුවන් යානා ආරක්ෂණ කරුණු, සමාගමේ සුරක්ෂිතතා කළමනාකරණ ඒකකය විසින් සොයා බලනු ලැබේ. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ (ඇමුණුම 19) අනුව මෙය සිදු කෙරේ. ගුවන්තොටුපළවල සිටින සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් කාර්තුමය පදනමින් පැවැත්වෙන පහසුකම් සපයන කමිටු රැස්වීම්, පවතින තවත් ක්‍රියාවලියකි. මේ අතරතුර, ගුවන් සේවා ක්‍රියාකරුවන්ගේ කමිටුව (AOC) විසින් මෙහෙයුම්වල දී මුහුණ දෙන ගැටලු සාකච්ඡා කරනු ලබයි. ගුවන් සේවා ආරක්ෂක කමිටුව විසින් ආරක්ෂක තර්ජන සහ ගුවන් සමාගම් සහ මඟින් මුහුණ දෙන විභව අවදානම් ආදිය සාකච්ඡා කරනු ලබයි. මෙම යාන්ත්‍රණයන් තුළින් ආයතනයේ මෙහෙයුම් හා සම්බන්ධ අවදානම් පිළිබඳව සලකා බැලේ.

අවදානම් පුරෝකථනය

අවදානම් හඳුනා ගැනීමේ දී, අවදානම් පුරෝකථනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පසුගිය වසර කිහිපය තුළ, සංචාරය සහ ගුවන් සේවා සඳහා ඇති ජාත්‍යන්තර ඉල්ලුමේ අවිනිශ්චිතතාවයන් සමඟ කටයුතු කිරීම සඳහා, ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සිලය (ACI) සහ අභ්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය වැනි ගුවන් සේවා වෘත්තීය ආයතන විසින් ප්‍රකාශයට පත් කරන ලද පුරෝකථනයන්, ගු.ගු.සේ.ස. විසින් බොහෝ දුරට ගුවන් සේවා ක්ෂේත්‍රය සඳහා යොදා ගන්නා ලදී. සමාගමේ අවදානම් පුරෝකථනයේ කාලසීමාව, වසර 3 ක කාලයක් සඳහා සකස් කරන ලද ආයතනික සැලැස්මේ කාල සීමාව මත රඳා පවතී.

සියලුම මට්ටම්වල සේවක සහභාගිත්වය මෙම අදියරේ දී පහළ සිට ඉහළට සහ ඉහළ සිට පහළට සන්නිවේදන ක්‍රම හරහා ලබා ගනී. උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලියේ දී අවදානම් හඳුනා ගැනීම නිත්‍ය පිළිවෙතක් ලෙස සලකනු ලබන අතර, සේවක දායකත්වය දිරිමත් කරනු ලැබේ.

ගු.ගු.සේ.ස. විසින් පහත සඳහන් දෑ ඇතුළත් අවදානම් හඳුනා ගනී:

- උපායමාර්ගික සහ මෙහෙයුම් අවදානම
- මානව සම්පත් අවදානම
- ආරක්ෂාව, සුරක්ෂිතභාවය සහ සෞඛ්‍ය අවදානම
- මූල්‍ය අවදානම
- කීර්තිනාමය පිළිබඳ අවදානම
- නෛතික අවදානම

අවදානම් තක්සේරුව

අවදානම්, කරුණු දෙකක් සැලකිල්ලට ගනිමින් ඇගයීමට ලක් කෙරේ;
1) අවදානම් ඇති වීමේ හැකියාව (හෝ සම්භාවිතාව)
2) එම අවදානම්වල බලපෑමේ බරපතලකම

ඉහත අවස්ථා දෙක සඳහාම 1 සිට 5 දක්වා පරාසයක ලකුණු ලබා දී ඇති අතර, 1 මඟින් අවම වියහැකියාව හෝ බරපතලකමත් 5 මඟින් උපරිම වියහැකියාව හෝ බරපතලකමත් පෙන්නුම් කරයි. දර්ශකය ලබා ගැනීම සඳහා, වියහැකියාව සහ බලපෑම සඳහා ලබා දී ඇති ලකුණු එකිනෙක ගුණ කරනු ලැබේ. මෙම අගයන් 1 සිට 25 දක්වා පරාසයක පවතින අතර ඒවා අවදානම් තක්සේරු සටහනේ නිවැරදි කලාපවල දක්වා ඇත. අවම කිරීම සඳහා වඩාත් ශක්තිමත් යාන්ත්‍රණයක් අවශ්‍ය වනු ලබන තීරණාත්මක අවදානම් 25 දක්වා අගයන් මඟින් පෙන්නුම් කරනු ලබයි.

අවදානම් තක්සේරු සටහන

අවදානම් සටහන		බලපෑම					
		නොවැදගත්		සුළු	මධ්‍යම	ඉහළ	උපරිම
		1		2	3	4	5
සම්භාවිතාව	කලාතුරකින් සිදුවිය හැකි	1	1	2	3	4	5
	සිදුවිය නොහැකි	2	2	4	6	8	10
	සිදුවිය හැකි	3	3	6	9	12	15
	බොහෝ දුරට සිදුවිය හැකි	4	4	8	12	16	20
	ස්ථිරව සිදුවිය හැකි	5	5	10	15	20	25

සම්භාවිතාව සහ බලපෑම තක්සේරු කිරීම බොහෝ දුරට ගුණාත්මක විනිශ්චයක් වන අතර එහිදී ව්‍යක්තීය ප්‍රවීණත්වය සහිත අදාළ අංශ සම්බන්ධ වේ. එමෙන්ම මූල්‍ය අවදානම් වැනි ඇතැම් අවදානම් පවතින අතර ඒවායේ සම්භාවිතාව සහ / හෝ බලපෑම සමාන සිදුවීම් සහ මූල්‍ය වශයෙන් බලපෑම ගණනය කිරීමෙහි අතීත රටාවන් සලකා බැලීමෙන් ප්‍රමාණාත්මකව තක්සේරු කෙරේ.

අපි හඳුනාගත් සහ ග්‍රහණය කරගත් ඇතැම් අවදානම්වලට අනුව, ප්‍රධාන කාර්යසාධන දර්ශක කිහිපයක් නිර්වචනය කර ඇත. අර්ථවත් මූල්‍ය කාර්යසාධනයට අමතරව, අපි පාරිභෝගික තෘප්තිය, සේවක තෘප්තිය, ගුවන් යානා ආශ්‍රිත අනතුරු සහ සිද්ධීන් සම්බන්ධයෙන් සමාගමේ කාර්යසාධනය මනිනු ලබන්නෙමු. මෙම අංශවල ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීමට සහ ඒවා අවම කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණින් ඒවා විශ්ලේෂණය කිරීමට මෙය අපට උපකාරී විය.

අවදානම	අවදානම් පිළිබඳ විස්තර	අවම කරගන්නා ආකාරය
උපායමාර්ගික සහ මෙහෙයුම් අවදානම්	බාහිර ව්‍යාපාරික පරිසරයන්හි තර්ජන සහ අභ්‍යන්තර දුර්වලතා සමාගමට එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී බාධාවක් විය හැකිය. එමෙන්ම, ව්‍යාපාරික පරිසරය තුළ සමාගම විසින් ප්‍රයෝජන ගත යුතු අවස්ථා ඇති විය හැකිය.	ආයතනික සැලැස්ම සකස් කරන අවස්ථාවේ දී, ව්‍යාපාරයේ අභ්‍යන්තර සහ බාහිර පරිසරය නිරීක්ෂණය කර, නිසි තක්සේරුවක් වාර්ෂික පදනමින් සිදු කෙරේ.
මානව සම්පත් අවදානම්	වසංගත තත්ත්වය හේතුවෙන් සේවක ආරක්ෂාව සහ සෞඛ්‍යය මෙන්ම සේවක සබඳතා සහ අභිප්‍රේරණය පවත්වාගෙන යාම සමාලෝචිත වර්ෂය තුළ මානව සම්පත් අංශය මුහුණ දුන් ඉහළම අභියෝග විය.	රැකියාවේ ස්වභාවය අනුව සියලුම ආරක්ෂිත ද්‍රව්‍ය, PPE සපයන ලදී. මෙම කාල සීමාව තුළ සියලුම ගු.ගු.සේ.ස. සේවකයින් සඳහා නිරෝධායන පහසුකම්, පූර්ණ එන්නත් කිරීමේ වැඩසටහන් සංවිධානය කෙරුණි. ස්වකයින්ගේ විශේෂ දායකත්වය ප්‍රශංසා ලිපි මඟින් ඇගයීමට ලක් විය. "Brain Champs" නමින් ප්‍රශ්න විචාරාත්මක සැසියක් සහ Aviation Market watch" නමින් ගෝලීය ගුවන් සේවා ප්‍රවෘත්ති ප්‍රකාශනයක්, සේවකයින්ට වර්තමානය පිළිබඳ දැනුවත් කිරීම උදෙසා ක්‍රියාත්මක වේ. කාර්යක්ෂමව වැඩ කිරීමේ යාන්ත්‍රණ හඳුන්වා දී පුහුණු කරන ලදී.

අවදානම් කළමනාකරණය

අවදානම	අවදානම් පිළිබඳ විස්තර	අවම කරගන්නා ආකාරය
ආරක්ෂාව, සුරක්ෂිතභාවය සහ සෞඛ්‍ය අවදානම්	ඉහළ නියාමන ක්ෂේත්‍රයක් වන බැවින්, මූලික වශයෙන් ගුවන්තොටුපළ මෙහෙයුම් දේශීය හා ජාත්‍යන්තර රෙගුලාසිවලට අනුකූලව සිදු කෙරේ. ගුවන්තොටුපළ මෙහෙයුම්, ගුවන් සේවා ආරක්ෂාව, ගුවන් තොරතුරු සේවා, සුරක්ෂා කළමනාකරණය, අනතුරුදායක භාණ්ඩ ප්‍රවාහනය සහ ගුවන් ගමනාගමන සේවා යන ගුවන්තොටුපළ මෙහෙයුම්හි සියලුම ප්‍රධාන අංශ ආවරණය වන මාර්ගෝපදේශ ඇත.	අභ්‍යන්තර සහ ජාත්‍යන්තර මාර්ගෝපදේශ (CAASL සහ ICAO) මඟින් නිකුත් කරන ලද අදාළ මාර්ගෝපදේශයන්ට අනුකූලව ගුවන්තොටුපළ මෙහෙයුම්හි අවදානම් විශාල ලෙස අවම කරනු ලැබේ. සියලුම ව්‍යාපෘති ආරක්ෂිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව සිදු කරනු ලබන අතර ව්‍යාපෘතිවල නියැලී සිටින සියලුම ගිවිසුම්කරුවන් සහ බාහිර සේවා සපයන්නන් ද ඒවා අනුගමනය කළ යුතුය.
මූල්‍ය අවදානම්	**විනිමය අවදානම** ජාත්‍යන්තර ව්‍යාපාරික මෙහෙයුම් කටයුත්තක් ලෙස, ගු.ගු.සේ.ස. විදේශ විනිමය අවදානම්වලට නිරාවරණය වේ. සමාගම විදේශ මුදල්වලින් ණය ගන්නා අවස්ථාවන්හි රුපියල් අවප්‍රමාණය වීම තර්ජනයකි.	විදේශ මුදල්වලින් ඉපයීම් සහ ආයෝජන පවත්වා ගැනීම, අපට විනිමය පරිවර්තන සහ ගනුදෙනු නිසා පාඩු ඇතිවීමේ අවදානම් විශාල වශයෙන් අවම කර ගැනීම උදෙසා උපකාරී වේ.
	පොලී අනුපාතික අවදානම ගු.ගු.සේ.ස. පොලී අනුපාත වෙනස් වීමේ අවදානමට නිරාවරණය වේ.	සමාගමේ ආයෝජන කළඹ සමන්විත වන්නේ පොලී අනුපාතවල ඕනෑම වෙනසක් අනුවර්තනය කළ හැකි කෙටි කාලීන සහ දිගු කාලීන ආයෝජනවලින් ය.
	භාණ්ඩ මිල අවදානම බොහෝ මිලදී ගැනීම් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව ප්‍රසම්පාදනය කර ඇති අතර, සැපයුම්කරුවන් තෝරා ගැනීමේ දී පිරිවැය ප්‍රධාන අංගයකි.	සහතික කර ඇති මිල වැනි සාධාරණ කාල සීමාවකට සැපයුම්කරුවන් ගිවිසුම්ගත වේ.
	ණය අවදානම සමාගම ගුවන් සමාගම් සඳහා නිශ්චිත ණය කාල සීමාවක් ලබා දෙන අතර අනෙක් දෑ මුදල් පදනම මත සිදු වේ.	ප්‍රමාද වුවහොත් ඉන්වොයිස් අගය සඳහා පැහැරහැරීම් මත දඩ පොලියක් පැනවීමෙන් නියමිත ණය කාලය තුළ ගෙවීමට ගුවන් සමාගම් ගිවිසුම් ගත කර ඇත. වෙළඳසැල් ක්‍රියාකරුවන්ගේ කුලී සහ පිරිවැටුම් මත අයකිරීම් ඔවුන් සමඟ ඇති කොන්ත්‍රාත් ගිවිසුම් අනුව සිදු වේ. පැහැරහැරීම් අවදානම අවම කිරීම සඳහා අදාළ වගන්ති කොන්ත්‍රාත් ගිවිසුම්වල ඇතුළත් කර ඇත.
	ද්‍රවශීලතාවය සහ මුදල් ප්‍රවාහ අවදානම ණය පැහැර හැරීමේ අවදානම සහ දෛනික මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් මුදල් නොමැති වීමේ අවදානම මෙයින් අදහස් කරනු ලබයි.	ගු.ගු.සේ.ස. වසර ගණනාවක් පුරා සිය ඉපයීම් රැස් කරගෙන ඇති අතර එයින් සැලකිය යුතු කොටසක් ද්‍රවශීල වත්කම්වල ආයෝජනය කර ඇත. සමාගමට එහි සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් මඟින් ප්‍රමාණවත් මුදල් උත්පාදනය කළ නොහැකි තත්ත්වයක දී, මෙම ද්‍රවශීල වත්කම් අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා සුදුසු පරිදි භාවිත කළ හැක. එමෙන්ම, මෙම රඳවා ගත් ඉපයීම් සමාගම බාහිර මූල්‍යකරණය සඳහා ඉල්ලුම් කරනු ලබන අවස්ථාවක ණය දෙන්නන්ගේ විශ්වාසය ද වැඩි කරයි.

අවදානම	අවදානම් පිළිබඳ විස්තර	අවම කරගන්නා ආකාරය
කීර්තිනාමය පිළිබඳ අවදානම	වාචික සන්නිවේදනය/ අන්තර්ජාලය හරහා අලෙවිකරණය, කීර්තිනාමය කළමනාකරණය කිරීමට අවශ්‍ය ප්‍රබලතම මෙවලම ලෙස අපි සලකනු ලැබේ.	CMS (පැමිණිලි කළමනාකරණ පද්ධතිය) හරහා අපි ගනුදෙනුකරුවන්ගේ අප්‍රසාදය ඇතිවන ප්‍රදේශ සහ පදනම හඳුනා ගැනීමට කටයුතු කරන අතර, ලැබෙන පැමිණිලි සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගන්නෙමු. වැරදි / ව්‍යාජ පුවත් සහ සමාගම පිළිබඳ සාවද්‍ය තොරතුරු පැතිරීම වැළැක්වීම සඳහා සියලුම නිල සමාජ මාධ්‍ය පිටු සක්‍රීයව අධීක්ෂණය කිරීම, යාවත්කාලීන කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සිදු කරයි. විශේෂයෙන්, සමාලෝචිත වර්ෂය තුළ, වසංගත තත්ත්වයෙන් පසු මගී පහසුකම් සැපයීමේ දී සෞඛ්‍ය සහ ආරක්ෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා සේවාවන් සකස් කිරීමේ දී, ගු.ගු.සේ.ස. විසින් භෞතික හා මානව සම්පත් යන දෙඅංශයෙන්ම සීමා නිර්ණය කිරීමකින් තොරව සේවාවල කිසිදු අඩුපාඩුවක් නොමැතිව පවත්වා ගෙන යාමට උපරිම සැලකිල්ලක් දැක්වීය.
නෛතික අවදානම	නෛතික අවදානම යන්නෙන් අදහස් කරනුයේ, නීතියට නොගැළපෙන ලෙස නොසැලකිලිමත්ව ක්‍රියා කිරීම, නීතිය සහ එය අදාළ වන ආකාරය වරදවා වටහා ගැනීම හේතුවෙන් සමාගමට මූල්‍ය හෝ කීර්ති නාමයට හානි සිදුවීමේ හැකියාව වේ.	නීති අංශය විසින් සමාගම ගිවිසුම්කරුවන්, සැපයුම්කරුවන් සහ විවිධ වර්ගයේ සේවා සපයන්නන් සමඟ සම්බන්ධ වන, සමාගමේ සියලුම නෛතික ලිපි ලේඛන කෙටුම්පත් කිරීම සහ පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි (එනම් ලංසු ලේඛන සහ ගිවිසුම් ආදිය). මෙය නෛතික අවදානම් පමණක් නොව ණය අවදානම්, මානව සම්පත් අවදානම්, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් වැනි අනෙකුත් අවදානම් අවම කර ගැනීමට හැකි වන පරිදි අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් ගිවිසුම් ඇති කර ගැනීමට සමාගමට උපකාරී වේ. සමාගමට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ අවදානම වළක්වා ගැනීම සඳහා, නීතිපතා සිදු නොවන අනුකූලතා අවශ්‍යතා පිළිබඳව නීති අංශය විසින් ඉහළ කළමනාකාරීත්වයට උපදෙස් ලබා දීම සිදු කරනු ලබයි.

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය

ගු.ගු.සේ.ස. හි සාර්ථකත්වය උදෙසා අවදානම් කළමනාකරණයේ දායකත්වය

- අවදානම් කළමනාකරණයේ දී අනුගමනය කරන ලද ඉහත විස්තර කර ඇති ක්‍රියාවලිය මඟින් පහත සඳහන් ප්‍රතිලාභ ලබා දී ඇත:
- අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සඳහා ගතවන කාලය අවම විය.
- සමස්ත සමාගමම අවදානම් හඳුනාගැනීමේ සහ අවම කිරීමේ පියවර අනුගමනය කිරීම සඳහා සහය විය.
- අවදානම් ලේඛන පවත්වාගෙන යාම හේතුවෙන් ඕනෑම අවස්ථාවක විසඳුම් ලබා නොදුන් අවදානම් පිළිබඳව සමාගම දැනුවත් විය හැක.

භූමියේ සහ/හෝ ගුවනේ වාර්තා වන ආරක්ෂාව පිළිබඳ සිදුවීම් සහ අනතුරු, මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීමේ ප්‍රධාන කාර්යසාධන දර්ශක අතරින් එකකි. ගු.ගු.සේ.ස. විසින් පසුගිය වසර කිහිපය තුළ සිදුවීම් සහ අනතුරු අවම මට්ටමක පවත්වා ගෙන යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, සැලකිය යුතු ආරක්ෂක විගණන සොයාගැනීම්/ විමසුම් නොතිබුණි. මෙය අපගේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයේ කාර්යසාධනය පිළිබිඹු කරයි.

පැමිණිලි සංඛ්‍යාව තවත් ප්‍රධාන කාර්යසාධන දර්ශක අතරින් එකකි. එහිදී අපි මෙහෙයුම්වල දී සේවා බෙදා හැරීමේ ප්‍රමිතිය විශ්ලේෂණය කරන්නෙමු. පශ්චාත් කොවිඩ් කාලපරිච්ඡේදයේ දී අඩු මගී සංචලන තත්ත්වය සැලකීමෙන් අනතුරුව පවා සියලුම මූලාශ්‍රවලින් ලැබුණු පැමිණිලි සංඛ්‍යාවේ පැහැදිලි අඩුවීමක් දක්නට ලැබුණි . ආයතනයේ මෙහෙයුම් ඉලක්ක වැඩිදියුණු කිරීම සඳහා සිදුවීම්/අනතුරු යන දෙඅංශයේම පැමිණිලි විශ්ලේෂණය කරන ලදී. ගු.ගු.සේ.ස. හි පාරිභෝගික තෘප්තිය සහ ආරක්ෂාව යන තීරණාත්මක සාර්ථකත්ව සාධකයන්හට, මෙම අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ධනාත්මක ලෙස බලපා ඇත.

ගුවන් සේවා අංශයේ අනාගතය


කොවිඩ්-19 වසංගත තත්ත්වයන් හේතුවෙන්, ක්ෂේත්‍රය විසින් සිදු කරන ලද පූර්ව කොවිඩ් වර්ධන අනුපාත පුරෝකථනයන්, පසුගිය වසර දෙක තුළ සාක්ෂාත් කර ගෙන නොමැත. කෙසේ වෙතත්, එදිරි පිරිමැහුම් සංචාරක ව්‍යාපාරයි ලෙසින්, සංචාරක සීමා හේතුවෙන් අත්හැරීමට සිදු වූ සංචාර නැවත ආරම්භ කිරීම සඳහා ලොව පුරා සංචාරකයින් ගුවන් සංචාර ආරම්භ කරනු ඇති අතර එය ගෝලීය ගුවන්තොටුපළ කර්මාන්තයට මහඟු රුකුලක් වනු ඇත.

ශ්‍රී ලංකාව අයත් වන ආසියා පැසිෆික් කලාපය පශ්චාත් වසංගත කාලය තුළ වේගයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. සංචාරකයින් ආකර්ශනය කර ගැනීමට සමත් දිරි ගැන්වීමක් ලබාදිය හැකි නම් සහ ඔවුන් ගෙවන මුදලට නිසි වටිනාකමක් ලබා දිය හැකි නම්, කලාපය සඳහා ගුවන් සේවා ආයතන බලාපොරොත්තු වූවාට වඩා වේගයෙන්, ප්‍රතිවාදීන් අභිබවා ශ්‍රී ලංකාවට යථා තත්ත්වයට පත් විය හැකිය.

ආයතනික අවදානම් කළමනාකරණයේ අනාගතය

අවදානම් කළමනාකරණ යාන්ත්‍රණයන් තවදුරටත් ශක්තිමත් කිරීම සහ ගු.ගු.සේ.ස. තුළ ශක්තිමත් අවදානම් සංස්කෘතියක් ඇති කිරීමේ අරමුණින්, අපි ISO 31000: අවදානම් කළමනාකරණය සඳහා අනුකූලතා සහතිකය ලබා ගැනීමට සැලසුම් කරන්නෙමු. ස්වේච්ඡා බාහිර උපදේශකයෙකුගේ සහාය ඇතිව මෙය දැනටමත් ආරම්භ කර ඇති අතර ඉදිරි වසර 2 - 3 තුළ අනුකූලතා සහතිකය ලබා ගැනීමට අපි අපේක්ෂා කරමු.

ආයතනික පාලනය



* ගු.ගු.සේ.ස. හි සභාපතිතුමා විසින් එහි සභාපතිතුමා සහ ප්‍රධාන විධායක නිලධාරිතුමා යන ද්විත්ව භූමිකාවක් ඉටු කරනු ලබයි.

ආයතනික පාලනය

1. සමස්ත විග්‍රහය

පසුගිය වසර 38 පුරා, ආයතනයේ ව්‍යාපාරය මෙහෙයුම් මෙහෙයවීමට අවශ්‍ය මඟ පෙන්වීම සහ පාලනය සපයන අතරම, එදිනෙදා ව්‍යාපාරික කටයුතු නිසි ලෙස කළමනාකරණය කිරීමට මෙන්ම සමාග මේ දිගුකාලීන කාර්යසාධනයට සහය වන ශක්තිමත් පාලන ව්‍යුහයක් සහතික කිරීම උදෙසා ගු.ගු.සේ.ස. කැපවන ලදී. ඔවුන්ගේ අධීක්ෂණ වගකීම් වඩා හොඳින් අවබෝධ කර ගැනීමට නායකත්වයට සහය වීම සඳහා ඵලදායී පාලන රාමුවක් ඉතා වැදගත් වේ. රාමුව තුළ යහපාලනයට උපකාර වන විශේෂාංග මෙන්ම, පාලන අවදානම් සමඟ කටයුතු කිරීමේ උපායමාර්ග ඇතුළත් වේ. පාර්ශවකරුවන් සඳහා වටිනාකමක් ඇති කිරීම සඳහා මණ්ඩලයේ අධීක්ෂණ වගකීම් සමඟ කළමනාකරණ වගකීම් ගැළපෙන්නේ කෙසේද යන්න තක්සේරු කිරීම සඳහා මනා ආයතනික පාලන රාමුවක් මඟින් වඩාත් සවිමත් නිර්මාණයක් සපයයි.

අවශ්‍යතා වලින් පැන නඟින ගැටුම් හේතුවෙන් ඇතිවන නියෝජිතායතන ගැටලුව අවම කිරීම සඳහා ආයතනික පාලන රාමුව ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. විශිෂ්ට ආයතනික පාලනය යනු සමාග මක අඛණ්ඩතාව, වගවීම සහ කාර්යක්ෂමතාව සඳහා තීරණාත්මක අංගයකි.

කොටස්හිමියන්ගේ වටිනාකම ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම සඳහා ඵලදායී පාලන ව්‍යුහයන් සහ කර්මාන්තයේ හොඳම භාවිතයන් අනුගමනය කිරීමට සහ භාවිත කිරීමට ගු.ගු.සේ.ස. කැපවී සිටී. ශක්තිමත් ආයතනික පාලනය අඛණ්ඩ ක්‍රියාවලියක් බව ගු.ගු.සේ.ස. පිළිගන්නා අතර, ආයතනික පාලන රාමුව තුළ සිටින සියලුම පාර්ශ්වකරුවන්ගේ යහපත වෙනුවෙන් ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට ඇති කැපවීම මඟින් එය නැවත අවධාරණය කරයි. ගු.ගු.සේ.ස. ආයතනික පාලන රාමුව පදනම් වී ඇත්තේ සාධාරණත්වය, වගවීම, වගකීම, සහභාගීත්වය සහ විනිවිදභාවය යන මූලික වටිනාකම් මත වන අතර, ඒ සියල්ල තිරසාර ව්‍යාපාර ආකෘතියක් සංවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා ඉතා වැදගත් වේ.

සාධාරණත්වය

- කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- සුළු කොටස්හිමියන් ඇතුළු සියලුම කොටස්හිමියන්ට සමානව සැලකීම.
- උල්ලංඝනය කිරීම් සඳහා ඵලදායී පිළියම් ලබා දීම.

වගවීම

- කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකියන බවට සහතික වීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය කොටස්හිමියන්ට වගකියන බව සහතික වීම.

වගකීම

- කළමනාකරුවන්ගේ, අධ්‍යක්ෂවරුන්ගේ සහ උපදේශකයින්ගේ ස්වයං අභිලාෂයන් ආයතනික කොටස්හිමියන් සහ පොදු අවශ්‍යතා සමඟ පෙළගැස්වීමට උත්සාහ කළ යුතුය.

සහභාගීත්වය

- සංස්ථාවේ උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලියට අධ්‍යක්ෂවරුන් වඩාත් ක්‍රියාකාරීව සම්බන්ධ විය යුතුය.
- සේවක සහභාගීත්වය

විනිවිදභාවය

- මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, හිමිකාරිත්වය සහ සාමූහික පාලනය ඇතුළුව සියලුම වැදගත් කරුණු පිළිබඳව කාලෝචිත, නිවැරදිව හෙළිදරව් කිරීම සහතික කිරීම.

සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහ සදාචාරාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම තුළින් ඉලක්ක තිරසාර ලෙස සැපයීම, මෙහෙයුම් කාර්යසාධනය සහ මූල්‍ය කාර්යසාධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කොටස්හිමියන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට වගකිව යුතුය. ගු.ගු.සේ.ස. විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ සියලුම අනිවාර්ය විධිවිධාන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ 2017 ආයතනික පාලනය පිළිබඳ හොඳම පරිචයන් සංග්‍රහය සහ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ අනුගමනය කරමින් යහපාලනය සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වාණිජ රාජ්‍ය ව්‍යවසාය 'අ' වර්ගීකරණය යටතේ මෙම වාර්තාව සවිස්තරාත්මකව පෙන්නුම් කරයි.

2. අධ්‍යක්ෂ මණ්ඩලය

- අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම්වලට ඇතුළත් වන්නේ:
- සමාගමේ දිගුකාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් තිරසාර, ඉහළ මට්ටමේ, මධ්‍යම සහ දිගු කාලීන උපායමාර්ග සැකසීමේදී සමාගමට මෙහෙයවීම සහ මඟ පෙන්වීම ලබා දීම.
- ආයතනික අවදානම් කළමනාකරණ රාමුවේ විෂය පථය තුළ මෙහෙයුම් සිදු කරන බව සහතික කිරීම.
- පාලන සහ අනුකූලතා පද්ධතින් අධීක්ෂණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම් ඉටු කිරීමේදී, විවෘතභාවය, ඵලදායී සංවාදය සහ නිර්මාණාත්මක විසම්මුතිය සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන අතර, සේවක සවිබල ගැන්වීමට සහ නියැලීමට පහසුකම් සපයන පරිසරයක් සහතික කරන අතර, සියලු පාර්ශවකරුවන්ට වටිනාකමක් නිර්මාණය කරයි. ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය සහ සමාගමේ අනෙකුත් සේවකයන් දක්වා පහළට ගමන් කරන වෘත්තීය ප්‍රමිතීන් සහ ආයතනික වටිනාකම් ප්‍රවර්ධනය කිරීම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දිරිමත් කර ඔවුන්ගේ ශක්‍යතා ශක්තිමත් කරයි.

3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම

අධ්‍යක්ෂවරුන්ට සහ කළමනාකාරීත්වයට රැස්වීම්වලදී සාකච්ඡා කිරීම සඳහා අවශ්‍ය සියලුම ප්‍රධාන සහ උපායමාර්ගික තොරතුරු සකස් කිරීමට හැකිවන පරිදි ප්‍රමාණවත් දැනුම්දීමක් ලබා දීමෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සැලසුම් කර ඇත. අධ්‍යක්ෂවරුන්ට සෑම රැස්වීමකටම අවම වශයෙන් දින හතකට පෙර න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සපයනු ලබන අතර, ඔවුන්ට අන්තර්ගතය අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙනු ලැබේ.

යෝග්‍ය තීරණයකට එළැඹීම සඳහා සියලු අංශ නිසි ලෙස සාකච්ඡා කර, ආමන්ත්‍රණය කර ඇති බව සහතික කිරීම සඳහා එක් එක් න්‍යාය පත්‍ර අයිතම සඳහා පූර්ව කාලය වෙන් කර ගනිමින් රැස්වීම් පැවැත්වීමේදී ව්‍යක්තීය සහ ක්‍රමානුකූල ප්‍රවේශයක් භාවිත කරනු ලැබේ. අමතර තොරතුරු ඉදිරිපත් කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වැඩිදුර පැහැදිලි කිරීම් ලබා දීමට, අවශ්‍ය වූ විට අංශ ප්‍රධානීන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ආරාධනා කර කැඳවනු ලබයි.

වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දහතුනක් කැඳවා ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ නම	තනතුර	පැමිණීම
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc	සභාපති	13/13
ආර්. සූරියආරච්චි මහතා	උප සභාපති	13/13
ඒ. එස්. සී. වරුෂහෙන්නැදිගේ මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	13/13
එස්. එන්. සුමනසේකර මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	13/13
ඉංජිනේරු එස්. එම්. ඒ. යූ. එස්. මංචනායක මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	13/13
ඩී. ඒ. ද ලිවේරා මහත්මිය	විධායක නොවන අධ්‍යක්ෂ	13/13
සී. පී. විතාරණ මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	02/13
ආර්. ඒ. පී. විජේරත්නසේකර මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	13/13
ඩී. ඒ. පී. වීරත්න මහතා ඡක	විධායක නොවන අධ්‍යක්ෂ	13/13
ගිහාන් රශාන්ත මහතා	විධායක නොවන අධ්‍යක්ෂ	12/13
පී. ඒ. අජිත් ප්‍රියන්ත මහතා	විධායක නොවන අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත	08/13
ඒ. එච්.එස්. ගුණවර්ධන මහතා	ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ නිරීක්ෂක	13/13
ඉල්ලා අස් වුණ		
ආර්.එම්. ඒ. රත්නායක මහතා	විධායක නොවන අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත	02/13

4. අපගේ ප්‍රවේශය සහ කැපවීම

ගු.ගු.සේ.ස යනු සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන අතර, එහි අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික මඟ පෙන්වීම සඳහා රජයට වගකිව යුතුය.

අපගේ පාර්ශවකරුවන් සඳහා උපරිම වටිනාකමක් ලබා දීම වන අපගේ මූලික පරමාර්ථය සපුරාලීමේ ක්‍රියාවලියේදී ඵලදායී වගවීම සහ විනිවිදභාවය යන රාමුවක් තුළ සුදුසු ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාවන් සහ වගකීම්

ආයතනික භාරකාරිත්වය
උපායමාර්ග සහ සැලසුම්කරණය, අවදානම, නායකත්වය, ආයතනික කාර්යසාධනය, ආචාර ධර්ම, අනුකූලතාව, පාර්ශව සම්බන්ධ වීම, සම්පත්.

ගතිකත්වය
අගයන්, තීරණ ගැනීම, හැසිරීම, සේවක කුසලතා

ආකෘතිය
අභිරුචිය, ගිවිසුම් කොන්දේසි, කමිටු, ක්‍රියාවලි

පරිසරය
ආර්ථිකය, රෙගුලාසි, ව්‍යාපාර පිළිවෙත් මුදල් උච්චාවචනයන්, නෛතික පරිසරය

ආයතනික පාලනය

මණ්ඩල භාරකත්වය

බඳවා ගැනීම, හැඩගැසීම, අධ්‍යාපනය, ඇගයීම, අනුප්‍රාප්තික සැලසුම්

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය විසින් නිර්දේශිත ආයතනික පාලන නියාමන රාමුව අනුව සමාගම මෙහෙයවනු ලැබේ. මෙම පාලන රාමුව මූලික මූලධර්ම පහකින් සමන්විත වේ.

අ) නායකත්වය සහ මඟ පෙන්වීම
ආ) විනිවිදභාවය සහ අඛණ්ඩතාව
ඇ) එහි ප්‍රධාන කොටස්හිමියා ලෙස රජයට වගවීම
ඈ) පාර්ශ්වකරුවන්ගේ නීත්‍යානුකූල අවශ්‍යතා හඳුනා ගැනීම
ඉ) කාලීන සහ තුලනාත්මක හෙළිදරව් කිරීමේ මූලධර්ම

5. නායකත්වය සහ මඟ පෙන්වීම

සංගමයේ ලිපිවලට අනුකූලව සංචාරක අමාත්‍යවරයා විසින් පත් කරන ලද ව්‍යාපාර කළමනාකරණය සහ මූල්‍ය පාලනය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද සහ දැනුම සහිත සාමාජිකයින්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සමාගමේ ව්‍යාපාර සහ මෙහෙයුම් කළමනාකරණය කෙරේ. අමාත්‍යවරයා විසින් සංවිධානයේ සාමූහික පාලන ප්‍රතිපත්ති මෙහෙයවීමේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීමේ වගකීම දරන සභාපතිවරයා පත් කරනු ලබන අතර, යහපාලනය ඇති කිරීම සහ ඵලදායී බව සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක සහ විධායක නොවන සාමාජිකයන් අතර ඵලදායී වැඩ සබඳතා පවත්වාගෙන යාමද සභාපතිවරයා සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ සහය ඇතිව, සභාපතිතුමා පහත දෑ සහතික කරයි:

අ) අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි අනුගමනය කරනු ලබන බව
ආ) තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට නියමිත වේලාවට බෙදා හරිනු ලබන බව

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රජය සහ එහි පාර්ශවකරුවන් වෙනුවෙන් සමාගමේ භාරකාරත්වයේ ව්‍යවස්ථාපිත වගකීමක් ඉටු කරයි. ඔවුන්ගේ ප්‍රධාන කාර්යයන් වන්නේ:

අ) සමාගම එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයවීම.
ආ) සමස්තයක් ලෙස සමාගමේ කළමනාකරණය, මෙහෙයුම් සහ කාර්යසාධනය අධීක්ෂණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂවරුන් 11 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් 10 දෙනෙක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර, එක් අයෙක් විධායක අධ්‍යක්ෂවරයෙක්ද වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරයක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර, ඔවුන් සංග්‍රහයේ අවශ්‍යතා අනුව ඉහල කීර්තියක් ඇති අය වේ. මෙමඟින් කරුණු සහ අන්තර්ගතය අතින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය කළමණාකාරිත්වයේ ස්වාධීනත්වය පිළිබිඹු කරයි. මෙය අධ්‍යක්ෂවරුන්ගේ පෞද්ගලික සම්බන්ධතාවන්, පුද්ගල, සේවා නියුක්තිය හෝ ව්‍යාපාරය පමණක් නොව, කළමණාකාරිත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ථ ආකල්පයම වේ. ස්වාධීන විනිශ්චයන් සැපයීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ කාර්යභාරය වේ.

සියලුම අධ්‍යක්ෂවරුන්හට සමාගමේ අභ්‍යන්තර හා බාහිර තොරතුරුවලට ස්වාධීනව සහ ඒකාබද්ධව ප්‍රවේශ විය හැකිය. අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාපටිපාටි අනුගමනය කළේද යන්න සහ නෛතික අවශ්‍යතා මත වූ මාර්ගෝපදේශ සපයන බවට සමාගම් ලේකම්වරයා සහතික කරයි.

මීට අතිරේකව, සමාගම් ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුවත් තීරණ ගැනීමට හැකි වන පරිදි ප්‍රමාණවත් තොරතුරු සහිත වෙනත් අදාළ ලියකියවිලි සමඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැනුම්දීම්, රැස්වීම් වාර්තා සහ මාණ්ඩලික පත්‍රිකා බෙදා හරිනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පිළිබඳ පසු විපරම් ද ලේකම් විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

6. අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය සඳහා වෙන් කර ඇති කරුණු

සියලුම ව්‍යාපාරික ඒකක හරහා සම්මත කර ඇති හොඳින් ව්‍යුහගත ආයතනික පාලන රාමුවක් සමාගම විසින් ක්‍රියාත්මක කර ඇති අතර, එය තිරසාර කොටස්හිමියන්ගේ වටිනාකම පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

අ) 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ විධිවිධානවල විෂය පථය තුළ ගොඩනගා ඇති එහි නිශ්චිත මෙහෙවර මත පදනම්ව, සමාගම සඳහා දැක්ම සහ මඟ පෙන්වීම සහ එය රජයේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සඳහා වඩාත් හොඳින් සේවය කළ හැකි ආකාරය ලබා දීම.
ආ) 2007 අංක 7 දරන සමාගම් පනතේ සහ සංගමයේ වගන්තිවල විධිවිධානවලට අනුකූලව නෛතික අවශ්‍යතා සපුරාලීම සහ සමාගම ක්‍රියාත්මක වන බව සහතික කිරීම.
ඇ) රජයට සහ අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන්ට ප්‍රශස්ත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අවදානම් කළමනාකරණය ඇතුළු විවිධ ප්‍රතිපත්ති සැකසීම.
ඈ) රාජ්‍ය ප්‍රතිපත්ති අරමුණු වරින් වර සමාලෝචනය කිරීම සහ අනාගත වර්ධනය සඳහා දිගු කාලීන ඉලක්ක සහ අරමුණු සැකසීම සඳහා උපායමාර්ගික මඟ පෙන්වීම් සැපයීම.
ඉ) වගකීම් බෙදාහැරීම මඟින් ප්‍රමාණවත් වගවීමක් සහතික කිරීම.

7. මෙම ධාරිතාවයේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති කරුණු:

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන අරමුණු කෙටියෙන් කිවහොත්, සෘජුවම ඔවුන්ගේ විෂය පථයට අයත් වන්නේ:

අ) ව්‍යාපාරයේ සමස්ත දිශානතිය තක්සේරු කිරීම සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.
ආ) පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා විශ්වාසනීය රාජකාරිය.

ඇ) සමාගම සිය මෙහෙයුම්වල දී නිසි මාර්ගයේ ගමන් කරන බව සහතික කිරීම සඳහා කළමනාකරණ තොරතුරු වාර්තා මඟින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ ඇගයීම.

ඈ) පාලන භාවිතයන් හි කාර්යසාධනය සහතික කිරීම.

ඉ) අනෙකුත් අංශ අතර අභ්‍යන්තර පාලන ඇතුළුව අවදානම් තක්සේරුව සහ කළමනාකරණය සඳහා ආකෘතියක් ක්‍රියාත්මක කිරීම.

ඊ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති ආකෘතිගත ඇති ආකාරයටම ආයතනයේ සහ මහජනතාවගේ යහපත උදෙසා ක්‍රියාත්මක වන බවට සහතික වීම.

උ) ප්‍රතිඵල අභිමත අපේක්ෂාවන්ට අනුකූල නොවන්නේ නම්, ඉලක්ක සපුරා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රමාදයකින් තොරව ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම.

ඌ) කළමනාකරුවන් ලෙස දක්ෂ පුද්ගලයින් පත් කිරීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අතර ප්‍රමාණවත් බලය පැවරීමක් ඇති බව සහතික කිරීම.

එ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) රැස්වීම් සහ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට සහභාගි වීම හෝ අවශ්‍ය වූ විට ඒ සඳහා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත අධිකාරිය පැවරීම.

8. සාමූහික පාලන අංශයන්හි විගණන සහ කළමනාකරණ කමිටුවේ (AUMC) භූමිකාව

8.1. විගණන කළමනාකරණ කමිටුව

විගණන කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත්තේ PED/12 ඡේදය 7:4:1 ප්‍රකාරව ගු.ගු.සේ.ස. හි කටයුතු අධීක්ෂණය කිරීමේදී සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශවල සහ ගු.ගු.සේ.ස. හි ක්‍රියා පටිපාටිවල අඛණ්ඩතාව සහතික කරලීමට පාලක සභාවට සහය වීම සඳහාය.

විගණන කළමනාකරණ කමිටුවෙහි මූලික කාර්යභාරය වන්නේ, සමාගමේ මූල්‍ය ප්‍රකාශවල අඛණ්ඩතාව, සමාගමේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති සහ නෛතික සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සම්බන්ධයෙන් එහි අධීක්ෂණ වගකීම් ඉටු කිරීමේදී මණ්ඩලයට සහය වීමයි. බාහිර විගණකවරුන්ගේ කාර්යසාධනය, සුදුසුකම් සහ ස්වාධීනත්වය සහ සමාගම විසින් සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රමාණවත් බව සහ කාර්යසාධනය ද විගණන කළමනාකරණ කමිටුව හි විෂයපථයට අයත් ය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව සමාලෝචනය කර අනුමත කර ඇති, කමිටුවේ යොමුකිරීමේ අනුදේශයන් හි කාර්යයන් සහ වගකීම්වල විෂය පථය ප්‍රමාණවත් ලෙස දක්වා ඇත. ගිණුම්කරණ සහ මූල්‍ය ක්‍රියාකාරකම්, පරිපාලන රෙගුලාසි (AR), මූල්‍ය රෙගුලාසි (FR) සහ ගු.ගු.සේ.ස. රෙගුලාසි ආවරණය වන පරිදි රජයේ රෙගුලාසිවලට අනුකූල වීම සහ අනුකූල වීම සහතික කිරීම සඳහා විගණන කළමනාකරණ කමිටුව මඟින් මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කර ඇත.

විගණනය කරන ලද මූල්‍ය තොරතුරුවල අඛණ්ඩතාවයට දායක වීම සඳහා බාහිර හා අභ්‍යන්තර විගණන කාර්යයන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, ඒවා අවම වශයෙන් කාර්තුවකට වරක්වත් විගණන කමිටුව විසින් අධීක්ෂණය කර ඵලදායී ලෙස ඇගයීමට ලක්කිරීම වැදගත් වේ. ගු.ගු.සේ.ස. හි රේඛීය අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරය සඳහා ගු.ගු.සේ.ස. හි විගණන කාර්යයන් ඵලදායී සහ ශක්තිමත් ලෙස ඇගයීමට ලක් කර ඇති බවට සහතිකයක් අවශ්‍ය වේ. ඇගයීම්වල විෂය පථයට පහත දෑ ඇතුළුව අදාළ සියලු කරුණු ඇතුළත් විය යුතුය:

- ඇගයීම් කාලය තුළ සිදු කරන ලද කාර්යයේ ගුණාත්මකභාවය.
- විගණන නිලධාරීන්ගේ හැකියාව සහ පළපුරුද්ද.
- රජයේ සහ අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් එහි වාර්තාකරණයේ

ක්‍රියාවලියේ යෝග්‍යතාවය.

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් දැනට පවතින පද්ධති සහ ක්‍රියා පටිපාටි නිරන්තරව සමාලෝචනය කර ඇති අතර, යම් අපගමනය නිරීක්ෂණය කිරීමේදී පවතින පද්ධති වැඩිදියුණු කිරීමට යෝජනා වරින් වර එහි අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරුන් විසින් මතු කරන ලද විමසීම් සහ අදාළ අවදානම් ඉවත් කිරීම සඳහා ගනු ලබන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් සහ ඵලදායී බව සහතික කිරීම සඳහා අදාළ අංශ විසින් ලබා දී ඇති පිළිතුරු ද කමිටුව විසින් සමාලෝචනය කර ඇත.

8.2. විනිවිදභාවය සහ අඛණ්ඩතාව

ව්‍යාපාරයක හෝ පාලන සන්දර්භය තුළ විනිවිදභාවය යනු, අවංකභාවය සහ විවෘතභාවයයි. විනිවිදභාවය සහ වගවීම සාමාන්‍යයෙන් ආයතනික පාලනයේ ප්‍රධාන පදනම් ලෙස සැලකේ. අඛණ්ඩතාව යනු වෙන කිසිවෙකු ළඟ නොමැති වුවත් නිවැරදි දේ කිරීමයි. එය සදාචාරාත්මක සාරධර්ම මත පදනම්ව පුද්ගලයෙකු කරන ඕනෑම දෙයක් අවංකව හා ස්ථාවරව කටයුතු කිරීමට ඇති හැකියාවයි.

උසස් පාලනය, වගවීම සහ විනිවිදභාවය සඳහා ඉල්ලුමක් පවතින සමාගමේ මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාව හඳුනාගෙන ආරක්ෂා කිරීමේ අරමුණින්, විගණන සහ කළමනාකරණ කමිටුව සංවිධානාත්මක සංස්කෘතිය සහ භාවිතයන් නිරන්තරයෙන් අධීක්ෂණය කර සමාලෝචනය කර ඇත. භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව, සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සමාගමේ වැදගත් ක්‍රියාකාරකම් අතරින් එකක් වන අතර, භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීමේදී පූර්ණ විනිවිදභාවයෙන් යුත් ක්‍රියා පටිපාටි සපයයි.

8.3. අභ්‍යන්තර විගණනය

විගණන සහ කළමනාකරණ කමිටුවට, ගු.ගු.සේ.ස. අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික (IA & QA) අංශයේ සහය ලැබේ. අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික අංශයේ ප්‍රධානී විගණන සහ කළමනාකරණ කමිටුව හි කැඳවුම්කරු ලෙස කටයුතු කරන අතර, සභාපතිතුමාට වාර්තා කරයි. අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික අංශයේ ප්‍රධාන අවධානය යොමු වන්නේ, ගුවන් තොටුපළ සේවාවන් හි ඇතැම් ක්ෂේත්‍ර සඳහා ගුණාත්මක ප්‍රමිති සතුටුදායක ලෙස සපුරා ඇති බවට සහතික වන අතරම, අභ්‍යන්තර පාලනවල ප්‍රමාණාත්මකභාවය, අඛණ්ඩතාව සහ කාර්යසාධනය

ආයතනික පාලනය

ඇගයීම මඟින් පවතින සමස්ත අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් පැවැත්වීම සහ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සඳහා කළමනාකාරිත්වයට සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීමයි. අභ්‍යන්තර විගණනය විසින් අභ්‍යන්තර පාලනයන් හි ප්‍රමාණවත්භාවය සහ කාර්යසාධනය සහ සමාගමේ නීති සහ රෙගුලාසි සහ ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම පිළිබඳ සභාපතිතුමා වෙත නිරන්තරයෙන් වාර්තා කරන ලදී. අභ්‍යන්තර විගණනයට ඇතුළත් වන්නේ:

අ) පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ සමාලෝචනය.
ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රධාන තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට සහතික වීම.
ඇ) ගු.ගු.සේ.ස. හි එක් එක් අංශයේ විෂය පථයට ගැනෙන කළමනාකරණ තීරණ සහ ක්‍රියාකාරකම් පිළිබඳ අවදානම් තක්සේරුව ඇගයීම් සහ නිර්දේශයන් කිරීම, විගණන සහ කළමනාකරණ කමිටුවට වෙත සහ ගු.ගු.සේ.ස. හි සභාපති වෙත ඉදිරිපත් කිරීම.
ඈ) පද්ධති සහ පාලන සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් අවදානම් තක්සේරු කිරීම් පිළිබඳව නිරීක්ෂණ කිරීම.
ඉ) ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් සැලසුම් නොකළ සහ කාලානුරූපී මූල්‍ය සමාලෝචන සහ එහි පිළිගැනීම මෙන්ම වාර්තා කිරීම.
ඊ) තෝරාගත් ගුවන්තොටුපළ පහසුකම් සහ ගුවන්තොටුපළ සේවා සම්බන්ධයෙන් තත්ත්ව විගණන සිදු කිරීම.
උ) ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයට අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම.

9. ගු.ගු.සේ.ස. හි ප්‍රධාන කොටස්හිමියා ලෙස රජයට වගවීම

පූර්ණ වශයෙන්ම රජය සතු ව්‍යාපාරයක් ලෙස, රජයට වගවීම රේඛීය අමාත්‍යාංශය හරහා පහත සඳහන් යාන්ත්‍රණය භාවිත කරමින් ගු.ගු.සේ.ස. විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

9.1 පාර්ලිමේන්තුව

2002 මැයි 24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ PE/PF 21 ප්‍රකාර මුදල් වර්ෂය අවසානයේ සිට දින 150ක් ඇතුළත සමාගමේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.

9.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)

සමාගමේ කාර්යසාධනය සමාලෝචනය කිරීමට සහ සමාගම කාර්යසාධන ඉලක්ක සපුරා ගන්නා සහ සමාජ වගකීම් ඉටු කරන ප්‍රමාණය තක්සේරු කිරීමට පොදු ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) බලය ඇත.

කෝප් කමිටුව විසින් කැඳවූ විට, සභාපතිතුමා, අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් එක්ව සංචාරක සහ ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමා, ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා සමාගමේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කිසියම් විමසීමක් සහ සැලකිලිමත් වන කරුණු සඳහා ප්‍රතිචාර දැක්වීමට සමාලෝචනවලට සහභාගී වී සිටිය යුතුය.

9.3 පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව

2015 දෙසැම්බර් 19 දින පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද යෝජනාවට අනුව ගු.ගු.සේ.ස. ප්‍රවාහන සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව යටතට පත්වේ. කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේ සමස්ත ව්‍යාපෘති ප්‍රගතිය, කාර්යසාධනය සහ වෙනත් විශේෂ කරුණු ඇගයීම සහ අධීක්ෂණය කිරීමයි. සමස්ත ක්‍රියාවලිය තුළම වාස්තවිකත්වය පවත්වා ගැනීම සඳහා විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ආංශික අධීක්ෂණ කාරක සභාව පත් කර ඇත.

9.4 මුදල් ඇමති/ මහාභාණ්ඩාගාරය

රාජ්‍ය ව්‍යවසාය ඇතුළු රාජ්‍ය අංශයේ මූල්‍ය විනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා හෝ ඔහු වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වගකිව යුතුය. කාර්යසාධනය අධීක්ෂණය කිරීම, ප්‍රඥප්ති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සහ අමාත්‍යවරයාට අදාළ ඕනෑම කරුණක් පිළිබඳව වාර්තා කිරීම සඳහා භාණ්ඩාගාර නියෝජිතයකු මණ්ඩලයට පත් කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර නියෝජිත ජී. ඒ. අජිත් ප්‍රියන්ත මහතා විසින් මෙම කාර්යය ඉටු කරන ලදී. රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය කළමනාකරණය සහ පාලනය අධීක්ෂණය කිරීමේ වගකීම පවතින්නේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (DPE) මතය.

9.5 ගමනාගමන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය

සංචාරක සහ ගුවන්සේවා අමාත්‍යාංශය ලේකම්වරයා සහ ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා සමාගමේ මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් රජයට වගකියන අතර, මෙම වපසරිය යටතේ මෙම වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ පහත සඳහන් කරුණු නිතිපතා සමාලෝචනයට භාජනය කරන ලදී.

අ) ආයතනික සැලැස්ම සහ අයවැය
ආ) වත්මන් වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය කාර්යසාධනය
ඇ) සමස්තයක් ලෙස වසරේ කළමනාකරණ ලිපිය සහ මූල්‍ය කාර්යසාධනය ඇතුළුව විගණන බෙදාහැරීම්
ඈ) කෝප් කමිටුවේ හෝ වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත/නියාමන ආයතනයක රැස්වීම්වලින් ඉස්මතු වන කරුණු

9.6 සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යාංශය

සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යාංශය, 2019 දෙසැම්බර් 10 වැනි දින අංක 2153/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ ස්ථාපිත කරන ලදී. සංචාරක හා ගුවන් සේවා අංශ භාරව කැප වූ අමාත්‍යාංශයක් පිහිටුවීමේ ප්‍රධාන අරමුණු අතර, සුදුසු ප්‍රතිපත්ති සහ නියාමන රාමුවක් ලබා දීම, ශක්තිමත් යටිතල පහසුකම් සංවර්ධනය සහ ගුවන් සේවා සහතික කිරීම, ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සහ ආයතන පිළිබඳ පරිපාලන හා අමාත්‍යාංශය යටතේ ඇති ගැසට් පත්‍රය මූල්‍ය දළ විශ්ලේෂණයක් සිදු කරයි.

10. පාර්ශවකරුවන්ගේ නීත්‍යානුකූල අවශ්‍යතා හඳුනා ගැනීම

ආයතනයක් පාර්ශ්වකරුවන්ට හොඳින් සලකන විට, වර්ධනයේ අපේක්ෂාවන් සපුරාලන විට සහ ප්‍රජා වගකීම් සහ නෛතික අනුකූලතාව සම්බන්ධයෙන් කීර්තියක් ඇති විට පාර්ශ්වකරුවන්ගේ වටිනාකම වැඩි දියුණු වේ. සමාගමේ මූලික පරමාර්ථය ලෙස සමාගමක පාර්ශවකරුවන්ගේ (කොටස්හිමියන්, ගනුදෙනුකරුවන්, සේවකයින් සහ ප්‍රජාව ඇතුළුව) අවශ්‍යතා උපරිම කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම කළමනාකරණ විධි ක්‍රමයක් ලෙස හැඳින්වේ. මෙම ප්‍රවේශයේ පරමාර්ථය වන්නේ, ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමෙන් පාර්ශවකරුවන්ගේ වටිනාකම උපරිම කිරීම වන අතර, එමඟින් සංවිධානයේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නංවන අතරම පිරිවැය පාලනය ඉහළ නැංවීම, සමාගමේ සේවකයින්ගේ කුසලතා සහ චිත්ත ධෛර්යය වැඩි දියුණු කිරීම සහ සංවිධානය සම්පත් සහ පෝෂණය රැස්වන ප්‍රජාවේ ප්‍රගතිය සුරක්ෂිත කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව, ගු.ගු.සේ.ස හි කටයුතු පිළිබඳව උනන්දුවක් දක්වන රජය සහ අනෙකුත් අනුබද්ධ නියෝජන කොට්ඨාශ ඇතුළු සියලුම නීත්‍යානුකූල පාර්ශවකරුවන්, සේවකයින්, ගුවන් තොටුපළ භාවිත කරන්නන් (ගුවන් සේවා, මඟීන් සහ ගුවන් තොටුපළ පරිශ්‍රයේ ඔවුන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යන ව්‍යාපාරික ප්‍රජාව) සැපයුම්කරුවන් සහ අනෙකුත් සේවා සපයන්නන් සහ සමස්තයක් වශයෙන් ප්‍රජාව සමාගම විසින් හඳුනා ගනී. දිගුකාලීන පාර්ශවකරුවන්ගේ වටිනාකම ප්‍රශස්ත කිරීම සඳහා වන වැදගත් රාජකාරියේ කොටසක් ලෙස මෙම බැඳීම් විශේෂ කොට සලකනු ලබයි.

පහත සඳහන් ක්ෂේත්‍රවලින් සමන්විත සුදුසු ආයතනික භාවිතයන් සඳහා එහි කැපවීම පෙන්නුම් කරයි:

අ) නියාමන රාමුවට පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය විසින් නිසි උද්‌යෝගය.
ආ) ගුවන් තොටුපළ මෙහෙයුම් ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස ක්‍රියා කරමින් රජයේ වගකීම් ඉටු කිරීම.
ඇ) ණයහිමියන් සහ මූල්‍ය ආයතන වෙත ඇති වගකීම් කඩිනමින් සපුරාලීම.
ඈ) සාධාරණ වෙළඳාමට අදාළ වගකීම් අඛණ්ඩව සපුරාලීම සහ සැපයුම්කරුවන් සහ අනෙකුත් සේවා සපයන්නන් සමඟ ගනුදෙනු කිරීමේදී සාධාරණ පදනමක් සහතික කිරීම.
ඉ) ප්‍රජාවට බලපාන සදාචාරාත්මක ව්‍යාපාරික ආචාර ධර්ම භාවිතයන් සහතික කිරීම.
ඊ) නීතියෙන් නියම කර ඇති පරිදි සියලුම මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ සුදුසු පරිදි හොඳම භාවිතයන් අනුගමනය කිරීම.
උ) සියලුම ගුවන් තොටුපළ භාවිත කරන්නන්ට නොවෙනස්ව සැලකීම.
ඌ) සේවකයින්ට සාධාරණව, ගෞරවාන්විතව සහ සමානත්වයෙන් සැලකීම

11. කාලෝචිත සහ සමබර අනාවරණය කිරීම්

විචක්ෂණ තීරණ ගැනීම සඳහා විස්තරාත්මකව සහ පුළුල්ව කාලෝචිත, නිවැරදි තොරතුරු සැපයීම, අභ්‍යන්තරව මෙන්ම බාහිරව ද අපගේ තොරතුරු අනාවරණය කිරීමේ හරය වේ. සමාගමේ ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS/LKASs) හි දක්වා ඇති චක්‍රලේඛ ඇතුළුව සියලුම නීති සහ රෙගුලාසිවල අනාවරණය කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරයි.

ව්‍යාපාර, අවදානම් පැතිකඩ, මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් කාර්යසාධනය සහ ආයතනයේ ප්‍රවණතා පිළිබඳව කොටස්හිමියන්ට අවබෝධ කර ගැනීමට උපකාර කිරීම සඳහා ගු.ගු.සේ.ස. පාර්ශවකරුවන් සමඟ ඵලදායී සහ අවංක සන්නිවේදනයක් පවත්වාගෙන යයි. බොහෝ කාලීන සහ තත්කාර්ය වාර්තා සහ විශ්ලේෂණය කරන ලද තොරතුරු භාවිතයක් ලෙස සහ ඉල්ලුම මත සපයනු ලැබේ. ආයතනික මෙහෙයුම්වල සැබෑ තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ සේවකයින් යාවත්කාලීන වේ. සමාගමේ අන්තර්ජාලය සේවකයින්ට තොරතුරු බෙදාහැරීමේ අරමුණ ඉටු කරයි. අපගේ ව්‍යාපාරයට බලපාන සහ අප ක්‍රියාත්මක වන ප්‍රජාවට බලපාන නීති සහ රෙගුලාසි සංවර්ධනය කිරීම, බලාත්මක කිරීම සහ සංශෝධනය කිරීම සිදු වන සෑම අවස්ථාවකම ගු.ගු.සේ.ස. පොදු ප්‍රතිපත්ති සංවාදයට දායකත්වය සපයයි.

12. සමාගම් ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම සහ නීතිපතා සමාලෝචනය කිරීම සහතික කිරීම සඳහා සමාගම් ලේකම්වරයා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා සහ මණ්ඩල වාර්තා පවත්වාගෙන යාමට අමතරව, වසර තුළ ආයතනික පාලන කටයුතු, මණ්ඩල ක්‍රියාපටිපාටීන් සහ අදාළ නීති රීතිවලට අදාළ උපදෙස්වලට අමතරව, මණ්ඩලයට කාලීන සහ නිවැරදි තොරතුරු ලැබෙන බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා සහය ලබා දෙයි. මතු කරන ලද සහ වාර්තා කිරීමට බලාපොරොත්තු වන සියලුම ගැටලු ලේකම් විසින් ප්‍රමාණවත් විස්තර සහිතව ලේඛනගත කර ඇත.

අදාළ ව්‍යවස්ථාපිත, නව රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සහ පාලන කටයුතු සඳහා කළමනාකාරීත්වය සහ නියාමන අධිකාරීන් අතර සීමා සඳහා සමාගම් ලේකම්වරයා මූලික වශයෙන් වගකිව යුතුයි.


GIVENCHY
PARIS
PHILIPP PLEIN
1978



විධිමත් නියාමන ක්‍රියාවලියක් පත්වාගෙන යාම

මූල්‍ය වාර්තා

81 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව
86 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
87 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
88 හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
89 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
90 මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. AAV/A/AASL/01/21/15
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 08 June 2022

සභාපති
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශ

1.1 මතය

සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය යන ප්‍රකාශවලට අදාළ සටහන්, සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියෙහි සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ නිර්දේශය යටතේ විගණනය සිදුකරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට මා විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත.
මූල්‍ය ප්‍රකාශවලින් 2021 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

මම මගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිති යටතේ මා වෙත ඇති වගකීම්, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තර කෙරේ. මා ලබාගත් විගණන සාක්ෂි මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

1.3 කාරණා අවධාරණය කිරීම

සමාගමේ මූල්‍ය ප්‍රකාශ, ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන (සම්මත අරමුදල) සහ රඳවාගත් ආදායම් අරමුදල සමඟ ඒකාබද්ධ කිරීමේ පදනම පැහැදිලි කරන මූල්‍ය ප්‍රකාශයන්හි 2.1.1 සටහන වෙත අවධානය යොමු කරමි. 2005 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව, භාණ්ඩාගාර ලේකම්වරයා විසින් 2006 පෙබරවාරි 09 දිනැති, අංක PE/GOCO/1/1 දරන ඔහුගේ ලිපිය මඟින්, දැනට රජයට අයත් ගුවන්තොටුපළේ ඉඩම සහ ගොඩනැගිල්ල, සමාගම සතු අනෙකුත් චංචල සහ නිශ්චල වත්කම් සහ ශ්‍රී ලංකා රජය විසින් එවකට පවත්වා ගෙන යන ලද ගුවන්තොටුපළ සංවර්ධනයට අදාළ වගකීම් හාර ගැනීම සහ ශුද්ධ වත්කම් වටිනාකම සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීම තක්සේරු කරන ලෙස සමාගමට නියෝග කර ඇත.

තවද, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාගමේ ඉල්ලීම මත, ගුවන්තොටුපළේ ඉඩම් සහ ගොඩනැගිලි සහ දැනට සිවිල් ගුවන් සේවා අධිකාරියට සහ ශ්‍රී ලංකා රජයට අයත් අනෙකුත් සියලුම චංචල සහ නිශ්චල වත්කම් අන්‍යෝන්‍ය වශයෙන් පැවරීමට අදාළ බැවින්, නීතිපතිවරයා විසින් නව කැබිනට් අනුමැතියක් ලබා ගන්නා ලෙස 2010 පෙබරවාරි 08 දිනැති සිය ලිපිය මඟින් උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත්, නව කැබිනට් තීරණයක් ලබා ගැනීමට සමාගම මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

තවද, 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරී පනත යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයාගේ 2017 දෙසැම්බර් 21 දිනැති ගැසට් නිවේදනය මඟින්, කටුනායක ගුවන්තොටුපළ, රත්මලාන ගුවන්තොටුපළ, රත්මලාන සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානයෙහි ඉඩම්, ගොඩනැගිලි සහ සැලැස්ම, අත්තිඩියේ ගුවන් සංචලන සන්නිවේදන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය, ගම්පහ සහ පමුණුගම ගුවන් විදුලි සංචලන ආධාරක, පිදුරුතලාගල රේඩාර් මධ්‍යස්ථානය, නුවරඑළියේ සංචාරක බංගලාව සහ හෙක්ටයාර් 0.125 ක අනුරාධපුර ඉඩම අමාත්‍යවරයා විසින්

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව



පවරාගෙන, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා සමාගමට පවරා ඇත. එබැවින් සමාගම විසින් භාවිත කරන ලද ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතිය විගණනයේ දී සැක සහිත විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ගොඩනැගිලි පමණක් නැවත ගණනය කර ඇති අතර, තක්සේරුව අවසන් කර ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

මේ කාරණය සම්බන්ධයෙන් මගේ මතය සංශෝධනය කර නොමැත.

1.4 සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

වෙනත් තොරතුරු සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරුවලින් සමන්විත වූව ද, එයට මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මූල්‍ය ප්‍රකාශ සහ ඒ සම්බන්ධ මාගේ විගණක වාර්තාව ඇතුළත් නොවේ. වෙනත් තොරතුරු සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකීමෙන් බැඳේ.

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ මාගේ මතය මඟින් වෙනත් තොරතුරු ආවරණය නොකරන අතර, මවිසින් ඒ සම්බන්ධයෙන් කිසිදු ආකාරයක තහවුරුවක් හෝ නිගමනයක් සපයනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම වනුයේ, වෙනත් තොරතුරු කියවා බැලීම වන අතර, එහිදී වෙනත් තොරතුරු හා මූල්‍ය ප්‍රකාශ අතර ප්‍රමාණාත්මක නොගැලපීමක් පවතී ද, විගණනයේ දී අප ලද දැනුම අනුව හෝ වෙනත් ආකාරයකින් කිසියම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් සිදුවී ඇති ද යන්න සොයා බැලේ.

එසේ නම්, මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් වෙනත් තොරතුරු මත මා විසින් ඉටු කරන ලද කාර්යය මත පදනම්ව, මෙම වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇතැයි මා විසින් නිගමනය කළහොත්, මවිසින් එය වාර්තා කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට මා හට කිසිදු කරුණක් නොමැත.

1.5 මූල්‍ය ප්‍රකාශ කළමනාකරණය සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරිත්වයෙහි වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකාරිත්වයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම සහ සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකාරිත්වයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනයේ වගකීම ඇති අය වගකිව යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික සහ වාරාන්තරව සමාගමෙහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා සමාගම විසින් සිය ආදායම්, වියදම්, වත්කම්, සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකවරයාගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණක වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම, උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි හේතුවෙන් සාවද්‍ය ප්‍රකාශ ඇති විය හැකි අතර, තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක ලෙස සලකන අතර, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණභාවයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද මවිසින්,

- වංචා හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ මාගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදු කරමි. වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක් හඳුනා නොගැනීමේ අවදානම, වැරැද්දක ප්‍රතිඵලයක් ලෙස එසේ හඳුනා නොගැනීමේ අවදානමට වඩා වැඩි ය. මන්ද වංචාවක් තුළ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා ඌනතා ඇති කිරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම ඇතුළත් විය හැකි බැවිනි.

- අවස්ථාවෝචිතව සුදුසු විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනු ලැබුව ද, එසේ සිදු කරන්නේ සමාගමේ අභ්‍යන්තර පාලනයෙහි ඵලදායීතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවේ.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකාරිත්වය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ ඊට සම්බන්ධ අනාවරණය කිරීම්හි සාධාරණත්වය ඇගයීම සිදු කරමි.

- කළමනාකාරිත්වය ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම යොදා ගැනීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමාගමට අඛණ්ඩ පැවැත්මක් ඇති වීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ කොන්දේසිවලට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේ ද යන්න තීරණය කරමි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශවල අදාළ අනාවරණයන් පිළිබඳව මවිසින් මගේ විගණන වාර්තාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, නැතහොත් එවැනි අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීම සිදු කළ යුතුය. මගේ නිගමනය පදනම් වී ඇත්තේ මගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් සමාගම අඛණ්ඩව පැවැත්ම නැවැත්වීමට හේතු විය හැක.

- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශ මඟින් එහි ඇතුළත් ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමක් නියෝජනය කරන්නේ ද යන්න තක්සේරු කරමි.

මගේ විගණනයේ දී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුලුහුඬුකම් ද ඇතුළුව, අනෙකුත් කාරණා, විගණනයේ සැලකිය යුතු සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමඟ මම සන්නිවේදනය කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත්ය:

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මවිසින් ලබාගෙන ඇති අතර, මගේ විභාගයෙන් පෙනෙන පරිදි, සමාගම විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(1) (ඈ) වගන්තිය අනුව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තිය අනුව නිසි පරිදි ගිණුම් වාර්තා තබා ඇත.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ නියමයන්ට අනුකූල වේ.

2.1.3 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ නියමයන්ට අනුව පෙර වර්ෂය සමඟ ගැළපේ.

2.1.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ නියමයන්ට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල මා විසින් පසුගිය වර්ෂය සඳහා සිදු කරන ලද සියලුම නිර්දේශ කිරීම් අන්තර්ගත වේ.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2 අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් සාක්ෂි මත පදනම්ව, ප්‍රමාණවත් කරුණුවලට පමණක් සීමා වූ අතර, කිසිවක් මගේ අවධානයට යොමු වී නැත.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, සමාගමේ සාමාන්‍ය පාලන කටයුතුවලින් බැහැරව, සමාගම විසින් ඇති කර ගත් ඕනෑම කොන්ත්‍රාත්තුවක් සඳහා එහි පාලන මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, සමාගමේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ විධානයන්ට අනුකූලව, සමාගම පහත අවස්ථාවන්හි දී හැර අනුකූල වී නොමැති බව ප්‍රකාශ කිරීම;

නීතිය/මඟපෙන්වීම සඳහා යොමුව	විස්තරය
2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතෙහි 14 වන වගන්තිය	2021 දෙසැම්බර් 31 දින දක්වා ගගන යාත්‍රාංගනය ස්ථාපිත කිරීම හෝ පුළුල් කිරීම පිළිබඳ ප්‍රධාන සැලැස්මක් සමාගම විසින් සකස් කොට නොතිබූ අතර, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි අංක 12 (උ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, සමාගම එහි බලතල, කාර්යයන් සහ රාජකාරි ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව, අදාළ නීතිවලට අනුකූලව සහ කාල රාමු තුළ දී සමාගමේ සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ලබාගෙන භාවිත කර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.5 වෙනත් කරුණු

(අ) සමාගම විසින් 2012 මාර්තු 28 සහ 2016 මාර්තු 24 යන දිනයන්හි දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ II වන අදියර 2 වන පියවර සඳහා ජපන් යෙන් මිලියන 74,397 ක අරමුදල් ලබා ගැනීමට ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය සමඟ ගිවිසුම් දෙකකට එළඹ ඇත. කෙසේ වෙතත්, අරමුදල් වටිනාකමෙන් සියයට 82 කට සමාන කොන්ත්‍රාත්තුවේ වටිනාකම දීර්ඝ ප්‍රමාදයකින් පසු, 2020 මාර්තු 04 දින ප්‍රදානය කර තිබුණි. තවද, 2013 අප්‍රේල් 20 සිට 2022 අප්‍රේල් 20 දක්වා සමාගම විසින් ජපන් යෙන් මිලියන 250.5 කට සමාන මුදලක් වන රු. මිලියන 359.5 ක මුදලක්, සහයෝගිතා නියෝජිතායතනය අරමුදල් ඌන උපයෝජනය හේතුවෙන් වියදම් දැරීමට බැඳී සිටීමේ ගාස්තුවක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා ජපන් යෙන් මිලියන 14.8 ට සමාන වන රු. මිලියන 31.5 ක මුදලක් ද ඇතුළත්ව ගෙවා ඇත. නව පර්යන්ත ගොඩනැගිල්ලෙහි වහලයේ සැලසුම වෙනස් කිරීම, ව්‍යාපෘතිය ප්‍රමාද වීමට හේතු වී ඇත.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී, ගොඩබෑමේ සහ ගුවන්යානා නැවැත්වීමේ ගාස්තු සහ ගුවන් පාලම් ගාස්තු, කුලියට දීම සහ අනෙකුත් ගාස්තු වන රු. මිලියන 1,413.5 ක් සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් දින 365 ක් තුළ හිඟ ණයගැති ශේෂය අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එය ගු.ගු.සේ.ස. හි දින 365 පුරාවට මුළු වෙළඳ ණය ගැතියන්ගෙන් සියයට 35 ක් විය.

(ඇ) 2021 වර්ෂයේ ම.ජා.ගු. හි මෙහෙයුම් පිරිවැය රු. බිලියන 2.02 ක් වූ අතර, එය මෙහෙයුම් ආදායමට වඩා 21 ගුණයකින් වැඩි බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ශුද්ධ අලාභය රු. බිලියන 4.44 ක් වූ අතර, 2017 වසර සිට 2021 වසර දක්වා බදු ගෙවීමෙන් පසු සමුච්චිත ශුද්ධ අලාභ රු. බිලියන 20.59 කි. මත්තල ගුවන්තොටුපළේ අපේක්ෂිත වාර්ෂික මගී ධාරිතාව මිලියනයක් පමණ වුව ද, පසුගිය වසර පහ තුළ මුළු මගීන් සංඛ්‍යාව 91,747 ක් සහ මුළු ගුවන් සංචලන සංඛ්‍යාව 2,396 කි. ඒ අනුව, මෙම ගුවන්තොටුපළ ඉදිකිරීම සඳහා දරන ලද ඇ.ඩො. මිලියන 247.7 ට සමාන මුළු වියදම රු. මිලියන 36,564 ක් ඵලදායී ලෙස භාවිත නොකළ බව නිරීක්ෂණය විය. තවද, ඉහත ඉදිකිරීම සඳහා ලබාගත් ඇ. ඩො. මිලියන 190 ක ණය සඳහා පොලිය ඇතුළුව වාර්ෂික ණය වාරිකය ලෙස රු. මිලියන 2,610 ක මුදලක් ගු.ගු.සේ.ස විසින් ගෙවා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඈ) කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ, රත්මලාන අබණ්ඩ පාඩු ලබා ඇති අතර, සමාලෝචිත වර්ෂය සඳහා වූ රු. මිලියන 461.08 ක අලාභය ඇතුළුව 2017 සිට 2021 වසර දක්වා සමුච්චිත අලාභය රු. මිලියන 1,693.66 ක් විය. 2020 සහ 2021 වසරවල ගුවන් යානා සංචලනයන් වසරකට 13 ක් පමණක් වූ අතර, මගී සංචලනයන් පිළිවෙළින් 60 සහ 28 ක් පමණ විය.

(ඉ) යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ 2019 ඔක්තෝම්බර් 17 වන දින විවෘත කරන ලදී. ආරම්භයේ සිටම වාර්තා වූ ගුවන් යානා සංචලන 142 ක් සහ මගී සංචලන සංඛ්‍යාව 4,441 ක් පමණක් වූ අතර, පසුගිය වසර 03 ක් අබණ්ඩව පාඩු ලැබීය. 2021 වර්ෂයේ කිසිදු ආදායමක් උපයා නොතිබූ අතර, රු. මිලියන 40.74 ක වියදමක් දරා තිබුණි.

(ඊ) 2018 මාර්තු 25 වන දින මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ සිවිල් මෙහෙයුම් සඳහා නැවත විවෘත කරන ලදී. ඉන් කිසිදු ආදායමක් උපයා නොගත් අතර, පසුගිය වසර හතර තුළ වියදම ලෙස දරා ඇත්තේ රු. මිලියන 74.64 ක් පමණි. සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නව මගී පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 38.4 ක් සහ ධාවන පථය ඉදිකිරීම සඳහා රු. මිලියන 482.78 ක් වැය කර ඇති අතර, ගුවන් සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ධාවන පථය ඉදිකිරීමේ අවසාන ගෙවීම් සඳහා රු. මිලියන 53.61 ක මුදලක් වැය කර ඇත.

සමාගමේ සභාපතිවරයාගෙන් ලද අදහස් අනුව, යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ, මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ මෙහෙයුම් සහ කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (රත්මලාන) මෙහෙයුම් සමාගමේ පරිපාලනය යටතේ, ජාත්‍යන්තර සිවිල් ගුවන්තොටුපොළ මට්ටම දක්වා උසස් කිරීමට ශ්‍රී ලංකා රජය තීරණයක් ගෙන ඇත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය	සටහන	2021	2020
ආදායම	5	7,386,170,394	7,776,338,256
වෙනත් ආදායම්	6	492,782,034	234,399,549
		7,878,952,428	8,010,737,805
පරිපාලන සහ ආයතන වියදම්	7	(11,654,806,923)	(12,621,505,398)
මෙහෙයුම් (අලාභය)/ලාභය		(3,775,854,496)	(4,610,767,594)
මූල්‍ය ආදායම		3,321,110,256	3,665,084,725
මූල්‍ය පිරිවැය		(506,142,527)	(2,787,071,806)
ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ආදායම	8	2,814,967,729	878,012,919
බදු පෙර (අලාභය)/ලාභය		(960,886,767)	(3,732,754,675)
ආදායම් බදු වියදම්	9	(1,122,614,992)	1,228,325,046
වසර සඳහා (අලාභය)/ලාභය		(2,083,501,758)	(2,504,429,629)
කොටසක මූලික (අලාභය)/ඉපැයුම්	10	(10,417)	(12,522)
වෙනත් විස්තීර්ණ ආදායම්			
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීමේ උපකල්පනවල වෙනස්වීම් වලින් පැන නගින ලාභය/(අලාභය)	23	878,191,927	497,235,788
ආයුගණන ලාභය/(අලාභය) මත විලම්බිත බදු	13	(210,766,063)	(119,336,589)
වෙනත් මුළු විස්තීර්ණ ආදායම්		667,425,865	377,899,199
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		(1,416,075,894)	(2,126,530,430)

පිටු අංක 90 සිට 117 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනිවාර්ය අංගයකි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය	සටහන	2021	2020
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	11	41,624,923,625	37,892,565,842
නොනිමි ප්‍රාග්ධනය	11	30,459,475,504	8,781,032,278
අස්පෘශ්‍ය වත්කම්	12	21,835,257	40,239,429
විලම්බිත බදු වත්කම්	13	1,878,384,291	1,967,973,553
		73,984,618,678	48,681,811,103
දිගු කාලීන ආයෝජන			
දිගු කාලීන ණය		12,788,500	-
ණයකර වල ආයෝජන	14	4,088,300,000	5,638,300,000
දිගු කාලීන බැංකු තැන්පතු		1,266,678,125	1,169,874,563
සමාගම් නිලධාරීන් වෙත ලබා දුන් ණය	16.1	61,602,205	81,019,448
ජංගම වත්කම්			
බඩු තොග	15	808,185,284	837,088,722
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	16	3,845,984,745	3,215,746,028
ලැබිය යුතු ආදායම් බදු	26	848,093,206	833,368,210
කෙටි කාලීන බැංකු තැන්පතු		41,515,132,946	41,932,637,264
මුදල් සහ මුදල් සමාන දෑ	17	413,045,010	826,225,883
		47,430,441,191	47,645,066,108
මුළු වත්කම්		126,844,428,699	103,216,071,222
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	18	20,000,200	20,000,200
සංචිත	19	6,846,183,247	1,077,266,769
රඳවා ගත් ඉපැයුම්	20	34,448,138,251	35,885,634,586
		41,314,321,698	36,982,901,555
ජංගම නොවන වගකීම්			
ණය ගැනීම්	21	60,435,353,759	43,433,321,775
ණයකර	22	4,000,000,000	4,000,000,000
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	23	4,837,739,167	5,482,533,223
විලම්බිත බදු වගකීම	13	7,373,210,258	6,129,418,466
විලම්බිත රජයේ ප්‍රදාන	24	956,671,370	986,349,954
		77,602,974,554	60,031,623,418
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	25	3,637,802,214	2,462,071,718
ණය ගැනීම්	21	4,289,330,231	3,739,474,530
		7,927,132,445	6,201,546,248
මුළු වගකීම්		85,530,106,999	66,233,169,666
මුළු හිමිකම් සහ වගකීම්		126,844,428,699	103,216,071,222

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශ 2022 මැයි 31 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇති බව සහතික කරමි.

සභාපති

අධ්‍යක්ෂ

මූල්‍ය ප්‍රධානී

හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

	සටහන	ප්‍රකාශිත ප්‍රාග්ධනය	වෙනත් සංචිත	රඳවා ගත් ඉපැයුම්	එකතුව
2020 ජනවාරි 1 වන දිනට ශේෂය		20,000,200	1,067,076,769	38,143,580,281	39,230,657,251
පෙර වර්ෂය හා ගැළපුම්		-	-	(121,225,264)	(121,225,264)
වසර සඳහා (අලාභය)/ලාභය		-	-	(2,504,429,629)	(2,504,429,629)
වෙනත් විස්තීර්ණ ආදායම්					
පශ්චාත් සේවක ප්‍රතිලාභ බැදීම්වල ආයුගණන අලාභය		-	-	497,235,788	497,235,788
ප්‍රතිලාභ වගකීම්					
ආයුගණන ලාභය මත විලම්බිත බදු		-	-	(119,336,589)	(119,336,589)
වෙනත් විස්තීර්ණ ආදායම්		-	-	377,899,199	377,899,199
ශුද්ධ බදු					
මුළු විස්තීර්ණ ආදායම		-	-	(2,126,530,430)	(2,126,530,430)
පෙර වර්ෂය හා ගැළපුම්		-	-	-	-
ගෙවූ ලාභාංශ	28	-	-	-	-
සංචිත ගිණුමට මාරු කරන්න		-	10,190,000	(10,190,000)	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		20,000,200	1,077,266,769	35,885,634,586	36,982,901,554
2021 ජනවාරි 1 දිනට ශේෂය		20,000,200	1,077,266,769	35,885,634,586	36,982,901,554
පෙර වර්ෂය හා ගැළපුම්		-	-	(18,920,440)	(18,920,440)
වසර සඳහා (අලාභය)/ලාභය		-	-	(2,083,501,758)	(2,083,501,758)
වෙනත් විස්තීර්ණ ආදායම්					
පශ්චාත් සේවක ප්‍රතිලාභ බැදීම්වල ආයුගණන අලාභය		-	-	878,191,927	878,191,927
ප්‍රතිලාභ වගකීම්					
ආයුගණන ලාභය මත විලම්බිත බදු		-	-	(210,766,063)	(210,766,063)
වෙනත් විස්තීර්ණ ආදායම්		-	-	667,425,865	667,425,865
ශුද්ධ බදු					
මුළු විස්තීර්ණ ආදායම්		-	-	(1,416,075,894)	(1,416,075,894)
ගෙවූ ලාභාංශ	28	-	-	-	-
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය		-	5,766,416,478	-	5,766,416,478
සංචිත ගිණුමට මාරු කිරීම		-	2,500,000	(2,500,000)	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		20,000,200	6,846,183,247	34,448,138,251	41,314,321,699

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය	සටහන	2021	2020
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ			
ආදායම් බදු වියදමට පෙර (අලාභය)/ලාභය		(960,886,767)	(3,732,754,675)
ගැළපුම්:			
ක්ෂය වීම්	11	2,630,042,901	2,820,686,229
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	12	18,376,125	16,599,094
පෙර වර්ෂයේ ක්ෂය වීම්/ක්‍රමක්ෂය ගැළපුම්	11-12	13,631,930	58,885,481
ප්‍රත්‍යාගණන/මාරු කිරීම් සඳහා ගැළපුම්	11	512,203,484	-
කපා හරින ලද වත්කම්	11-12	167,229,653	-
ණය පරිවර්තනය මත විනිමය (ලාභය) / අලාභය	21	2,141,205,420	2,268,147,704
ස්ථාවර තැන්පතු පරිවර්තනය මත විනිමය (ලාභය) / අලාභය	21	(2,775,429,116)	(770,750,076)
ආයෝජන වෙතින් ලද ආදායම	8	(3,301,121,938)	(3,681,564,853)
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද (ලාභය)/අලාභය		9,754,246	(39,386,993)
පෙර වර්ෂය හා ගැළපුම්	20	(18,920,458)	(124,200,415)
විලම්බිත රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය	24	(48,656,180)	(47,694,302)
මූල්‍ය පිරිවැය	8	1,140,366,223	1,289,674,178
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම සඳහා ප්‍රතිපාදන	23	716,345,888	912,386,047
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය		244,141,411	(1,029,972,581)
බඩු තොග (වැඩි වීම)/ අඩු වීම		28,903,438	123,936,517
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ හි (වැඩි වීම)/ අඩු වීම		(525,569,111)	2,442,334,045
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ හි (වැඩි වීම)/ අඩු වීම		1,204,329,621	(275,084,982)
මෙහෙයුම් වලින් උපයන ලද මුදල්		951,805,359	1,261,212,999
ගෙවන ලද නිශ්චිත ප්‍රතිලාභ සැලසුම	23	(482,947,999)	(417,090,045)
ගෙවන ලද පොලී		(1,168,965,347)	(1,341,907,020)
ගෙවන ලද ආදායම් බදු	26	(14,724,996)	(1,617,818,533)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් (භාවිත කරන ලද)/ උපයන ලද ශුද්ධ මුදල්		(714,832,983)	(2,115,602,600)
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	11	(22,960,368,432)	(2,140,848,433)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	12	-	(27,720,585)
ණයකර වෙත ආයෝජනය	14	1,550,000,000	-
බැංකු තැන්පතු වල ශුද්ධ (ආයෝජන)/ආපසු ගැනීම්		3,096,129,871	1,052,597,268
ක්‍රීඩා සංගමය වෙත ලබා දුන් ණය		(12,788,500)	-
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ආදායම		2,127,330	39,387,040
ලද පොලී		3,196,452,332	4,173,071,721
ලබා දුන් කාර්ය මණ්ඩල ණය		(101,513,352)	(124,931,128)
ලද කාර්ය මණ්ඩල ණය		120,930,596	146,013,692
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් උපයන ලද ශුද්ධ මුදල්		(15,109,030,155)	3,117,569,574
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ			
ලැබුණු ණය	21	19,833,345,828	1,083,791,280
ණය ආපසු ගෙවීම් (දේශීය)	21	(133,333,334)	-
ණය ආපසු ගෙවීම් (විදේශීය)	21	(4,289,330,231)	(3,739,474,532)
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් (භාවිත කරන ලද)/ උපයන ලද ශුද්ධ මුදල්		15,410,682,264	(2,655,683,251)
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ (අඩු වීම)/ වැඩි වීම		(413,180,873)	(1,653,716,277)
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ	17	826,225,883	2,479,942,157
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	17	413,045,010	826,225,883

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(සියලුම සටහන්වල අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇති අතර, එසේ නොමැති අවස්ථාවක එය සඳහන් කර ඇත.)

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍ය තොරතුරු

සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ('සමාගම') ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සහ නේවාසික පෞද්ගලික සමාගමකි. සමාගම හි ලියාපදිංචි කාර්යාලය කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හි පිහිටා ඇත.

1.2 මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ මූලික ක්‍රියාකාරකම් වූයේ, ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති වලට අනුව ගුවන්තොටුපළ කළමනාකරණය, අභ්‍යන්තර ගුවන් යානා සහ ශ්‍රී ලංකා ගුවන් ගමන් තොරතුරු කලාපය හරහා පියාසර කරන ගුවන් යානා සඳහා විධිවිධාන සැලසීම සහ වෙනත් ගුවන්තොටුපළ පරිශීලකයින්ට අවශ්‍ය ගුවන් නාවික පහසුකම් සැපයීමයි.

1.3 මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදුන් දිනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම හි මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2022 මැයි 31 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුකූලව අනුමැතිය ලබාදෙන ලදී.

2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අනුගමනය කළ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. වෙනත් අයුරකින් සඳහන් කර නොමැති අවස්ථාවක හැර, ඉදිරිපත් කළ සියලුම වසර සඳහා මෙම ප්‍රතිපත්ති නිරතුරුවම යොදාගෙන ඇත.

2.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/LKAS) අනුව සහ ඒවාට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත. ඇතැම් මූල්‍ය වත්කම් සහ වගකීම් සාධාරණ තක්සේරුව සහ නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වල වර්තමාන වටිනාකම වෙනස් කර ඇති පරිදි, ඓතිහාසික පිරිවැය පදනම යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා යම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිත කිරීම අවශ්‍ය වේ. සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකරණය විසින් ඔවුන්ගේ විනිශ්චයන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශ සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර, සටහන 4 හි අනාවරණය වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම, 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූල වේ.

2.1.1 ඒකාබද්ධ කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශ මඟින්,

අ) ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන නියෝජනය කරන සම්මත අරමුදල; හා
ආ) රඳවාගත් ආදායම් අරමුදල

ඇතුළත් ව සමාගමේ ඒකාබද්ධ තත්වය ඉදිරිපත් කරන අතර, නීතිපතිවරයාගේ මතය අනුව 2011 වසර දක්වා වෙන වෙනම සකස් කරන ලදී.

2005 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් ලබා දුන් අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.5 ඡේදය යටතේ සඳහන් වන ව්‍යවස්ථාපිත සංශෝධන ආරම්භ කිරීමට පියවර ගන්නා ලෙස සමාගම විසින් ගුවන් සේවා අමාත්‍යාංශයෙන් කළ ඉල්ලීමකට අනුව, අවශ්‍ය ව්‍යවස්ථාදායක සංශෝධන සමඟ ගුවන් තොටුපළේ වත්කම් සහ වගකීම් සමාගමේ ඒවා සමඟ ඒකාබද්ධ කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නීතිපතිවරයාගේ මතය විමසා ඇත.

ඉහත කැබිනට් අනුමැතියේ අවශ්‍යතාවය වූයේ, 1983 දී සමාගම පිහිටුවීම සහ ගුවන් තොටුපළ අධිකාරිය විසුරුවා හැරීම, ඉතිරි වත්කම් හා බැරකම් සමඟ ගුවන්තොටුපළ අධිකාරිය සතු වත්කම් වලින් කොටසක් පමණක් සමාගමට පැවරීම හා ඉතිරි වත්කම් හා බැරකම් වැය ශීර්ෂ හා රඳවා ගත් ආදායම් අරමුදල් යටතේ රඳවා තබා ගෙන ගිණුම් ගත කිරීම හේතුවෙනි.

අරමුදල් දෙක හි සටහන් කර ඇති වත්කම් භාවිතයෙන් ආර්ථික ප්‍රතිලාභ ලබා ගනිමින් ද, එසේම අදාළ වගකීම් වාර්තා කිරීමකින් තොරව, ණය සේවා සැපයීමේ වගකීම් සඳහා ගිණුම්කරණය සිදුකරමින් ද සමාගම විසින් එහි මූලික ක්‍රියාකාරකම් වල නිරත වීමේ පදනම මත, මේ අනුව මූලික ගිණුම්කරණ සංකල්පවලින් බැහැර වෙමින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2013 ජූනි 28 දින ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/ LKAS) අනුකූල වන පරිදි ඒකාබද්ධ කිරීම අනුමත කරන ලදී.

2.1.2 අනුකූලතා ප්‍රකාශය

සමාගම් පනතේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වල -SLFRS/ LKAS" හි විධිවිධාන අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

2021 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය තත්ත්වය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, ("මූල්‍ය ප්‍රකාශ") සංසන්දනාත්මක තොරතුරු ද සමඟින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූල වන අතර, සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වේ.

මෙම ප්‍රමිති www.casrilanka.com හි ලැයිස්තුගත කර ඇත.

2.1.3 සංසන්දනාත්මක තොරතුරු
වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත්, ඉදිරිපත් කරන ලද සියලුම වසර සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිත කොට ඇත.

2.1.4 මිනුම් පදනම
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

ආයෝජන දේපළ - සාධාරණ වටිනාකම
ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් ලෙස වර්ගීකරණය කරන ලද කෙටි කාලීන ආයෝජන - සාධාරණ වටිනාකම

ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වගකීම් - නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වල වර්තමාන වටිනාකම සහ හඳුනා නොගත් ආයුගණක ලාභ එකතු කොට, එය හඳුනා නොගත් අතීත සේවා පිරිවැය සහ හඳුනා නොගත් ආයුගණක අලාභයෙන් අඩු කොට වගකීම් හඳුනාගෙන ඇත.

2.1.5 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්
සමාගමේ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ, සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් භාවිත කරමිනි (ක්‍රියාකාරී මුදල්). මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ඉදිරිපත් කිරීම් සහ ක්‍රියාකාරී මුදල් වල වෙනසක් සිදු නොවීය.

2.1.6 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇති සමාගමේ වත්කම් සහ වගකීම් ස්වභාවය අනුව කාණ්ඩගත කර ඇති අතර, ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය සහ කල්පිරීමේ රටාව පිළිබිඹු කරන අනුපිළිවෙලකට ලැයිස්තුගත කර ඇත. මූල්‍ය ප්‍රකාශ වලට බලපාන උද්ධමන සාධක සඳහා ගැළපීම් සිදු කර නොමැත. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ මුදල වාර්තා කරනු ලබන්නේ පිළිගත් මුදල් පියවීමට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් පියවීමට අදහස් කරන විට, ගිණුම්කරණ ප්‍රමිතියකින් හෝ අර්ථ නිරූපණයකින් අවසර දී ඇති විට සහ, සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂයෙන් අනාවරණය කර ඇති විට පමණි.

2.1.7 ප්‍රමාණවත් බව සහ සමාහරණය
සමාන අයිතම වල සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය- 1 හි 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම' මඟින් අවසර දී ඇති පරිදි, අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයේ අයිතමයන් ප්‍රමාණාත්මක නොවන ඒවා වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

2.1.8 විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය
සමාගමේ මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සහ වාර්තා කර ඇති වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වල ප්‍රමාණයට බලපාන විනිශ්චයන් වලට එළඹීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූල වීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන අවශ්‍ය විටෙක හඳුනා ගැනේ.

2.1.9 අඛණ්ඩ පැවැත්ම
කළමනාකාරීත්වය විසින් සමාගමට අඛණ්ඩ පැවැත්ම සඳහා ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර, අපේක්ෂා කළ හැකි අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. තවද, සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳ කළමනාකරණය දැන නොසිටී. එබැවින්, මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩව පැවැත්ම පදනම මත සකස් කරනු ලැබේ.

2.1.10 මූල්‍ය උපකරණ
මූල්‍ය උපකරණයක් යනු, එක් ආයතනයක මූල්‍ය වත්කමක් සහ වෙනත් ආයතනයක මූල්‍ය වගකීම් හෝ හිමිකම් උපකරණයක් ඇති කරන ඕනෑම ගිවිසුමකි.

2.1.11 විලම්බිත බදු වත්කම්
බදු අලාභ සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇති අතර, එම බදු අලාභ භාවිත කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමට ඉඩ ඇත.

අනාගත බදු-සැලසුම් උපාය මාර්ග සමඟ, අනාගත බදු අය කළ හැකි ලාභයේ විභව කාලය සහ මට්ටම මත පදනම්ව, හඳුනාගත හැකි විලම්බිත බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා උපකල්පන සකසනු ලැබේ.

2.1.12 ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් සහ හෙළිදරව් කිරීම් නව සහ සංශෝධිත ප්‍රමිති සහ අර්ථකථන
ගිණුම්කරණ ප්‍රමිතීන් සඳහා වන සංශෝධන කිහිපයක් 2021 ජනවාරි 1 න් පසු ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත් මෙම සංශෝධන හරහා සමාගමේ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නැත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(සියලුම සටහන්වල අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇති අතර, එසේ නොමැති අවස්ථාවක එය සඳහන් කර ඇත.)

SLFRS 9 සහ ***LKAS 39*** ***වෙන සංශෝධන - පොලී අනුපාත මිනුම් ප්‍රමිති ප්‍රතිසංස්කරණය (අදියර 1 සහ 2)***

SLFRS 9 සහ LKAS 39 සඳහා වන සංශෝධන සහන රැසක් සපයන අතර, පොලී අනුපාත මිනුම් ප්‍රමිති ප්‍රතිසංස්කරණ මඟින් සෘජුව බලපාන සියලුම සුරැකුම් සම්බන්ධතා සඳහා අදාළ වේ. ප්‍රතිසංස්කරණය මඟින් ආරක්ෂිත අයිතමයේ හෝ සුරැකුම් උපකරණයේ මිනුම් ප්‍රමිතිය මත පදනම් වූ මුදල් ප්‍රවාහයේ කාලය සහ/හෝ ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිතතාවයක් ඇති කරන්නේ නම්, සුරැකුම් සබඳතාවයකට බලපෑම් ඇති වේ.

SLFRS 16 ***කොවිඩ්-19 ආශ්‍රිත කුලී සහන සඳහා සංශෝධන***

කොවිඩ්-19 වසංගතයේ සෘජු ප්‍රතිවිපාකයක් ලෙස පැන නගින කුලී සහන සඳහා කල්බදු වෙනස් කිරීම් ගිණුම්කරණය පිළිබඳ SLFRS 16 මාර්ගෝපදේශය යොදා ගැනීමෙන් බදුකරුවන්ට සංශෝධන සහන සලසා දෙයි. ප්‍රායෝගික අවශ්‍යතාවයක් ලෙස, බදු දෙන්නෙකුගෙන් කොවිඩ්-19 ආශ්‍රිත කුලී සහනයක් කල්බදු වෙනස් කිරීමක් දැයි තක්සේරු නොකිරීමට බදුකරු තෝරා ගත හැක. SLFRS 16 යටතේ වෙනස් කිරීම සඳහා ගණන් ගනු ලබන ආකාරයටම, එම වෙනස කල්බදු වෙනස් කිරීමක් නොවේ නම්, කොවිඩ්-19 ආශ්‍රිත කුලී සහනයෙන් ප්‍රතිඵලයක් ලෙස බදු ගෙවීමේ යම් වෙනසක් සඳහා මෙම තේරීම සිදු කරන බදුකරු වගකියනු ලැබේ.

LKAS 16 ***හි සංශෝධන - දේපල, පිරියත සහ උපකරණ: අපේක්ෂිත භාවිතයට පෙර ආදායම***

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය LKAS 16- දේපල, පිරියත සහ උපකරණ - අපේක්ෂිත භාවිතයට පෙර ආදායමට සංශෝධන ගෙන ඇති අතර, එම වත්කම එම ස්ථානයට ගෙන ඒමේ දී නිෂ්පාදනය කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ඕනෑම දේපලක, පිරියතක සහ උපකරණයක පිරිවැයෙන් ආයතන අඩු කිරීම සහ කළමනාකාරිත්වය විසින් අදහස් කරන ආකාරයට ක්‍රියාත්මක වීමට අවශ්‍ය කොන්දේසිය තහනම් කරයි. ඒ වෙනුවට, ආයතනයක් එවැනි භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම සහ එම භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පිරිවැය සලකා ලාභ හෝ අලාභ හඳුනා ගනී.

LKAS 37 ***වෙන සංශෝධන - හාරදූර ගිවිසුම් - කොන්ත්‍රාත්තුවක් ඉටු කිරීමේ පිරිවැය***

කොන්ත්‍රාත්තුවක් හාරදූර ද පාඩු ලබනවා ද යන්න තක්සේරු කිරීමේ දී ආයතනයක් ඇතුළත් කළ යුතු පිරිවැය සඳහන් කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් LKAS 37 වෙත සංශෝධන සම්මත කරන ලදී. සංශෝධන සඳහා "සෘජුවම සම්බන්ධ පිරිවැය ප්‍රවේශයක්" අදාළ වේ. භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වන කොන්ත්‍රාත්තුවට සෘජුවම සම්බන්ධ වන පිරිවැයට වර්ධක පිරිවැය සහ කොන්ත්‍රාත් ක්‍රියාකාරකම්වලට සෘජුවම සම්බන්ධ පිරිවැය වෙන් කිරීම යන දෙකම ඇතුළත් වේ. සාමාන්‍ය සහ පරිපාලන වියදම් කොන්ත්‍රාත්තුවක් සමඟ සෘජුව සම්බන්ධ නොවන අතර කොන්ත්‍රාත්තුව යටතේ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයට පැහැදිලිව අය කළ නොහැකි නම් හැර ඒවා බැහැර කරනු ලැබේ.

2.1.13 ව්‍යාපාර සහ මෙහෙයුම් මත කොවිඩ්-19යෙහි බලපෑම

දැනට පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාර සහ සංචරණ සීමා කිරීම් 2020 මාර්තු මස මැද සිට සමාගමේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑවේය. 2019 මූල්‍ය වර්ෂය හා සසඳන විට, මෙම මූල්‍ය කාලසීමාව තුළ මුළු ගුවන් යානා සංචලනයන් සහ මගී ප්‍රවාහනය 66% කින් සහ 76% කින් අඩු වී ඇත. මෙම කාලය තුළ ප්‍රධාන විදේශ මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ක්ෂය වීම හේතුවෙන් විදේශ මුදල් දේශීය මුදලට පරිවර්තනය කිරීමේ දී සමාගමට සැලකිය යුතු විනිමය පාඩුවක් සිදුවිය.

කෙසේ වෙතත්, 2021 වර්ෂය තුළ මෙම තත්ත්වය කළමනාකරණය කර ගැනීමට සමාගමට හැකි විය. 2021 දී මෙහෙයුම් අලාභය රු. මිලියන 4,610.8 සිට රු. මිලියන 3,503.8 දක්වා ක්‍රමයෙන් අඩු විය. 2020 වසරට සාපේක්ෂව ගුවන් යානා සංචලනයන් සහ මගී ප්‍රවාහනය යන දෙකම 2% කින් සහ 37% කින් ඉහළ ගොස් ඇත.

මුදල් ප්‍රවාහයට ඇති අහිතකර බලපෑම්, සැපයුම් සුරක්ෂිත කිරීමේ හැකියාව, අපේක්ෂිත ආදායම් මාර්ග, ණය සහ එකතු කිරීමේ කළමනාකරණ පිළිවෙත් සහ අත්‍යවශ්‍ය නොවන ප්‍රාග්ධන වියදම් කල් දැමීමේ හැකියාව සඳහා ශක්තිමත් ආදායම් මූලාශ්‍ර සහ ණය ගැතියන් පිළිබඳ දැඩි පසු විපරම් ක්‍රියාමාර්ග වැඩි කිරීමට ඇති හැකියාව පිළිබඳ කළමනාකාරිත්වය සතුව විශ්වාසයක් පවතී. සංචලන සීමා ලිහිල් කිරීම සහ ව්‍යාපාරික කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් කිරීමත් සමඟ, සමාගම 2022 වසර ආරම්භයේ සිට එහි ක්‍රියාකාරකම් සාමාන්‍ය පරිදි සිදු කිරීමට අපේක්ෂා කරයි. අවදානම් සහ ප්‍රතිඵලවල සම්භාවිතාව පිළිබඳව නිසි ලෙස සලකා බැලීමෙන් පසු, ව්‍යාපාරය දිගටම කරගෙන යාමට සහ අවදානම් අවම කිරීමට ප්‍රමාණවත් දුවශීලතාවයක් සහ ව්‍යාපාර සැලසුම් සමාගම සතු වීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ.

2.2 විදේශ මුදල් පරිවර්තනය

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් අයිතම මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ('ක්‍රියාකාරී මුදල්') භාවිත කරමිනි. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ය.

(ආ) ගනුදෙනු සහ ශේෂයන්

විදේශ මුදල් ගනුදෙනු ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරනු ලබන්නේ ගනුදෙනු කරන දිනයන්හි විනිමය අනුපාත භාවිත කරමිනි. එවැනි ගනුදෙනු පියවීම නිසා සහ වසර අවසාන විදේශ මුදල්වලින් නම් කරන ලද මුදල් වත්කම් සහ වගකීම් පරිවර්තනයෙන් ලැබෙන විදේශ විනිමය ලාභ සහ අලාභ නිසා විදේශ විනිමය මූල්‍ය අලාභ ඇතිවන අතර ඒවා සාමාන්‍යයෙන් විස්තීර්ණ ආදායමක් ලෙස හඳුනා ගැනේ. ඒවා සුදුසුකම් ලබන මුදල් ප්‍රවාහ සුරැකුම් සහ සුදුසුකම් ලබන ශුද්ධ ආයෝජන සුරැකුම්වලට සම්බන්ධ නම් හිමිකම් වශයෙන් කල් දමනු ලබන අතර නැතහොත් විදේශීය මෙහෙයුමක ශුද්ධ ආයෝජනයෙන් කොටසකට ආරෝපණය කළ හැකිය.

ණය ගැනීම්වලට අදාළ විදේශ විනිමය ලාභ සහ අලාභ සහ මුදල් හා මුදල් සමාන දෑ 'මූල්‍ය ආදායම හෝ පිරිවැය' තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කෙරේ. අනෙකුත් සියලුම විදේශ විනිමය ලාභ සහ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ 'වෙනත් (අලාභ)/ලාභ - ශුද්ධ' තුළ ඉදිරිපත් කෙරේ.

විදේශ මුදලකින් සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මුදල් නොවන අයිතම සාධාරණ වටිනාකම තීරණය කළ දිනයේ විනිමය අනුපාත භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ. සාධාරණ වටිනාකමින් පවත්වාගෙන යන වත්කම් සහ වගකීම් පිළිබඳ පරිවර්තන වෙනස්කම් සාධාරණ වටිනාකම් ලාභයේ හෝ අලාභයේ කොටසක් ලෙස වාර්තා වේ. උදාහරණයක් ලෙස, විස්තීර්ණ ආදායම හරහා සාධාරණ වටිනාකමක් ඇති හිමිකම් වැනි මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් පිළිබඳ පරිවර්තන වෙනස්කම්, සාධාරණ වටිනාකම් ලාභයේ හෝ අලාභයේ කොටසක් ලෙස විස්තීර්ණ ආදායමේ හඳුනා ගැනෙන අතර වෙනත් විස්තීර්ණ ආදායමක් හරහා සාධාරණ වටිනාකමක් ලෙස වර්ගීකරණය කරන ලද හිමිකම් වැනි මූල්‍ය නොවන වත්කම්වල පරිවර්තන වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනා ගැනේ.

2.3 ප්‍රවර්තන සහ විලම්බිත ආදායම් බදු

කාල සීමාව සඳහා බදු වියදම ප්‍රවර්තන සහ විලම්බිත බදුවලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායමක හෝ සෘජුවම හිමිකම්වල හඳුනාගත් අයිතමවලට අදාළ වන ප්‍රමාණයට හැර, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ බද්ද හඳුනාගෙන ඇත. මෙම අවස්ථාවෙහි දී, බද්ද පිළිවෙළින් වෙනත් විස්තීර්ණ ආදායමක හෝ සෘජුවම හිමිකමක හෝ හඳුනාගනු ලැබේ. ප්‍රවර්තන ආදායම් බදු ගාස්තුව ගණනය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දී පනවන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු නීති මත ය.

අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තාවල ගනු ලබන තීරණ කළමනාකරණය විසින් වරින් වර ඇගයීමට ලක් කෙරේ. බදු අධිකාරීන් වෙත ගෙවීමට අපේක්ෂා කරන අගයන් මත සුදුසු අවස්ථාවල දී කළමනාකරණය විසින් ප්‍රතිපාදන ස්ථාපිත කෙරේ.

වත්කම් සහ වගකීම්වල බදු පදනම් සහ මූල්‍ය ප්‍රකාශනවල ඒවායේ වර්තමාන අගය අතර පැන නගින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය භාවිත කරමින් විලම්බිත ආදායම් බද්ද හඳුනා ගැනේ. කෙසේ වෙතත්, විලම්බිත බදු වගකීම්, කිර්තිනාමයේ මූලික හඳුනා ගැනීමේ දී පැන නගින්නේ නම් ඒවා හඳුනා නොගනී; විලම්බිත ආදායම් බද්ද, ගනුදෙනුව සිදුවන අවස්ථාවේ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි ලාභය හෝ අලාභය බලනොපාන ව්‍යාපාරික සංයෝජනයක් හැර වෙනත් ගනුදෙනුවක වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් පැන නගින්නේ නම් එය ගණනය නොකරයි. විලම්බිත ආදායම් බද්ද තීරණය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මඟින් පනවනු ලැබූ හෝ සැලකිය යුතු ලෙස පනවනු ලැබූ බදු අනුපාත (සහ නීති) භාවිතයෙන් වන අතර අදාළ විලම්බිත ආදායම් බදු වත්කම සාක්ෂාත් කර ගත් විට හෝ විලම්බිත ආදායම් බදු වගකීම පියවූ විට යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

විලම්බිත ආදායම් බදු වත්කම් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් භාවිත කළ හැකි, අනාගත බදු අය කළ යුතු ලාභය ලබා ගත හැකි ප්‍රමාණයට පමණි.

ප්‍රවර්තන බදු වගකීම්වලට අදාළව ප්‍රවර්තන බදු වත්කම් පියවා ගැනීමට නීත්‍යනුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් එම බදු අධිකාරිය විසින් අය කරනු ලබන ආදායම් බදුවලට අදාළ වන විට විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් පියවා ගනු ලැබේ.

2.4 භාණ්ඩ තොග

යල්පැන ගිය සහ සෙමින් සංචලනය වන අයිතම සඳහා නියමිත අඩු කිරීම්වලින් පසු භාණ්ඩ තොග පිරිවැයෙන් හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය පෙන්නුම් කරයි.

2003 දෙසැම්බර් 31 දිනට පෙර ගෙන එන ලද ගිනි නිවන උපකරණ සඳහා අමතර කොටස් සහ පරිභෝජන ද්‍රව්‍ය ආගණනයක් මත පදනම්ව තක්සේරු කර පසුව බරිත සාමාන්‍ය පදනම මත තක්සේරු කෙරේ.

ඉන්ධන හැර අනෙකුත් භාණ්ඩ තොග එහි වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමේ දී දරන ලද පිරිවැය ගණනය කරනු ලබන්නේ බරිත සාමාන්‍ය පදනම භාවිත කරමින් වන අතර ඉන්ධන වටිනාකම ප්‍රථම-ලැබීම්, ප්‍රථම-නිකුතු ක්‍රමය (FIFO) මත ගණනය කරනු ලැබේ.

සමාගම වසර 10 කට වැඩි කාලයක් සංචලනය නොවන සියලුම භාණ්ඩ තොග සඳහා ප්‍රතිපාදන සිදු කර ඇත.

2.5 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ

ලැබිය යුතු වෙළඳ මුදල් මුලින් සාධාරණ වටිනාකමින් හඳුනාගෙන පසුව හානිකරණය සඳහා අඩු ප්‍රතිපාදන සහිත ඵලදායී පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂ වියදම් යටතේ මනිනු ලැබේ.

වෙනත් ලැබීම්, බොල්ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයන්ට යටත්ව පිරිවැයට හඳුනාගෙන ඇත.

2.6 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ අර්ථ දැක්වෙන්නේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ලෙස යි. ඒවා ක්ෂණික මුදල් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි අතර වටිනාකම් වෙනස්වීමෙහි සුළු අවදානමකට යටත් වේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(සියලුම සටහන්වල අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇති අතර, එසේ නොමැති අවස්ථාවක එය සඳහන් කර ඇත.)

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල් සහ බැංකු අයිරාවල ශුද්ධ බැංකු තැන්පතුවලින් සමන්විත වේ. කෙටි කල්පිරීමක් සහිත ආයෝජන එනම් අත්පත් කරගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු ආයෝජන ද මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

2.7 දේපල, පිරියත සහ උපකරණ

සියලුම දේපල, පිරියත සහ උපකරණ මුලින් පිරිවැය මත වාර්තා කර ඇති අතර සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද ඓතිහාසික පිරිවැයෙන් ප්‍රකාශ කර ඇත. ඓතිහාසික පිරිවැයට අයිතමයන් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් ද අයිතමය කඩා ඉවත් කිරීම සහ එය පිහිටා ඇති භූමිය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය පිළිබඳ මූලික ඇස්තමේන්තුව ද අයිතමය අත්පත් කර ගැනීම හෝ එම කාල සීමාව තුළ බඩු තොග නිෂ්පාදනය කිරීමට හැර වෙනත් අරමුණු සඳහා යම් කාල සීමාවක් තුළ භාණ්ඩය භාවිත කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස අයිතමය සතු වන වගකීම ද ඇතුළත් වේ.

ස්වයං-නිෂ්පාදිත වත්කම්වල පිරිවැයට ද්‍රව්‍ය වල පිරිවැය, සෘජු ශ්‍රමය සහ නිෂ්පාදන පොදු කාර්ය සඳහා සුදුසු අනුපාතයක් ඇතුළත් වේ.

පසුකාලීන වියදම්, වත්කම් ධාරණ යන අගයට ඇතුළත් කර හෝ සුදුසු පරිදි වෙනම වත්කමක් ලෙස හඳුනාගනු ලබන්නේ, භාණ්ඩය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට සම්භාවිතාව ඇති විට සහ භාණ්ඩයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට පමණි. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ අගය හඳුනා නොගනී. සියලුම අලුත්වැඩියා කිරීම් සහ නඩත්තු වියදම් ඒවා දරන මූල්‍ය කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

දිගු කාලීන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල පිරිවැය, ව්‍යාපෘති අවසන් කර අදාළ වත්කම් භාවිතය සඳහා පවතින තුරු නොනිමි ප්‍රාග්ධන ව්‍යාපෘති ලෙස ඉදිරියට ගෙන යනු ලැබේ.

ක්ෂය වීම ආරම්භ වන්නේ යම් දේපලක්, පිරියතක් සහ උපකරණයක් භාවිතය සඳහා පවතින විට වන අතර, එම කාල සීමාව තුළ අයිතමය අක්‍රිය වුව ද, එය හඳුනා නොගන්නා තෙක් දිගටම පවතිනු ඇත. භාණ්ඩයේ මුළු පිරිවැයට සාපේක්ෂව සැලකිය යුතු පිරිවැයක් සහිත දේපල, පිරියත සහ උපකරණවල සෑම කොටසක්ම වෙන වෙනම ක්ෂය කළ යුතුය. ඉඩම් ක්ෂය නොවේ. අනෙකුත් වත්කම්වල ක්ෂය වීම් ගණනය කරනු ලබන්නේ සරල මාර්ග ක්‍රමය භාවිත කර ඒවයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයට වඩා ඒවායේ ඉතිරි අගයන් වෙත ඒවාහි පිරිවැය වෙන් කිරීම තුළිනි.

වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත:

ගොඩනැගිලි	වසර 50 ට වැඩි
පිරියත සහ උපකරණ	වසර 04 සිට 20 දක්වා
මෝටර් රථ වාහන	වසර 04 සිට 15 දක්වා
ලී භාණ්ඩ, සවිකිරීම් සහ කාර්යාල උපකරණ	වසර 08 ට වැඩි
සන්නිවේදන සහ ගගන නාවික උපකරණ	වසර 05 සිට 10 දක්වා
වෙනත් උපකරණ	වසර 08 ට වැඩි
ගුවන්තොටුපළ යටිතල පහසුකම්	වසර 08 සිට 50 දක්වා

වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට වඩා වැඩි නම්, වත්කමේ ධාරණ අගය වහාම එහි අයකරගත හැකි අගය දක්වා ලියා හැරිය යුතුය.

එක් එක් ප්‍රධාන පරීක්ෂාව සිදු කරන විට, හඳුනා ගැනීමේ නිර්ණායක තෘප්තිමත් වන්නේ නම්, එහි පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස පිරියත සහ උපකරණවල ධාරණ අගයන් හඳුනා ගනේ.

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේ දී හෝ එය භාවිත කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ) වත්කම හඳුනා නොගත් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් වේ.

වත්කම්වල අවශේෂ අගයන්, ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂය වීම් ක්‍රම එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර සුදුසු නම් ගළපනු ලැබේ.

බැහැර කිරීමේ දී ලැබෙන ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ ධාරණ අගය සමඟ ආදායම සංසන්දනය කිරීමෙන් වන අතර මෙය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් / (අලාභ) ශුද්ධ තුළ හඳුනා ගනේ.

දේපල, පිරියත සහ උපකරණවල හානිකරණය

දේපල, පිරියත සහ උපකරණවල ධාරණ වටිනාකම ආපසු ලබා ගත නොහැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ තත්ත්වයන් පෙන්නුම් කරන විට හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම් සහ ධාරණ අගයන් ඇස්තමේන්තුගත අයකරගත හැකි අගය ඉක්මවන විට වත්කම් ඒවායේ අයකරගත හැකි අගයට ලියා ඇත. එම වත්කම සඳහාම පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් ආපසු හරවන්නේ නම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මඟින් හානිකරණ අලාභ හඳුනා ගනේ.

2.8 ප්‍රකාශිත ප්‍රාග්ධනය
සාමාන්‍ය කොටස් හිමිකම් ලෙස වර්ග කෙරේ.

2.9 වෙළඳ ගෙවීම්
වෙළඳ ගෙවීම් යනු සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී අත්පත් කරගත් භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීමට ඇති බැඳීම් වේ.
මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත ගෙවීමට හෝ මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු ඒවා වේ.
ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද අයිතම යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක කාල සීමාවකට ඔබ්බෙන් ගෙවීමට නියමිත ඒවා වේ. ගෙවිය යුතු වෙළඳ මුදල්, ගනුදෙනු මිලට මුලින් හඳුනාගෙන පසුව ඵලදායී පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂ පිරිවැයෙන් මනිනු ලැබේ.

2.10 ණය ගැනීම්
ණය ගැනීම් මුලින් හඳුනාගනු ලබන්නේ සිදු වූ ගනුදෙනු පිරිවැය අඩුකොට සාධාරණ වටිනාකමට ය. ණය ගැනීම් පසුව ක්‍රමක්ෂ වටිනාකමට ප්‍රකාශ කරනු ලැබේ; ඵලදායී පොලී ක්‍රමය භාවිත කරමින් ණය ලබා ගත් කාල සීමාව පුරාවට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ලැබෙන ආදායම (ශුද්ධ ගනුදෙනු පිරිවැය) සහ නිදහස් කිරීමේ අගය අතර යම් වෙනසක් හඳුනා ගැනේ.

ණය පහසුකම් ස්ථාපිත කිරීමේ දී ගෙවනු ලබන ගාස්තු ණයෙහි ගනුදෙනු පිරිවැය ලෙස හඳුනාගෙන ඇති අතර එම පහසුකම්වලින් සමහරක් හෝ සියලු පහසුකම් අඩු කිරීමට ඉඩ ඇත. මෙම අවස්ථාවෙහි දී, මුදල ආපසු ගැනීම සිදු වන තෙක් ගාස්තුව කල් දමනු ලැබේ. සමහරක් හෝ සියලුම පහසුකම් අඩු කිරීමට ඉඩ ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැති තාක් දුරට, ද්‍රවශීලතා සේවාවන් සඳහා පූර්ව ගෙවීමක් ලෙස ගාස්තු යොදා ගැනීම සිදු කර එය අදාළ පහසුකමේ කාලසීමාව තුළ ක්‍රමක්ෂ කරනු ලැබේ.

2.11 ණය ගැනීමේ පිරිවැය
අපේක්ෂිත භාවිතය සඳහා සූදානම් වීමට අවශ්‍යයෙන්ම සැලකිය යුතු කාලයක් ගත වන සුදුසුකම් ලත් වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි සාමාන්‍ය සහ විශේෂිත ණය ගැනීමේ පිරිවැය, වත්කම් ඒවාහි අපේක්ෂිත භාවිතය සඳහා සැලකිය යුතු ලෙස සූදානම් වන කාලය වන තුරු එම වත්කම්වල පිරිවැයට එකතු කරනු ලැබේ.

සුදුසුකම් ලබන වත්කම් සඳහා වන වියදම් සඳහා නියමිත නිශ්චිත ණය ගැනීම්වල තාවකාලික ආයෝජනය මත උපයාගත් ආයෝජන ආදායම ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය ගැනීමේ පිරිවැයෙන් අඩු කරනු ලැබේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය ඒවා දරන කාල සීමාව තුළ ලාභ හෝ අලාභ ලෙස හඳුනාගෙන ඇත.

2.12 ප්‍රතිපාදන
අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට වර්තමාන නෛතික හෝ සාධනීය බැඳීමක් ඇති විට ප්‍රතිපාදන හඳුනාගෙන ඇත. එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලා ඒම සහ අගය විශ්වසනීය ලෙස මැනිය හැකි වීම අවශ්‍ය කෙරේ. මුදල්වල කාල වටිනාකමෙහි බලපෑම ප්‍රමාණාත්මක නම්, ප්‍රතිපාදන තීරණය කරනු ලබන්නේ මුදල්වල කාල වටිනාකමෙහි වර්තමාන වෙළඳපළ තක්සේරු කිරීම් සහ, සුදුසු අවස්ථාවල දී, වගකීමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරන බදු පෙර අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙනි. වට්ටම් භාවිත කරන විට, කාලයාගේ ඇවෑමෙන් ප්‍රතිපාදන වැඩි වීම පොලී වියදමක් ලෙස පිළිගැනේ.

2.13 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්
(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම
නිශ්චිත දායක සැලැස්මක් යනු සමාගම විසින් වෙනම ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවන විශ්‍රාම වැටුප් සැලැස්මකි. වත්මන් සහ පෙර කාල පරිච්ඡේදය තුළ සියලුම සේවකයින්ට සේවයට අදාළ ප්‍රතිලාභ ගෙවීමට ප්‍රමාණවත් වත්කම් අරමුදල සතුව නොමැති නම්, තවදුරටත් දායක මුදල් ගෙවීමට සමාගමට නෛතික හෝ ඵලදායී බැඳීමක් නොමැත. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් නොවන විශ්‍රාම වැටුප් සැලැස්මකි.

සාමාන්‍යයෙන් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මඟින් සේවකයෙකු විශ්‍රාම යාමේ දී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණයක් නිර්වචනය කරන අතර සාමාන්‍යයෙන් මෙය වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් මත රඳා පවතී.

නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම, සැලසුම් වත්කම්වල සාධාරණ වටිනාකමට වඩා අඩු වාර්තාකරණ කාල සීමාව අවසානයේ දී නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමයි. නිශ්චිත ප්‍රතිලාභ වගකීම ස්වාධීන ආයුගණක ආයතන විසින් ආයුගණක තක්සේරුව භාවිතයෙන් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නම් කෙරෙන සහ අදාළ විශ්‍රාම වැටුප් වගකීමෙහි නියමයන්ට ආසන්නව කල් පිරෙන කොන්දේසි ඇති උසස් තත්ත්වයේ ආයතනික බැඳුම්කරවල පොලී අනුපාත භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් පිටතට ගලායාම වට්ටම් කිරීමෙනි. එවැනි බැඳුම්කර ආශ්‍රිතව පුළුල් වෙළෙඳපළක් නොමැති රටවල, රජයේ බැඳුම්කරවල වෙළෙඳපොළ අනුපාත භාවිත කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(සියලුම සටහන්වල අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇති අතර, එසේ නොමැති අවස්ථාවක එය සඳහන් කර ඇත.)

සමාගම විසින් නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීම සඳහා වර්ෂය සඳහා ස්වාධීන ආයුගණක තක්සේරුකරුවෙකුගේ ඇගයීම් සේවාවන් ලබාගෙන ඇත.

පළපුරුද්ද මත කරනු ලබන ගැළපීම් සහ ආයුගණක උපකල්පන වල වෙනස් වීම් නිසා ඇතිවන ආයුගණක ලාභ හා අලාභ, ඒවා පැන නැගෙන කාල පරිච්ඡේදයේ දී වෙනත් විස්තීර්ණ ආදායම හි හිමිකම් වෙත අය හෝ බැර කෙරේ.

(ආ) නිශ්චිත දායක සැලසුම්
ශ්‍රී ලංකාව තුළ සිටින සමාගමේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයින් වන අතර, එම සේවකයින්ගේ මූලික හෝ ඒකාබද්ධ චේතනයෙන් හෝ වැටුපෙන් පිළිවෙලින් 12% ක් හෝ 3% ක් වශයෙන් දායක වේ.

2.14 ප්‍රදාන සහ සහනාධාර

වත්කම් වලට අදාළ මූල්‍ය ප්‍රදාන මූල්‍ය තත්ව ප්‍රකාශයේ පිරිවැයට හඳුනාගෙන ඇති අතර, වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය තුල විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

2.15 මූල්‍ය නොවන වත්කම් වල හානිකරණය

අවිනිශ්චිත ඵලදායී ජීව කාලයක් ඇති වත්කම් - නිදසුනක් වශයෙන්, කීර්තිනාමය හෝ භාවිත කිරීමට සූදානම් තත්ත්වයක නැති අස්පෘශ්‍ය වත්කම් - ක්‍රමක්ෂය කළ නොහැකි අතර, වාර්ෂිකව අපහායනය වී ඇත්දැයි දැන ගැනීම සඳහා පරීක්ෂා කෙරේ. ධාරණ අගය අය කර ගත නොහැකි බව සිද්ධීන් හෝ තත්ත්වයන් වෙනස් වීම් මඟින් පෙන්නුම් කරන සෑම අවස්ථාවකදීම ක්‍රමක්ෂය කිරීමට යටත් වන වත්කම් අපහායනය සඳහා සමාලෝචනය කෙරේ.

වත්කම් වල ආපසු අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවන ධාරණ අගයක් ඇති විට අපහායන අලාභයක් හඳුනා ගැනේ. වත්කමේ ආපසු අය කර ගත හැකි අගය යනු, වත්කමේ සාධාරණ අගයෙන් වත්කම විකිණීමට දරන පිරිවැය අඩු කළ පසු අගය හා වත්කම දැනට භාවිත කරන අයුරෙන් ඉපයිය හැකි ආදායම යන දෙකෙන් වැඩි අගය වේ.

අපහායනය තක්සේරු කිරීමේ අරමුණු සඳහා, වත්කම් විවිධ මට්ටම් වලට කාණ්ඩ කර ඇති අතර, ඒ කාණ්ඩ සඳහා වෙන වෙනම හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් ඇත (මුදල් උත්පාදන ඒකක). එක් එක් වාර්තා කිරීමේ දිනයන්හි දී වත්කම් අපහායනය ආපසු හැරවිය යුතුද යන්න තීරණය කිරීම සඳහා අපහායනය වූ කීර්තිනාමය හැර මූල්‍ය නොවන වත්කම් සමාලෝචනය කෙරේ.

2.16 මූල්‍ය වත්කම්

2.16.1 වර්ගීකරණය

සමාගම සිය මූල්‍ය වත්කම් පහත දැක්වෙන කාණ්ඩ වලට වර්ගීකරණය කරයි: ලාභ හෝ අලාභ ඔස්සේ ක්‍රමක්ෂය සාධාරණ අගයට හඳුනාගන්නා වත්කම් හා වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හඳුනාගන්නා වත්කම් වශයෙනි. මුල් හඳුනාගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගීකරණය මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීමට සමාගම භාවිත කරන ව්‍යාපාර ආකෘතිය මත රඳා පවතී.

(අ) ක්‍රමක්ෂය පිරිවැය
වත්කම් මනිනු ලබන්නේ, මූල්‍ය ප්‍රකාශ වල වත්කම් මුලින්ම හඳුනාගැනීමේ දී ගනු ලැබූ අගයෙන්, මූලික ආපසු ගෙවීම් අඩු කර, එම ආරම්භක මුදල සහ කල්පිරීමේ මුදල අතර ලාභ/අලාභ වල සමුච්චිත අගය එකතු කිරීමට හෝ අඩු කිරීමට අවශ්‍ය ගැළපීම සිදු කිරීමෙන් පසු අගයට ය. සඵලදායී පොලී ක්‍රමය උපයෝගී කරගනිමින් පොලී ආදායම ගණනය කෙරෙන අතර, එය ලාභ හා අලාභ තුළින් හඳුනාගනු ලැබේ. සාධාරණ අගය හි වෙනස්කම් වත්කම් ගිණුම් වලින් ඉවත් කරන විට හෝ නැවත වර්ගීකරණයකට ලක් කළ විට ලාභ හා අලාභ තුළින් හඳුනා ගැනේ.

(ආ) වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය
ණය සහ ලැබීම් - පොලී ආදායම, අපහායන ලාභ සහ අලාභ, සහ විදේශ විනිමය ලාභ සහ අලාභ වලින් කොටසක්, ක්‍රමක්ෂ කළ පිරිවැය වත්කම් සඳහා සමාන පදනමක් මත ලාභ සහ අලාභයන් හි හඳුනා ගැනේ. සාධාරණ අගයේ වෙනස්වීම් මුලින් වෙනත් විස්තීර්ණ ආදායමෙන් හඳුනා ගැනේ. වත්කම් ගිණුම් වලින් ඉවත් කරන විට හෝ නැවත වර්ගීකරණය කරන විට, වෙනත් විස්තීර්ණ ආදායමෙහි කලින් හඳුනා ගෙන තිබූ අතර, සාධාරණ අගයන්හි වත්කම් ලාභ සහ අලාභ හරහා මූල්‍ය වත්කම් වශයෙන් නැවත වර්ගීකරණය කිරීමේ දී, ඒ මත පදනම්ව සෑම විටම සාධාරණ අගයට වත්කම් මනිනු ලබන අතර, වෙනත් විස්තීර්ණ ආදායමෙන් ලාභ සහ අලාභය කෙරෙහි බලපැවැත්වෙන පරිදි එය ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

හිමිකම් උපකරණ වල ආයෝජනය - ලාභාංශ හඳුනාගනු ලබන්නේ ගෙවීම් ලැබීමට ආයතනයට ඇති අයිතිය තහවුරු වූ විට ය. එවිට ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට ඉඩ ඇති අතර, එම මුදල විශ්වාසදායක ලෙස මැනිය හැකිය. ලාභාංශ, ලාභ සහ අලාභ ඔස්සේ හඳුනාගනු ලබන්නේ ආයෝජනයේ පිරිවැයෙන් කොටසක් නැවත අයකර ගැනීම පැහැදිලිව නියෝජනය නොකරන්නේ නම් පමණි. එසේ නොමැතිනම් ඒවා වෙනත් විස්තීර්ණ ආදායමෙහි ඇතුළත් කළ යුතු ය. සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාශය හි හඳුනාගෙන ඇති අතර, වත්කම විකිණීම හෝ අපහායනය වීම සිදු වුව ද කිසිදු අවස්ථාවක ලාභ හා අලාභ ලෙස නැවත වර්ගීකරණය නොකෙරේ.

(ඇ) ලාභ සහ අලාභ තුළින් සාධාරණ අගය
ක්‍රමක්ෂය කරන ලද පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය සඳහා වන නිර්ණායකයන් සපුරාලන්නේ නැති වත්කම් ලාභ සහ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනිනු ලැබේ.

2.16.2. හඳුනා ගැනීම හා මිනුම් කිරීම

මූල්‍ය වත්කම් නිතිපතා මිලදී ගැනීම් සහ විකිණීම ලාභ සහ අලාභ ගිණුම හරහා සමාගම වත්කම් මිලදී ගැනීමට හෝ විකිණීමට එකඟ වූ දිනයේ දී හඳුනා ගැනේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනානොගන්නා මූල්‍ය වත්කම් මුලින් සාධාරණ අගයට ගනුදෙනු පිරිවැය එකතු කර මුලින් හඳුනා ගනු ලැබේ. සාධරණ අගයක් දරන මූල්‍ය වත්කම සාධාරණ වටිනාකමට ලාභ අලාභ හි හඳුනා ගන්නා අතර, ආයෝජන වලින් මුදල් ගලා ඒමේ අයිතිය

කල් ඉකුත් වූ විට හෝ මාරු කළ විට සහ සමාගමේ සියළුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු වශයෙන් මාරු කළ විට මූල්‍ය වත්කම් ගිණුම්වලින් ඉවත් කෙරේ.

'ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට හඳුනාගන්නා මූල්‍ය වත්කම්' කාණ්ඩයේ සාධාරණ අගයේ වෙනස් වීම් හේතුවෙන් ඇති වන ශුද්ධ ලාභ හෝ අලාභ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන කාල සීමාව තුළ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කෙරේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනාගන්නා මූල්‍ය වත්කම් වලින් ලැබෙන ලාභාංශ ආදායම සමාගමට ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට වෙනත් ආදායම් යටතේ කොටසක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගනු ලැබේ.

විකිණීම සඳහා යොදා ගත හැකි යැයි වර්ගීකරණය කර ඇති මූල්‍ය හා මූල්‍ය නොවන සුරැකුම්පත් වල සාධාරණ අගයෙහි වෙනස්වීම් වෙනත් විස්තීර්ණ අදායමක් ලෙස හඳුනා ගැනේ.

2.17 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගත් ප්‍රමාණය හිලව් කිරීමට නීතියෙන් බලපෑම් කිරීමට අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම සාක්ෂාත් කර ගැනීමට සහ එකවර වගකීම් පියවීමට අදහස් කරන මූල්‍ය වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් වන අතර, ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා කරයි. නෛතිකව බලාත්මක කිරීමේ අයිතිය අනාගත සිදුවීම් මත අසම්භාව්‍යයක් නොවිය යුතු අතර, සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී මෙන්ම සමාගමේ හෝ අදාළ පාර්ශ්වයන්ගේ පැහැර හැරීම, බුන්වත් වීම හෝ සමාගම හෝ සමාන තැනැත්තාගේ බංකොලොත් වීම යන සිදුවීම් වල දී බලාත්මක විය යුතු ය.

2.18 මූල්‍ය වත්කම් හානිකරණ

සමාගම විසින් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩ හානිකරණය වීම පිළිබඳ විෂයාත්මක සාක්ෂි ඇත්ද යන්න සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදී තක්සේරු කරයි. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩ වල අගය අඩුවීමක් හෝ අගය අඩුවීම අනුව අලාභයක් මූලිකව හඳුනා ගත් වත්කම් (පාඩුවක් සිදුවන අවස්ථාවක්) සහ අලාභ සිදුවීමක් (හෝ සිදුවීම්) වැනි සිදුවීම් ගණනාවක ප්‍රතිඵලයක් ලෙස ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ මත බලපාන්නේ නම්, එය විශ්වාසදායී ලෙස තක්සේරු කළ හැකිය.

අපහායනය වීමේ සාක්ෂි වලට ණය ගැතියන් හෝ ණයගැති කාණ්ඩ වල සැලකිය යුතු මූල්‍ය අපහසුතා, පොලී හෝ මුල් මුදල ගෙවීම පැහැර හැරීම හෝ නොගෙවා සිටීම, බුන්වත් වීමේ සම්භාවිතාව හෝ වෙනත් මූල්‍ය අපහසුතා ඇතුළත් වන අතර, නිරීක්ෂණය කළ දත්ත මඟින් හිඟ මුදල් වල වෙනස්වීම් හෝ ප්‍රමාද වීම් සමඟ සම්බන්ධිත ආර්ථික කොන්දේසි වැනි අනාගත මුදල් ප්‍රවාහ වල සැලකිය යුතු අඩුවීමක් ආදිය පෙන්නුම් කිරීම ඇතුළත් වේ.

සියලු ණය සුරැකුම්, ණය සහ වෙළඳ ලැබිය යුතු දෑ වල අපේක්ෂිත ණය අලාභ මාස 12 ක හෝ ජීව කාල පදනමෙන් වාර්තා කළ යුතු යැයි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 9 මඟින් නිර්දේශ කරයි. වෙළඳ ලැබිය යුතු දෑ සඳහා අලාභ දීමනාව නිතරම මනිනු ලබන්නේ, අපේක්ෂිත ණය පාඩු හි ජීවකාලයට සමාන ප්‍රමාණයකට ය. මූලික හඳුනා ගැනීමේ සිට සහ අපේක්ෂිත ණය පාඩු තක්සේරු කරන විට මූල්‍ය වත්කමක ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී ඇද්ද යන්න තීරණය කිරීමේ දී සමාගම අධික පිරිවැයක් හෝ උත්සහයක් නොමැතිව ලබාගත හැකි අදාළ සාධාරණ සහ සහය දක්වන තොරතුරු සලකා බලයි. සමාග මේ ඓතිහාසික අත්දැකීම් සහ අනාගත තොරතුරු ද ඇතුළුව දැනුවත් වූ ණය තක්සේරු කිරීම් මත පදනම් වූ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු මෙහි ඇතුළත් වේ. දින 365 කට වැඩි ණය සඳහා මූල්‍ය වත්කමක ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩිවේ යැයි සමාගම උපකල්පනය කරයි.

2.19 මූල්‍ය වගකීම්

සමාගමේ මූල්‍ය වගකීම් යටතට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ, බැංකු ණය සහ අනෙකුත් ණය ගැනීම් සහ අහිතකර මූල්‍ය ඉදිරි ගිවිසුම් ආදිය ඇතුළත් වේ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයකට දක්වන මූල්‍ය වගකීම් හැර අනෙකුත් සියලු මූල්‍ය වගකීම් ආරම්භයේ දී ඒවායේ සාධාරණ වටිනාකමින් හඳුනාගන්නා අතර, පසුව වට්ටම් කිරීමේ ප්‍රතිඵලය නොවැදගත් නම් සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. ඒ අනුව ඒවා පිරිවැයට සඳහන් කරනු ලබයි.

2.20 ආදායම් හඳුනාගැනීම

ආදායම හඳුනාගැනීම සිදු කරනුයේ සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදු වේ යැයි අපේක්ෂා කළ හැකි ආදායම් හා ඒ ආශ්‍රිතව ඇතිවන හෝ ඇතිවිය හැකි වියදම් විශ්වාසයෙන් යුතුව මැනිය හැකි ප්‍රමාණයට පමණි. ආදායම ලැබූ ප්‍රතිඵලවේ සාධාරණ අගය හෝ වෙළඳ වට්ටම් හෝ විකිණුම් බදු වල ලැබිය යුතු ශුද්ධ අගය මත මනිනු ලැබේ. ආදායම හඳුනාගැනීමේ අරමුණ සඳහා පහත සඳහන් විශේෂිත නිර්ණායකයන් භාවිත කරයි.

(අ) සේවා සැපයීමේදී

සේවා සැපයීමෙන් ලැබුණු ආදායම, එම සේවාව සැපයූ හෝ ක්‍රියාත්මක කළ ගිණුම් කාලපරිච්ඡේදය තුළ දී හඳුනා ගනියි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(සියලුම සටහන්වල අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇති අතර, එසේ නොමැති අවස්ථාවක එය සඳහන් කර ඇත.)

(ආ) පොලිය
අය කර ගැනීමේ අවිනිශ්චිතතාවයක් නොමැති නම් පොලිය උපචිත පදනමින් හඳුනා ගනියි.

(ඇ) බදු කුලී ආදායම
කුලී ආදායම කුලී ගිවිසුම හි විස්තර කොට ඇති පරිදි උපචිත පදනම මත හඳුනා ගනියි.

(ඈ) වරලත් ගාස්තු සහ අනුග්‍රාහක ගාස්තු
අදාළ ගිවිසුමේ හරයට අනුකූලව වරලත් ගාස්තු සහ අනුග්‍රාහක ගාස්තු උපචිත පදනම මත හඳුනා ගනියි.

ඉ) ජාත්‍යන්තර / දේශීය ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම්
ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම, අවම ගාස්තු සහ ගුවන් තොටුපළ අංගනය හි නැවතුම් කාලයට යටත්ව උපරිම ඉහළ නැංවීමේ බර මත පදනම් වන අතර උපචිත පදනම මත හඳුනා ගනියි.

(ඊ) හරහා පියාසර ආදායම
හරහා පියාසර ආදායම උපරිම ඉහළ නැංවීමේ බර හා පදනම්ව ගණනය කරන අතර උපචිත පදනම මත හඳුනා ගනියි.

(උ) ගුවන් පාලම් ආදායම
ගුවන් පාලම් ආදායම ගුවන් පාලම පාවිච්චි කරන කාලය සහ ගුවන් යානා වර්ගය මත පදනම්ව ගණනය කරයි. ආදායම උපචිත පදනම මත හඳුනා ගනියි.

(ඌ) අපගමන බදු
අපගමන බදු, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මූල්‍ය පනතට අනුව එකතු කරනු ලබන අතර, ඇමරිකානු ඩොලර් 9.75 ක් ලෙස ගු.ගු.සේ. සමාගමට ප්‍රේෂණය කරයි. ආදායම මුදල් පදනම මත හඳුනා ගනියි.

(එ) ඇතුළුවීමේ අවසරපත් ගාස්තු, (වාහන) නැවතුම් ගාස්තු, දැනුම් දීම් පුවරුව
ආදායම හඳුනා ගැනීම සහ එකතු කිරීම මුදල් පදනම මත සිදුවේ.

(ඒ) වෙනත්
විවේකාගාර ආදායම්, ගෙවීමේ ක්‍රමය අනුව මුදල් සහ උපචිත පදනම මත හඳුනා ගනියි.
දැවීමේ උපකරණ ආදායම් උපචිත පදනම මත හඳුනා ගනියි.
අනෙකුත් ආදායම් මූලාශ්‍ර, ගෙවීමේ ක්‍රමය අනුව මුදල් සහ උපචිත පදනමෙන් හඳුනා ගනියි.

3. මූල්‍ය අවදානම් කළමනාකරණය

3.1 මූල්‍ය අවදානම් සාධක

සමාගමේ ක්‍රියාකාරකම් විවිධ මූල්‍ය අවදානම් වලට විවෘතව පවතී. එනම් වෙළඳපොළ අවදානම (විදේශ මුදල් අවදානම්, මුදල් ප්‍රවාහ සහ සාධාරණ අගයේ පොලී අනුපාත අවදානම ඇතුළුව), ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම වේ.

(අ) වෙළඳපළ අවදානම
(එ) විදේශ විනිමය අවදානම
සමාගම විනිමය අනුපාතයන් හි උච්ඡාවචනයන්ට සංවේදී වන අතර, ප්‍රධාන වශයෙන් ඇමරිකානු ඩොලර්, යුරෝ සහ ජපන් යෙන් වලට අනුව, ශ්‍රී ලංකා රුපියලේ උච්ඡාවචනයන්ට ලක් වේ. සමාගමේ ක්‍රියාකාරී මුදල් වන්නේ ශ්‍රී ලංකා රුපියල් වන අතර, බොහෝ ගනුදෙනු සිදුකරනු ලබන්නේ රුපියල් වලිනි. අනෙකුත් මුදල් බොහොමයක් විදේශ ණය ගෙවීමේ අරමුණු සඳහා විදේශ මුදල් ලෙස සැලකේ. ඇතැම් වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සහ වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ද විදේශ මුදල් මඟින් සිදු කරයි.

සමාගමේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරෙන බැවින්, පරිවර්තන අවදානම සහ ගනුදෙනු අවදානම යන දෙකෙන්ම විදේශ විනිමය උච්චාවචනයන්ගේ බලපෑමට ලක්වෙයි. විදේශ විනිමය අනුපාත වෙනස්කම් සමාගමේ ලාභ හෝ අලාභ කෙරෙහි බලපායි. උදාහරණයක් ලෙස ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අඩු වීම, භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව හරහා විදේශ මුදලින් ලබාගෙන ඇති ණය ගෙවීමට යාමේ දී සමාගමේ ලාභදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකිය.

ඇමරිකානු ඩොලර්, යුරෝ සහ ජපන් යෙන් වලට සාපේක්ෂව අනෙකුත් සියලු විචල්‍යයන් නොවෙනස්ව තිබිය දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකය හි වියහැකි සාධාරණ වෙනස්කම්වලට සමාගමේ සංවේදීතාවය පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කරයි. ඇමරිකානු ඩොලර් සහ ජපන් යෙන් යනු, සමාගමේ ඉදිරිපත් කරන සහ ලිඛිත මුදල් ව්‍යවහාරය වන ශ්‍රී ලංකා රුපියල් වලින් පසු සමාගමේ මූල්‍ය උපකරණ සඳහා යොදා ගනු ලබන ප්‍රධාන මුදල් වර්ග වේ. ඇමරිකානු ඩොලර්, යුරෝ සහ ජපන් යෙන් හි විනිමය අනුපාතයන්ගේ වෙනස්වීම් වල බලපෑම වගුවෙන් දක්වා ඇත.

ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව, ඇමරිකානු ඩොලරය හි විනිමය අනුපාතිකයේ වෙනස්වීම

	2021 ලාභයේ වැඩි වීම/(අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්)	2020 ලාභයේ වැඩි වීම/(අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්)
ඇමරිකානු ඩොලර් හි 10% ක අගය වැඩි වීම / ක්ෂය වීම (2020-10%)	**(212,157,236)**	(90,301,302)
ඇමරිකානු ඩොලර් හි 15% ක අගය වැඩි වීම / ක්ෂය වීම (2020-15%)	**(318,235,854)**	(135,451,953)
ඇමරිකානු ඩොලර් හි 20% ක අගය වැඩි වීම / ක්ෂය වීම (2020-20%)	**(424,314,471)**	(180,602,604)

ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව, යුරෝ හි විනිමය අනුපාතිකයේ වෙනස්වීම

	2021 ලාභයේ වැඩි වීම/(අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්)	2020 ලාභයේ වැඩි වීම/(අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්)
යුරෝහි 10% ක අගය වැඩි වීම / ක්ෂය වීම (2020-10%)	**(34,882)**	(1,212,899)
යුරෝහි 15% ක අගය වැඩි වීම / ක්ෂය වීම (2020-15%)	**(52,323)**	(1,819,349)
යුරෝහි 20% ක අගය වැඩි වීම / ක්ෂය වීම (2020-20%)	**(69,764)**	(2,425,798)

ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ජපන් යෙන් හි විනිමය අනුපාතිකයේ වෙනස්වීම

	2021 ලාභයේ වැඩි වීම/(අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්)	2020 ලාභයේ වැඩි වීම/(අඩු වීම) (ශ්‍රී ලංකා රුපියල්)
යෙන්හි 10% ක අගය වැඩි වීම / ක්ෂය වීම (2020-10%)	**(1,928,424)**	(135,300,569)
යෙන්හි 15% ක අගය වැඩි වීම / ක්ෂය වීම (2020-15%)	**(2,892,637)**	(202,950,854)
යෙන්හි 20% ක අගය වැඩි වීම / ක්ෂය වීම (2020-20%)	**(3,856,849)**	(270,601,138)

(ii) මුදල් ප්‍රවාහය සහ සාධාරණ වටිනාකමේ පොලී අනුපාත අවදානම
සමාගමේ පොලී අනුපාත අවදානම ඇමරිකානු ඩොලර්, යුරෝ සහ ජපන් යෙන් මඟින් ගනු ලැබූ දීර්ඝකාලීන ණය ගැනීම් වලින් පැන නගියි. මේවා ස්ථාවර අනුපාතයකට නිකුත් කරනු ලබන අතර, එමඟින් ණය ගැනීම මත මුදල් ප්‍රවාහ පොලී අනුපාත අවදානම ලිහිල් කරයි. මෙය තවදුරටත් විචල්‍ය අනුපාත වලට මුදල් දැරීම මඟිනුත් ලිහිල් වෙයි. ස්ථාවර අනුපාතයන්ට නිකුත් කළ ණය ගැනීම සමාගම සාධාරණ වටිනාකම් පොලී අනුපාත අවදානමකට නිරාවරණය කරයි.

සමාගම මෙම පොලී අනුපාතයන්ගේ වලනය පසුගිය වසර පුරාම සලකා බැලූ අතර, පොලී අනුපාතයන්ගේ මෙම වලනය හිමිකම් මත ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරන බවට නිගමනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(සියලුම සටහන්වල අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් සඳහන් කර ඇති අතර, එසේ නොමැති අවස්ථාවක එය සඳහන් කර ඇත.)

(ආ) ණය අවදානම
ණය අවදානම පැන නගින්නේ බාහිර පාර්ශ්වයන්ගෙන් වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මඟිනි.

(ඇ) ද්‍රවශීලතා අවදානම
මුදල් ප්‍රවාහ පුරෝකථනය මූල්‍ය අංශය විසින් ක්‍රියාත්මක කරයි. මෙහෙයුම් අවශ්‍යතා වලට සෑහෙන මුදල් ඇති බවට සහතික කිරීමට සමාගමේ ද්‍රවශීල අවශ්‍යතා පුරෝකථනය කිරීම මූල්‍ය අංශය මඟින් අධීක්ෂණය කරයි. එවැනි පුරෝකථන සමාගමේ ණය මූල්‍ය යෙදවීමේ සැලසුම්, අනුකූලතා සම්මුතීන්, අභ්‍යන්තර මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනුපාත ඉලක්ක සමඟ අනුකූල වේ නම් සහ අදාළ වන්නේ නම් බාහිර රෙගුලාසි සහ නෛතික අවශ්‍යතා - උදාහරණයක් ලෙස මුදල් සීමාවන් සැලකිල්ලට ගනියි.

කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පවත්වා ගන්නා ප්‍රමාණයට වඩා ඇති සමාගම සතු අතිරික්ත මුදල් ද්‍රවශීලතා අවදානම ලිහිල් කර ගැනීමට රජයේ සුරැකුම් වල ආයෝජනය කරයි.

3.2 ප්‍රාග්ධන අවදානම් කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ දී සමාගමේ අරමුණු වන්නේ, කොටස්හිමියන් වෙත ප්‍රතිලාභ ලබා දීම පිණිස සමාගම අඛණ්ඩව පවත්වා ගැනීමේ හැකියාව ආරක්ෂා කිරීම, අනෙකුත් උනන්දු පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ ලබා දීම සහ ප්‍රාග්ධන පිරිවැය අඩු කිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීම වේ. ප්‍රාග්ධන ව්‍යුහය ගැළපීම හෝ පවත්වා ගැනීම පිණිස සමාගම කොටස්හිමියන් වෙත ගෙවනු ලබන ප්‍රතිලාභ ගැළපීම, නව කොටස් නිකුත් කිරීම හෝ ණය අඩු කිරීම සඳහා වත්කම් විකිණීම කරනු ඇත. සමාගම ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට පෙර ලාභාංශ අනුපාතය පවත්වා ගැනීම පිණිස බුන්වත් බව තක්සේරු කරයි. කර්මාන්තයේ අනෙකුත් ආයතන සමඟ සමපාත වීමට සමාගම තෝලන අනුපාත පදනමින් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුළු ණය, මුළු ප්‍රාග්ධනයෙන් බෙදීමෙන් ගණනය කරයි. ණය ලෙස ගණනය කරනුයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන "ජංගම සහ ජංගම නොවන" මුළු ණය ගැනීම වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන පරිදි මුළු ප්‍රාග්ධනය "හිමිකම්" ලෙස ගණනය කරයි.

2021 දෙසැම්බර් 31 සහ 2020 දෙසැම්බර් 31 දිනට තෝලන අනුපාතය පහත පරිදි විය:

	සමාගම	
	2021	**2020**
මුළු ණය ගැනීම් (සටහන 21 සහ සටහන 22)	**68,724,683,990**	51,172,796,305
අඩු කළ: මුදල් සහ මුදල් සමාන දෑ (සටහන 17)	**(413,045,010)**	(826,225,883)
අඩු කළ: කෙටි කාලීන බැංකු තැන්පතු	**(41,515,132,946)**	(41,932,637,264)
ශුද්ධ ණය	**26,796,506,034**	8,413,933,157
මුළු හිමිකම්	**41,314,321,699**	36,982,901,554
මුළු ප්‍රාග්ධනය	**68,110,827,732**	45,396,834,712
තෝලන අනුපාතය	**39%**	19%

ඉහත ණය මුදල සම්පූර්ණයෙන්ම සමන්විත වන්නේ ගුවන් තොටුපළ සංවර්ධනය සඳහා ස්වෛරී ඇපකරය යටතේ මහා භාණ්ඩාගාරය හරහා ලබාගත් ණය, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ කොන්ත්‍රාත්කරුගේ හිඟ ශේෂය පියවීම සඳහා නිකුත් කරන ලද ණයකරය සහ ලංකා බැංකුවෙන් ලබාගත් ණය වලිනි. වට්ටම් කිරීමේ බලපෑම, සැලකිය යුතු නොවන බැවින් ණය ගැනීම් වල සාධාරණ අගය ඒවායේ ධාරණ අගයට සමාන වේ.

3.3 සාධාරණ අගය ඇස්තමේන්තු කිරීම

සාධාරණ අගය මත මනින ලද මූල්‍ය උපකරණ සමාගම සතුව නොතිබුණි.

4. තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

